# වාර්ෂික වාර්තාව – 2020

## රුහුණ විශ්වවිද්‍යාලය



# රුහුණ විශ්වවිද්‍යාලයේ  දැක්ම හා මෙහෙවර

## *අපගේ දැක්ම*

දැයේ ප්‍රමුඛතම බුද්ධිමය කේන්ද්‍රස්ථානය බවට පත්වීම.

## *අපගේ මෙහෙවර*

ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා මගින් සමාජයට සේවය කිරීම පිණිස දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

# උපකුලපතිතුමන්ගේ පණිවුඩය



ගෝලීය කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ අප සැමට 2020 වසර අභියෝගාත්මක වසරක් විය.

කෙසේ වෙතත්, අනපේක්ෂිත තත්ත්වයන්ට කඩිනමින් අනුගත වෙමින් සියලු අවස්ථානුගත කරුණු ප්‍රශස්ත මට්ටමකින් කළමනාකරණය කරගැනීමට අප සමත් වුණි. එය විශ්වවිද්‍යාලය සඳහා අභියෝග, ජයග්‍රහණ, ආවර්ජන මෙන්ම ඉදිරි සැලසුම් සපිරි වසරක් විය.

විශ්වවිද්‍යාලයේ නව අතථ්‍ය කාල පරිච්ඡේදයක දිරිගන්වන සුළු ආරම්භයක් එය සනිටුහන් කරන ලදී. අර්බුදයට සාර්ථකව මුහුණ දීම පිණිස සියලු අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පරිපාලන කර්තව්‍යයන් සාර්ථකව අතථ්‍ය ප්‍රකාර වෙත කඩිනමින් යොමුවන ලදී. වසංගතය හමුවේ ශිෂ්‍යයන්ගේ අධිෂ්ඨානය පවත්වා ගනු වස් සංස්කෘතික ක්‍රියාකාරකම්, නව භාෂා, අභිප්‍රේරණ දේශන, වෘත්තීය මාර්ගෝපදේශන වැනි නව මූලාරම්භයන් ඇරඹුණි. පොදුවේ ගත් කළ, ඇදිරි නීතිය පනවා තිබූ කාල සීමාවේදී හැර මුළුමණින් වසා දැමීමකින් තොරව දැඩිව බලාත්මක කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ අතථ්‍ය සහ පුද්ගලිකව පැමිණීමේ ප්‍රකාර මිශ්‍ර ප්‍රවේශයන්ට හැඩ ගැසෙමින් විශ්වවිද්‍යාලය පූර්ණ ධාරිතාවයට ඉතා ආසන්නව ක්‍රියාත්මක විය. විශ්වවිද්‍යාලයක් ලෙස පසුගිය වසරේ අපගේ විශිෂ්ඨතම ජයග්‍රහණය එය විය. වසංගතයේ අභියෝග සම්ප්‍රදායික ප්‍රවේශයන් පිළිබඳ නැවැත සිතා බැලීමට අපට බල කෙරුණු අතර අනාගතය සඳහා නව දිශානතීන් සහ අවස්ථා අවබෝධ කරගන්නා ලදී.

පසුගිය වසර අපගේ පස් අවුරුදු සංයුක්ත සැලැස්මේ (01.01.2019 – 31.12.2023) දෙවන වසරයි. වසර සඳහා වූ සෑම සැලසුමක්ම එපරිද්දෙන්ම ක්‍රියාවට නැංවීමට නොහැකි වුවත්, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ වුව ද සැලකිය යුතු උපාය මාර්ගික ප්‍රගතියක් අත්කර ගැනීමට අපට හැකි විය. අධ්‍යාපනය වෙත ප්‍රවේශය පුළුල් කරමින්, වත්මන් තත්ත්වයට වඩාත්ම ගැලපෙන්නා වූ දුරස්ථ අධ්‍යාපන මොඩියුලයක් ලෙස ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හඳුන්වාදෙන ලදී. ජාතික විෂයමාලාව අන්තර්ජාතික ප්‍රමිතීන්ට උත්ශ්‍රේණි කිරීමේ අරමුණින් නව පාඨමාලා කිහිපයක් හඳුන්වා දෙන ලදී. ‘‘රොබෝ විද්‍යාව හඳුන්වාදීම’’ නම් නව පාඨමාලා ඒකකයක් විද්‍යා පීඨය හඳුන්වා දුණි. ඉලෙක්ට්‍රොනික පද්ධති සැලසුම, යන්ත්‍ර යාන්ත්‍රික විද්‍යාව, යන්ත්‍ර සැලසුම, ක්‍රමලේඛ්‍ය ඩිජිටල් ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ යෙදුම් ඇතුළුව පාඨමාලා ඒකක පෙළක් තාක්ෂණ පීඨය විසින් හඳුන්වා දෙන ලදී. ධීවර සහ මිරිදිය විද්‍යා සහ තාක්ෂණ පීඨය විසින් IV මට්ටම සඳහා සමුද්‍රීය සහ මිරිදිය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධියේ විෂයමාලාව හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී. ගෝලීය අධ්‍යාපන අවස්ථා උදාකර දීමේ අරමුණින් කෝසෙරා මාර්ගගත ඉගෙනුම් වේදිකාව හඳුන්වා දෙනු ලැබීය.

අධ්‍යාපනයේ ගුණාත්මකබව සුපෝෂණය කිරීම විශ්වවිද්‍යාලයේ ඉහළම ප්‍රමුඛතාවයක් වන අතර අන්තර් ක්‍රියාකාරී යටිතල පහසුකම් ඒ අරභයා තීරණාත්මක අංගයක් වේ. ඒ අනුව නවීන ඉගැන්වීම් පහසුකම් සහිත දේශන ශාලා විද්‍යාගාර විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලදී. උදාහරණයක් ලෙස මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ භාෂා විද්‍යාගාරයක් සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර ස්ථාපනය කරන ලදී. ඉංජිනේරු තාක්ෂණවේද විද්‍යාගාරය, යාන්ත්‍රික යන්ත්‍රෝපකරණ වැඩ පොළ, ඉලෙක්ට්‍රොනික සහ විඛම්බන විද්‍යාගාරය, ද්‍රව්‍ය විද්‍යාගාරය, රොබෝ විද්‍යා සහ ස්වයංක්‍රියකරණ විද්‍යාගාරය සහ මෝටර් රථ විද්‍යාගාරය තාක්ෂණ පීඨයේ පිහිටුවන ලදී. වෛද්‍ය පීඨයේ මහාචාර්ය වාට්ටු සංකීර්ණය 2020 වසරේදී ආරම්භ කරනු ලැබීය. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ දිගුකාලීන අවශ්‍යතාවයක් සපුරාලමින්, පීඨයේ නව ගොඩනැගිලි සංකීර්ණය ගාල්ල, වලහන්දුවේදී ආරම්භ කරන ලදී.

ජාත්‍යන්තර වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම්වල ජාතික මට්ටමින් සිව්වැනි ස්ථානය දිනා ගැනීමට රුහුණ විශ්වවිද්‍යාලයට හැකි විය. හරිත විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලට ද අප සහභාගි වුණි. වාර්ෂික ශාස්ත්‍රීය සැසිවලට අමතරව, ජාත්‍යන්තර සාකච්ඡා මුළු/ සම්මන්ත්‍රණ හයකට සත්කාරකත්වය දැක්වීමට අපට හැකි විය. කොවිඩ්-19 වංසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, තම ජාතික හා ගෝලීය පිළිගැනීම

ශක්තිමත් කිරීමට අදාළව 2020 වසර රුහුණ විශ්වවිද්‍යාලය සඳහා විශේෂ අවස්ථා සනිටුහන් කළ වසරක් විය. පැවැති දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ වුවද චීනය, එක්සත් රාජධානිය, තායිලන්තය සහ රුසියාව සමග රුහුණ විශ්වවිද්‍යාලය සාර්ථකව ගෝලීය හවුල්කාරිත්ව කිහිපයකට එළඹෙන ලදී. මෙම කාල සීමාව තුළ පළමු වරට මොස්කව් විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා රුහුණ විශ්වවිද්‍යාලය සිංහල භාෂා මාර්ගගත පාඨමාලාවක් පවත්වන ලදී.

පොදුවේ ගත් කළ, කොවිඩ්-19 වසංගතය සමග මතු වූ කාලීන අවශ්‍යතා සපුරාලීමට අදාළව 2020 සාර්ථක වසරක් විය. ධනාත්මක සිතුවිලිවලින් යුතුව අප කොවිඩ්-19 වසංගතයට අප මුහුණ දුන් අතර ඒ සම්බන්ධයෙන් සාර්ථකව කටයුතු කළෙමු. වසංගතය සමග ඉස්මතු වූ විවිධ දුෂ්කරතාවන් නොතකා කටයුතු කළ අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් සියලු දෙනාට මගේ ස්තූතිය පළ කරන්නෙමි.

විශ්වවිද්‍යාලයේ නව පරිච්ඡේදයක් ආරම්භ කිරීම සඳහා 2020 වසරේ අත්දැකීම් සුපරීක්ෂාකාරීව විශ්ලේෂණය කිරීම වැදගත් වේ. ආරම්භයේ සිට වසර 42ක ඉතිහාසයක් සහිතව, රුහුණ විශ්වවිද්‍යාලය මේ වන විට ශ්‍රී ලංකාවේමැනවින් ස්ථාපිත පරිපූර්ණ වූ විශ්වවිද්‍යාලයක් බවට පත්ව තිබේ. කෙසේ වෙතත්, සුවිදග්ධ ශාස්ත්‍රීය සාධන සඳහා සැබැවින්ම උත්තේජක පරිසරයක් නිර්මාණය කිරීම පිණිස සහ ගුණාත්මක උසස් ඉගෙනුමක් වෙත ප්‍රවේශය පුළුල් කරනු වස් තව බොහෝ දුරක් යා යුතු බව සැලකිල්ලට ගත යුත්තේය. එසේම ජාත්‍යන්තර කීර්තිධර විශ්වවිද්‍යාලයක් ලෙස අපට ඉදිරියට ඒමට හැකිවනු පිණිස, ඉහතින් සඳහන් කළ දුර්වල ක්ෂෙත්‍රයන් සඳහා පිළියම් යෙදීමට සාධනීයව දායකවන ලෙස මම සියලු ආචාර්යවරුන්ගෙන් සහ කාර්යමණ්ඩලයෙන් ඉල්ලා සිටිමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන**
**උපකුලපති**
**රුහුණ විශ්වවිද්‍යාලය**

# පටුන


රුහුණ සරසවිය පිළිබඳ හැඳින්වීම.....1

**කොටස I – වැදගත් තොරතුරු**

රුහුණ විශ්වවිද්‍යාලය.....2

විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය.....3

පාලන අධිකාරිය.....4

විශ්වවිද්‍යාලයීය පාලක මණ්ඩලය.....4

විශ්වවිද්‍යාලයීය සනාතන සභාව.....5

ආයතනික ඉලක්ක – 2019 - 2023.....10

**කොටස II - සුවිශේෂී සංවර්ධන කටයුතු**

ආයතනික ඉලක්ක සපුරා ගැනීම.....11

විශේෂ සිදුවීම් – වසර 2020.....14

ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක පාදක රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක.....17

තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව.....21

**කොටස III - කාර්ය මණ්ඩල වර්ගීකරණය**

සේවක වර්ගීකරණය[(අංක DMS/1528 (S)].....22

**කොටස IV - ශිෂ්‍ය තොරතුරු**

ශිෂ්‍ය පැතිකඩ.....23

ශිෂ්‍ය ඇතුළත් කර ගැනීම් – පසුගිය වසර 5.....23

අධ්‍යයන වර්ෂය අනුව පීඨයන්හි ශිෂ්‍ය ව්‍යාප්තිය.....24

ශිෂ්‍ය කටයුතු සම්බන්ධ පත්වීම්.....24

2020 වසර තුල සැපයූ නේවාසිකාගාර පහසුකම්.....25

නේවාසිකාගාර පහසුකම් (පීඨ අනුව).....27

මූල්‍ය ආධාර.....27

ශිෂ්‍ය සංගම් හා සමිති.....28

සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය.....28

**කොටස V – ප්‍රාග්ධන ප්‍රදාන අරමුදල් බෙදාහැරීම**

ප්‍රාග්ධන වියදම් 2016 – 2020.....29

2020 දෙසැම්බර් 31 දිනට සිදුකරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති.....30

## කොටස VI – පීඨ වාර්තා


කෘෂිකර්ම පීඨය ..... 33
සම සෞඛ්‍ය විද්‍යා පීඨය ..... 38
ඉංජිනේරු පීඨය ..... 44
ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය ..... 49
උපාධි අධ්‍යයන පීඨය ..... 54
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය ..... 56
කළමනාකරණ සහ මූල්‍ය පීඨය ..... 61
වෛද්‍ය පීඨය ..... 63
විද්‍යා පීඨය ..... 72
තාක්ෂණ පීඨය ..... 82


## කොටස VII – සම්මාන සහ විශේෂ සිදුවීම්


ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන ..... 85
ජාතික සහ ජාත්‍යන්තර සම්මාන ..... 88
ජාත්‍යන්තර සහයෝගිතා ..... 90
අනෙකුත් විශේෂ සිදුවීම් ..... 92


## කොටස VIII - පුස්තකාලය


පුස්තකාලයාධිපති ප්‍රකාශය සහ සමාලෝචනය ..... 93


## කොටස IX - ව්‍යාප්ති සේවා


වෛද්‍ය මධ්‍යස්ථානය ..... 99
ශාරීරික අධ්‍යාපන ඒකකය ..... 101


## කොටස X – ඒකක/මධ්‍යස්ථාන වාර්තා


වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ..... 102
ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය ..... 107
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය ..... 116
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය ..... 118
නූතන භාෂා සහ ශිෂ්ටාචාර මධ්‍යස්ථානය ..... 122
සංස්කෘතික මධ්‍යස්ථානය ..... 125

**කොටස XI – සහායක සේවා**

සාමාන්‍ය පරිපාලනය ..... 126
නෛතික හා ප්‍රලේඛන අංශය ..... 127

**කොටස XII – මූල්‍ය ප්‍රකාශන**

2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ..... 130
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 132
2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ..... 134
2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය ..... 136
2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන් ..... 138

**කොටස XIII – විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු**

විගණකාධිපති වාර්තාව .....178
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු .....184

# රුහුණ සරසවිය පිළිබඳ හැඳින්වීම

රුහුණ විශ්වවිද්‍යාලයේ පූර්වගාමියා වූ රුහුණ විශ්වවිද්‍යාල විද්‍යාතනයේ එවකට අග්‍රාමාත්‍යව සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිඳුන් විසින් 1978 අගෝස්තු මස 27 වන දින විවෘත කරනු ලැබීය. එහි ප්‍රාරම්භක පීඨ වූ කෘෂිකර්ම පීඨය, විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය ආරම්භයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුයුක්තව පැවැතුණි. රුහුණ විශ්වවිද්‍යාල විද්‍යාතනය වසර හයකට වැඩි කාලයක් මාතර, මැද්දවත්ත, කාර්මික විද්‍යාල පරිශ්‍රයෙහි පවත්වාගෙන යනු ලැබීය. 1984 පෙබරවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කරනු ලැබීමෙන් අනතුරුව මාතර වැල්ලමඩමෙහි ඉන්දීය සාගරයට මුහුණ ලා පිහිටි රමණීය කඳු ගැටයක අග්‍රගණ්‍ය ගෘහ නිර්මාණාත්මක සංකීර්ණයක එය නිල වශයෙන් ස්ථාපිත කරනු ලැබීය.

ඉන් අනතුරුව තවත් පීඨ හයක් ඊට එක් කරනු ලැබීය. ඉංජිනේරු පීඨය 1999 වසරේ ගාල්ලේදී ස්ථාපනය කරනු ලැබූ අතර කළමනාකරණ හා මූල්‍ය පීඨය වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ ස්ථාපිත කරනු ලැබුයේ 2003 වසරේදීය. තවද, ප්‍රධාන පරිශ්‍රය තුළම ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය 2005 වසරේදී පිහිටවූ අතර එය දිවයිනේ සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළම එම විෂය ක්ෂේත්‍රය සඳහා පීඨයක් ඇති කළ පළමු අවස්ථාව විය. උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කරනු ලැබුයේ 2011 වසරේදීය. මෑතකාලීනව රුහුණ විශ්වවිද්‍යාලයට එක් කළ පීඨ වනුයේ කඹුරුපිටියේ ස්ථාපිත තාක්ෂණ පීඨය (2016) සහ කරාපිටියේ ස්ථාපිත සම සෞඛ්‍ය විද්‍යා පීඨයයි (2017).

අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 8,163 දෙනෙක්, බාහිර උපාධි අපේක්ෂකයන් 18,000 කට වැඩි පිරිසක්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් 987 ක් සහ ආචාර්යවරුන් 910 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන කාර්යමණ්ඩලයක් සහිත රුහුණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතන අතුරින් එකකි. පීඨ 10 කින් සමන්විත එය ශ්‍රී ලංකාවේ වඩාත්ම විවිධාංගීකෘත විශ්වවිද්‍යාලය වන අතර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව දිවයිනේ දෙවන විශාලතම විශ්වවිද්‍යාලයයි. වෙබ්මිතික ශ්‍රේණිගතකිරීම අනුව රුහුණ විශ්වවිද්‍යාලය 2020 වසරේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර සිව්වැනි ස්ථානයේද ලෝක විශ්වවිද්‍යාල අතර 2504 වන ස්ථානයේද ශ්‍රේණිගත කර තිබුණි. තවද, 2020/2021 සඳහා මෑතකාලීන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේදී (https://cwur.org/2020-21.php) රුහුණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර 2 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කර තිබූ අතර ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරිම්වල 1733 ස්ථානයේ (මුල් 8.7% තුළ) ශ්‍රේණිගත කොට තිබුණි.

# කොටස I – වැදගත් තොරතුරු

## රුහුණ විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ස්ථාපිත කරනු ලැබූයේ | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත |
| මුළු බිම් ප්‍රමාණය | අක්කර 369 පර්චස් 35.69 |
| පීඨ | 10 |
| අධ්‍යයනාංශ | 55 |
| අංශ | 13 |
| මධ්‍යස්ථාන/ඒකක | 14 |
| උපාධි අපේක්ෂක පාඨමාලා | 40 |
| පුස්තකාල ප්‍රකාශන (පමණ) | 315,004 |
| පශ්චාත් උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව | 1,121 |
| උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව | 8,363 |
| මහාචාර්යවරුන් සංඛ්‍යාව | 95 |
| ආචාර්ය උපාධිය සහිත අධ්‍යයන කාර්ය මණ්ඩලය | 308 |

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. | අධ්‍යයන | 600 |
| 2. | පරිපාලන සහ මූල්‍ය නිලධාරීන් | 48 |
| 3. | අධ්‍යයන සහායක | 66 |
| 4. | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 865 |

# විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය



# පාලන අධිකාරිය

**රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති** – **පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක හිමි**

## විශ්වවිද්‍යාලයීය පාලක සභාව

විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය එහි විධායක සභාව සහ පාලන අධිකාරිය වන්නේය.

2020 වසරේ එහි රැස්වීම් 10ක් පවත්වන ලදී.

විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය වසර තුළ පහත දැක්වෙන් සාමාජිකයන්ගෙන් සමන්විත විය

**උපකුලපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා

**නියෝජ්‍ය උපකුලපති** - මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා

**පීඨයන්හි පීඨාධිපතිවරු**

**පීඨාධිපති/කෘෂිකර්ම පීඨය**

මහාචාර්ය එස්.ඩී. වන්නිආරච්චි මහතා

**පීඨාධිපති/ සම සෞඛ්‍ය පීඨය**

ආචාර්ය කේ.ජී. ඉමේන්ද්‍ර මහතා

**පීඨාධිපති/ ඉංජිනේරු පීඨය**

ආචාර්ය එච්.පී. සූරියආරච්චි මහතා

**පීඨාධිපති/ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

ආචාර්ය එච්.බී.අසන්ති මිය

**පීඨාධිපති/පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.පී.ජයතිස්ස මහතා

**පීඨාධිපති/මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා

**පීඨාධිපති/කළමනාකරණ සහ මූල්‍ය පීඨය**

මහාචාර්ය පී.ඒ.පී.එස්. කුමාර මහතා

**පීඨාධිපති/ වෛද්‍ය පීඨය**

මහාචාර්ය අයි.වී. දේවසිරි මහතා

**පීඨාධිපති/ විද්‍යා පීඨය**

මහාචාර්ය පී.ඒ. ජයන්ත මහතා

**පීඨාධිපති/ තාක්ෂණ පීඨය**

ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා

**පත්කළ සාමාජිකයන්**

ශ්‍රීමාල් විජේසේකර මහතා
මහාචාර්ය චන්ද්‍රාණි ලියනගේ මිය
කේ.එන්. සමරසිංහ මහතා
සුදත් ජයසේකර මහතා
ආචාර්ය යූ.ජී කරුණාරත්න මහතා
ආර්.සී ද සොයිසා මහතා
අද්මිරාල් තිසර සමරසිංහ මහතා
ඉස්තිහාර් සුෆියාන් මහතා
හේමන්තිමාලා වනිගසිංහ මිය
සුමේධ කුලතුංග මහතා
මෙත්තානන්ද විද්‍යානගමච්චි මහතා
හිමාලි රත්නවීර මිය
එම්.ජී. පුංචිහේවා මහතා

**සනාතන සහා නාමිතයන්**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. සුබසිංහ
මහාචාර්ය සම්පත් ගුණවර්ධන මයා

**ලේඛකාධිකාරී (නිල බලයෙන් ලේකම්)**

පී.එස්.කළුගම මිය

# විශ්වවිද්‍යාලයීය සනාතන සභාව

සනාතන සභාවට විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ පොදු මග පෙන්වීම තිබිය යුත්තේය.

වර්ෂය තුළ එහි රැස්වීම් 12 ක් පවත්වන ලදී.

වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**උපකුලපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා

**නියෝජ්‍ය උපකුලපති** - මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා

**පීඨයන්හි පීඨාධිපතිවරු**

**පීඨාධිපති/කෘෂිකර්ම පීඨය**

මහාචාර්ය එස්.ඩී. වන්නිආරච්චි මහතා

**පීඨාධිපති/ සම සෞඛ්‍ය පීඨය**

ආචාර්ය කේ.ජී. ඉමේන්ද්‍ර මහතා

**පීඨාධිපති/ ඉංජිනේරු පීඨය**

ආචාර්ය එච්.පී. සූරියආරච්චි මහතා

**පීඨාධිපති/ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

ආචාර්ය එච්.බී.අසන්ති මිය

**පීඨාධිපති/පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.පී.ජයතිස්ස මහතා

**පීඨාධිපති/මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා

**පීඨාධිපති/කළමනාකරණ සහ මූල්‍ය පීඨය**

මහාචාර්ය පී.ඒ.පී.එස්. කුමාර මහතා

**පීඨාධිපති/ වෛද්‍ය පීඨය**

මහාචාර්ය අයි.වී. දේවසිරි මහතා

**පීඨාධිපති/ විද්‍යා පීඨය**

මහාචාර්ය පී.ඒ. ජයන්ත මහතා

**පීඨාධිපති/ තාක්ෂණ පීඨය**

ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා

**වැඩබලන පුස්තකාලයාධිපති**

නිමල් හෙට්ටිආරච්චි මහතා

**ලේඛකාධිකාරී (නිල බලයෙන් ලේකම්)**

පී.එස්.කළුගම මිය

## අධ්‍යයනාංශ ප්‍රධානීන්

### කෘෂිකර්ම පීඨය

| | | |
|---|---|---|
| කෘෂිකාර්මික ජීව විද්‍යාව | - | ආචාර්ය සුදර්ශනී ගීකියනගේ මිය |
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව | - | මහාචාර්ය ජී.සී. සමරවීර මිය |
| කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව | - | මහාචාර්ය ජී.වයි. ජයසිංහ මහතා |
| සත්ත්ව විද්‍යාව | - | ආචාර්ය පී.ඩබ්.ඒ. පෙරේරා මහතා |
| බෝග විද්‍යාව | - | මහාචාර්ය කේ.කේ. අයි.යු. අනුර කුමාර මහතා |
| ආහාර විද්‍යාව සහ තාක්ෂණය | - | ආචාර්ය පී.ඒ.බී.එන්. පෙරුම්පුලි මහතා |
| පාංශු විද්‍යාව | - | මහාචාර්ය ඩී.ඒ.එල්. ලීලමනී මිය |

### සම සෞඛ්‍ය විද්‍යා පීඨය

| | | |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාගාර විද්‍යා | - | ආචාර්ය එච්.එච්. පීරිස් මිය |
| හෙද විද්‍යාව | - | එස්.එම්.ඊ්.බී. වීරතුංග මිය |
| ඖෂධවේදය | - | ආචාර්ය එච්. ඩබ්.ඒ.එස්. සුබසිංහ මිය (වැඩබලන) |

### ඉංජිනේරු පීඨය

| | | |
|---|---|---|
| සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව | - | ආචාර්ය ඩබ්.කේ.සී.එන්. දයන්ති මිය |
| විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යාව | - | එරන්ද ජයතුංග මහතා |
| අන්තර් ශික්ෂණ අධ්‍යයන | - | ආචාර්ය එන්.එම්. වගආරච්චි මිය |
| යාන්ත්‍රික සහ නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව | - | ආචාර්ය එන්.කේ. හෙට්ටිආරච්චි මහතා |

### ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය

| | | |
|---|---|---|
| ධීවර සහ ජලජීවී විද්‍යාව | - | මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා |
| සාරස විද්‍යාව සහ ජල තාක්ෂණය | - | ආචාර්ය යූ.ඒ.ඩී.ජයසිංහ මහතා |
| සාගර විද්‍යාව සහ සාගර භූ විද්‍යාව | - | මහාචාර්ය පී.එම්.සී.එස්. ද සිල්වා මහතා |

### මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව | - | කේ.කේ.එස්. උදයකාන්ත මහතා |
| ඉංග්‍රීසි සහ වාග් විද්‍යාව | - | පී.එන්. රත්නායක මහතා |
| භූගෝල විද්‍යාව | - | ආචාර්ය එස්.එල්.ජේ. ප්‍රනාන්දු මහතා |
| ඉතිහාසය හා පුරාවිද්‍යාව | - | ජී.සී.එල්. ගමගේ මිය |
| පාලි හා බෞද්ධ අධ්‍යයන | - | ඊ්.එච්.එම්. හීන්බණ්ඩා මහතා |
| රාජ්‍ය ප්‍රතිපත්තිය | - | අයි.ආර්. ප්‍රියන්ත මහතා |
| සමාජ විද්‍යාව | - | ඒ.එම්.එස්. ගුණසේකර මහතා |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම | - | කේ.එස්.ජී.එස්. නිශාන්ත මහතා |
| සිංහල | - | ආචාර්ය ඩී.පී.පී.ජී. ලියනගේ මහතා |

### කළමනාකරණ හා මූල්‍ය පීඨය

| | | |
|---|---|---|
| ගණකාධිකරණය සහ මුල්‍යය | - | ආචාර්ය ඩබ්.එම්. ඉන්ද්‍රාණි මිය |
| කළමනාකරණය හා ව්‍යවසායකත්වය | - | මහාචාර්ය එච්.එස්.සී. පෙරේරා මිය |
| අලෙවිකරණය | - | ආචාර්ය ඒ.බී. සිරිසේන මහතා |
| මානව සම්පත් කළමනාකරණය | - | ආචාර්ය බී.එල්.ගල්හේන මහතා |

**වෛද්‍ය පීඨය**

| | | |
|---|---|---|
| නිර්වින්දනවේදය | - | ආචාර්ය යූ.අයි.හපුආරච්චි මහතා |
| කාය ව්‍යවච්ඡේද විද්‍යාව | - | ආචාර්ය ඊ.අයි. වෛද්‍යරත්න මිය |
| ජෛව රසායන විද්‍යාව | - | ආචාර්ය ඒ.පී.අත්තනායක මිය |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව | - | ආචාර්ය චම්පා විජේසිංහ මිය |
| වෝහාරික වෛද්‍ය විද්‍යාව | - | ආචාර්ය ආර්.එච්.ඒ.අයි. රත්නවීර මහතා |
| වෛද්‍ය විද්‍යාව | - | ආචාර්ය එච්.එම්.එම්. හේරත් මහතා |
| ක්ෂුද්‍ර ජීව විද්‍යාව | - | ආචාර්ය එන්.පීත වීරසිංහ මහතා |
| ප්‍රසවවේදය හා නාරිවේදය | - | ආචාර්ය එම්.ඩී.සී.එස් කුලරත්න මහතා |
| ළමා රෝග විද්‍යාව | - | ආචාර්ය එන්.ඩී.ලියනආරච්චි මිය |
| පරපෝෂවේදය | - | මහාචාර්ය ටී.සී. යහතුගොඩ මහතා |
| ව්‍යාධිවේදය | - | ආචාර්ය කේ.ඒ.සී.චික්‍රමරත්න මහතා |
| භිෂග්වේදය | - | මහාචාර්ය පී.එල්.සී.සී. ලියනගේ මිය |
| භෞතවේදය | - | ආචාර්ය ඒ. කරුණානායක මහතා |
| මනෝ චිකිත්සාව | - | ආචාර්ය අයි.එච්.රාජපක්ෂ මිය |
| ශල්‍යවේදය | - | මහාචාර්ය ආර්.ඩබ්. සෙනෙවිරත්න මහතා |

**විද්‍යා පීඨය**

| | | |
|---|---|---|
| උද්භිද විද්‍යාව | - | ආචාර්ය කේ.කේ.ජී.යූ. හේමමාලි මිය |
| රසායන විද්‍යාව | - | ආචාර්ය ජී.බී.සී. සනත් මහතා |
| පරිගණක විද්‍යාව | - | ආචාර්ය ඩබ්.ඒ. ඉන්දිකා මිය |
| ගණිතය | - | කේ.සී.එන්. ශාන්තිදේවි මිය |
| භෞතික විද්‍යාව | - | ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා |
| සත්ත්ව විද්‍යාව | - | ආචාර්ය ඩබ්.ඒ.එච්.පී.ගුරුගේ මහතා |

**තාක්ෂණ පීඨය**

| | | |
|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණවේදය | - | ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය |
| ඉංජිනේරු තාක්ෂණවේදය | - | ආචාර්ය බී.එල්්එස්. තිලකරත්න් මහතා |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | - | ආචාර්ය පී.කේ.එස්.සී. ජයසිංහ මහතා |
| බහුශික්ෂණ අධ්‍යයනය | - | ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා (වැඩ බලන) |

**මහාචාර්යවරු**

| | | |
|---|---|---|
| බෞද්ධ සංස්කෘතිය මහාචාර්ය | - | පූජ්‍ය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මිදිගම සෝරත හිමි |
| පරපෝෂවේද මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.වී. වීරසූරිය මිය |
| ළමා රෝග විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යූ.කේ.ජයන්ත මහතා |
| වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් ලේකම්වසම් මහතා |
| වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ටී.පී. වීරරත්න මහතා |
| භූගෝල විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.හේවගේ මහතා |
| භෝග විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. සුබසිංහ මහතා |
| කෘෂිකාර්මික ජීවවිද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්. වසන්ත කුමාර මහතා |
| කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.එල්.ඒ.ජී අල්විස් මහතා |
| කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.එම්. නවරත්න මිය |
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.එම්.අබේවික්‍රම මහතා |
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මංගල ද සොයිසා මහතා |
| උද්භිද විද්‍යාමහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් අබේසිංහ මහතා |
| ආහාර විද්‍යා සහ තාක්ෂණ මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විජිත් එස් ජයමාන්න මහතා |
| ගණිත මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.ඒ.එල්.ඩබ්. ජයසේකර මහතා |

| | | |
|---|---|---|
| සාරස විද්‍යා සහ ජල තාක්ෂණවේදය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිලක් පී.ඩී. ගමගේ මහතා |
| ඉංග්‍රීසි භාෂා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ.ඒ. ගාමිණී ෆොන්සේකා මහතා |
| සිංහල භාෂා මහාචාර්ය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.ජී අමරසේකර මහතා |
| සිංහල භාෂා මහාචාර්ය | - | මහාචාර්ය ජයන්ත අමරසිංහ මහතා |
| කායික විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය සම්පත් ගුණවර්ධන මහතා |
| ව්‍යූහ විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඉසුරාණි ඉලේපෙරුම මිය |
| වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය කේ.ඩී. පතිරණ මහතා |
| මනෝ චිකිත්සා මහාචාර්ය | - | මහාචාර්ය ජී.එච්. චාන්දනී මිය |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය බිලේෂ පෙරේරා මහතා |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය පී.වී. ද සිල්වා මහතා |
| භෞතික විද්‍යාව මහාචාර්ය | - | මහාචාර්ය කේ.කේ.ඒ.එස්. යාපා මිය |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එන්.එස්.බී.එම්.අතපත්තු මහතා |
| කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එස්. විජේතුංග මහතා |
| කෘෂි ජෛව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එන් දහනායක මිය |
| කෘෂි ජෛව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී.ආර්. රත්නසේකර මිය |
| කෘෂි ජෛව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඒ.එල්. රණවක මිය |
| කෘෂි ආර්ථික විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඒ.එල්. සන්දික මහතා |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එන්. වයි. හිරිමුතුගොඩ මිය |
| උද්භිද විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය පී.ඩී.අබේසිංහ මිය |
| රසායන විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය වජිරා පී. බුළුගහපිටිය මිය |
| රසායන විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ජේ.ඩබ්. හේවගේ මහතා |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එන්.ජේ.ද එස්. අමරසිංහ මිය |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය කේ.බී.සුනීතා ගුණවික්‍රම මිය |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඩී.එච්.එන්. මුණසිංහ මිය |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එම්.පී.කේ.එස්.කේ ද සිල්වා මිය |
| සත්ත්ව විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඩබ්.ටී.එස්.ඩී. ප්‍රේමවන්ද්‍ර මිය |
| බෝග විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඩබ්.ජී.ඩී. ලක්මිණි මිය |
| පාංශු විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය බී.සී.වල්පොල මහතා |
| සාරස විද්‍යා සහ ජල තාක්ෂණවේදය | - | මහාචාර්ය ආර්.ඒ. මෛත්‍රීපාල මහතා |
| භිෂග්වේද මහාචාර්ය | - | මහාචාර්ය එස්.එස්.ජයසිංහ මිය |
| ජෛව රසායන විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ආර්.පී. හේවාවසම් මිය |
| ජෛව රසායන විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය කේ.ඒ.පි.ඩබ්. ජයතිලක මිය |
| ජෛව රසායන විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය සී.එම්. වික්‍රමතිලක මිය |
| ක්ෂුද්‍ර ජීවවිද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ඒ ද එස්. නාගහවත්ත මහතා |
| කායික විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය ආර්.එස්.ජේ. ලෙනෝරා මහතා |
| කායික විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය කේ.ඩී. මහින්ද මහතා |
| ව්‍යාධිවේද මහාචාර්ය | - | මහාචාර්ය එල්.කේ.බී. මුද්දුව මිය |
| න්‍යෂ්ඨීක වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය එම්.ඩී. හෙට්ටිආරච්චි මහතා |
| වෛද්‍ය විද්‍යා මහාචාර්ය | - | මහාචාර්ය සී.කේ. බෝධිනායක මිය |

**සනාතන සභාවේ පීඨ නියෝජිතයන්**

| | | |
|---|---|---|
| **කෘෂිකර්ම** | - | ආචාර්ය ඩී.එල්.සී.කුමාරි ෆොන්සේකා මිය |
| | - | ආචාර්ය අයි.ආර්. පලිහක්කාර මහතා |
| **සම සෞඛ්‍ය විද්‍යා** | - | ආචාර්ය එස්.කේ. හෙට්ටිහේවා මිය |
| | - | ආචාර්ය එච්.ඩබ්.ඒ.එස්. සුබසිංහ මිය |
| **ඉංජිනේරු** | - | ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි මහතා |
| | - | ආචාර්ය කේ.එස්. වන්නිආරච්චි මයා |
| **ධීවර සහ සාගර** | - | ආචාර්ය පී.එන්.රූපසිංහ මහතා |
| **විද්‍යා සහ තාක්ෂණය** | - | ආචාර්ය කේ.ආර්. ගමගේ මිය |
| **මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා** | - | ආචාර්ය ඩී.පී.පී.ජී. ලියනගේ මහතා |
| | - | ආචාර්ය බී.එච්.එම්. ඩබ්. බෝහින්ගමුව මහතා |
| **කළමනාකරණ සහ මූල්‍ය** | - | ආචාර්ය තිස්ස හේමරත්න මහතා |
| | - | කේ.ඒ.එස්. ශ්‍රියාණි මිය |
| **වෛද්‍ය** | - | ආචාර්ය එම්.බී. සමරවික්‍රම මහතා |
| | - | ආචාර්ය ටී.ජී. ලියනගේ මහතා |
| | - | |
| **විද්‍යා** | - | ආචාර්ය ටී.ජී. දයානන්ද මහතා |
| | - | ආචාර්ය එස්. වන්නිආරච්චි මහතා |
| **තාක්ෂණවේද** | - | ආචාර්ය කේ.එච්. තිස්ස කරුණාරත්න මහතා |
| | - | ආචාර්ය වී.එච්.පී. පතිරණ මහතා |

# ආයතනික ඉලක්ක – 2019 - 2023

1. අධ්‍යාපනය, පර්යේෂණ හා සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම.

2. අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම.

3. අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරිම.

4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම

5. යහපාලනය සහතික කිරීම.

6. නව නිපැයුම් සහ නව්‍යකරණය දායාද කිරීම

7. අද්විතීයත්වය මූර්තිමත් කිරීම



# කොටස II – සුවිශේෂී සංවර්ධන කටයුතු

## ආයතනික ඉලක්ක සපුරා ගැනීම

### ඉලක්කය 01 - අධ්‍යාපනය, පර්යේෂණ හා සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම

- නව දුරස්ථ ඉගෙනුම් පාඨමාලා - මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

**ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව**

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බොහෝ උපාධි වැඩසටහන් වර්ෂය පුරාම මාර්ගගතව පවත්වනු ලැබීය
- 2019 සහ 2020 ශිෂ්‍ය බඳවා ගැනීම

| | **2019** | **2020** |
|---|---|---|
| **බඳවා ගැනීම්** | 2392 | 2459 |

### ඉලක්කය 02 - අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම

- ආචාර්ය උපාධි සහිත ආචාර්යවරුන් 51%කි.
- 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යමණ්ඩල ව්‍යාප්තිය

| **පීඨය** | **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය** | **මහාචාර්ය** | **සහාය මහාචාර්ය** | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය** | **කථිකාචාර්ය** | **කථිකාචාර්ය (පරිවාස)** | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| කෘෂි. | 8 | 15 | 1 | 26 | 7 | 12 | **69** |
| ස.සෞ.වි | - | 1 | - | 14 | - | 19 | **34** |
| ඉංජි. | - | 2 | - | 46 | 5 | 21 | **74** |
| ධී.සා.වි.තා. | 1 | 3 | - | 9 | 5 | 9 | **27** |
| මා.ශා. සහ ස.වි. | 6 | 3 | 5 | 68 | 2 | 28 | **112** |
| කළම. | - | 1 | 1 | 38 | 6 | 7 | **53** |
| වෛද්‍ය | 7 | 20 | 2 | 49 | 3 | 19 | **100** |
| විද්‍යා | 4 | 12 | 2 | 50 | 7 | 19 | **94** |
| තාක්ෂණ | - | 1 | - | 8 | - | 28 | **37** |
| එකතුව | **26** | **58** | **11** | **308** | **35** | **162** | **600** |

- නවීන ඉගැන්වීම් පහසුකම් සහිත දේශනාගාර සහ විද්‍යාගාර

    - AHEAD ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශයේ නව භාෂා විද්‍යාගාරයක් සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කරනු ලැබීය - මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

    - ඉංජිනේරු තාක්ෂණ අධ්‍යනාංශයේ ඉංජිනේරු තාක්ෂණ විද්‍යාගාරය, යාන්ත්‍රික යන්ත්‍ර වැඩපොළ, ඉලෙක්ට්‍රොනික හා විඩම්බන විද්‍යාගාරය, ද්‍රව්‍ය විද්‍යාගාරය, රොබෝ විද්‍යා සහ ස්වයංක්‍රියකරණ විද්‍යාගාරය,මෝටර් රථ විද්‍යාගාරය ස්ථාපිත කරන ලදී- තාක්ෂණ පීඨය

- රුහුණ විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම

    - වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම – 2020

| | |
|---|---|
| **ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම** | 04 |
| **ලෝක ශ්‍රේණිගත කිරීම** | 2503 |

## ඉලක්කය 03 - අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම

- උපාධි අපේක්ෂකයන් සඳහා කර්මාන්ත පුහුණුව/අධිරෝපණ පුහුණුව / සීමාවාසික පුහුණු ලබාදීම

    - සිව්වැනි වසරේ සියලු උපාධි අපේක්ෂකයන් සඳහා දෙමසක කර්මාන්ත පුහුණුවක් ලබා දේ.- ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය.

    - පුරාවිද්‍යාව, ඉතිහාසය, භූගෝලය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්තිය හදාරන 4000 මට්ටම ශිෂ්‍යයන් සඳහා සීමාවාසික පුහුණුව - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

    - 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන සියලු ගෞරව උපාධි වැඩසටහන්වල අනිවාර්ය පාඨමාලාවක් ලෙස සීමාවාසිකත්වය හඳුන්වා දෙන ලදී - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

    - ඉංජිනේරු තාක්ෂණවේද උපාධි වැඩසටහන හදාරන ශිෂ්‍යයන් මාස හයක කර්මාන්ත පුහුණුවක් සාර්ථකව නිමා කරනු ලැබූ අතර ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය දැනටමත් ඔවුන්ගේ පුහුණුව ඇගයීමට ලක් කර ඇති අතර ඔවුන් සියලු දෙනා ඉන් සමත් වී තිබේ.- තාක්ෂණ පීඨය

    - තොරතුරු සහ සන්නිවේදන උපාධි වැඩසටහන හදාරන සිසුන් සිය කර්මාන්ත පුහුණුව අරඹන ලදී. - තාක්ෂණ පීඨය

## ඉලක්කය 04 - යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම

- දැඩි ආර්ථික සමාජීය අවශ්‍යතා පවතින සිසුන් සඳහා මූල්‍ය සහාය




## ඉලක්කය 05 – යහපාලනය සහතික කිරීම

- ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචන රැස්වීම් නිරතුරුව පැවැත්වීම

## ඉලක්කය 06 – නව්‍යකරණය සහ නව නිපැයුම් දායාද කිරීම

- නව නිපැයුම් නිර්මාණය කිරීමේ සහ පේටන්ට් බලපත්‍ර ලබාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම

## ඉලක්කය 07 – අද්විතීයත්වය මූර්තිමත් කිරීම

- පාලන මණ්ඩලයේ අනුමතිය සහිතව සාගර විද්‍යා සහ සමුද්‍රීය භූවිද්‍යා අධ්‍යනාංශයේ ‘කිමිදුම් ඒකකයක්’ ස්ථාපිත කරන ලදී.

- සමුද්‍රීය ජල ජීවී වගා පහසුකම සංවර්ධනය කරනු ලැබූ අතර තායිවාන සාගර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී.

# විශේෂ සිදුවීම්–2020 වසර

**1. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා මුල්ගල තැබීමේ උත්සවය**



**2. වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම**



**3. අධ්‍යයන වැඩසටහන් සංවර්ධනය**

* COURSERA මාර්ගගත ඉගෙනුම් වේදිකාව ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන ලදී- සම සෞඛ්‍ය විද්‍යා පීඨය

* IV මට්ටම සඳහා සාගර සහ මිරිදිය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධියේ සම්පූර්ණ විෂයමාලාව හඳුන්වා දෙනු ලැබීය - ධීවර සහ සාගර විද්‍යා පීඨය

* IV මට්ටම සඳහා ධීවර සහ සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධියේ සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කරනු ලැබීය - ධීවර සහ සාගර විද්‍යා පීඨය

* TROPIMUNDO සඳහා භූ දත්ත විද්‍යා පාඨමාලාව (පැය 45) හඳුන්වා දෙන ලදී. - සර්ම කලාපීය ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති පිළිබඳ එරාස්මස් මුන්ඩුස් ඒකාබද්ධ ශාස්ත්‍රපති උපාධිය - විද්‍යා පීඨය

* යෝජිත ගෞරව උපාධි වැඩසටහන සඳහා ‘‘රොබෝ විද්‍යාව හැඳින්වීම’’ නව පාඨමාලා ඒකකයක් හඳුන්වා දෙන ලදී - විද්‍යා පීඨය

* ඉලෙක්ට්‍රොනික පද්ධති සැලසුම, යන්ත්‍ර යාන්ත්‍රික විද්‍යාව, යන්ත්‍ර සැලසුම, ක්‍රමලේඛ්‍ය ඩිජිටල් ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ යෙදුම් හඳුන්වා දෙන ලදී.

## 4. ජාතික සහ අන්තර්ජාතික ශාස්ත්‍රීය පර්යේෂණ සම්මන්ත්‍රණ පවත්වන ලදී

* 17 වැනි අධ්‍යයන සැසි සහ 16 වැනි උප කුලපති සම්මාන ප්‍රදානෝත්සවය
* සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 3වැනි පර්යේෂණ සමුළුව (RUFARS – 2020)
* 7වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මන්ත්‍රණය 2020 (RISTCON – 2020)
* මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලීය 6 වැනි ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS-2020)
* රුහුණ කලා ශිෂ්‍යයන්ගේ වාර්ෂික සැසි (RASAS-2020)
* කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ 9වැනි ජාත්‍යන්තර සම්මේලනය (ICME-2020)
* කෘෂිකර්මය සහ පරිසරය පිළබඳ ජාත්‍යන්තර ශාස්ත්‍රීය සමුළුව (ISAE – 2020)

## 5. නව අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීම

* ගුයිෂු විද්‍යා ඇකඩමිය, චීනය
* චුලාබ්හෝන් උපාධි ආයතනය, තායිලන්තය
* තාඩිෆ් මෙට්රොපොලිටන් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
* මොස්කව් විශ්වවිද්‍යාලය, රුසියාව
* වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකාව
* ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම
* ඩයලොග් ඇක්සියාටා සමාගම, ශ්‍රී ලංකාව

## 6. සුවිශේෂී ක්‍රීඩා දස්කම්

* රුහුණ විශ්වවිද්‍යාලය මාර්ගගත 2020 ලෝක ටයිකොන්ඩෝ ආසියානු සූමාසේ විවෘත ශූරතාවලිය නියෝජනය කරන ලදී.
* රුහුණ විශ්වවිද්‍යාලය 1 වැනි අතථ්‍ය ටයිකොන්ඩෝ ජාතික ශූරතාවලිය නියෝජනය කරන ලදී.

## 7. නව නිපැයුම් සහ නවෝත්පාදන

* වැකුම් බලයෙන් ක්‍රියාකරන ප්‍රරෝහණ බීජ ස්ථාපන උපකරණය -රිදී පදක්කම ‘‘සහසක් නිමැවුම්’’ -2020 කෘෂිකර්ම පීඨය
* මෙඩිකස්+ (වෛද්‍ය රොබෝ යන්ත්‍රය) මූලාකෘතිය සංවර්ධනය -ඉංජිනේරු පීඨය
* සෞඛ්‍ය සම්පන්න පෝෂ්‍යදායී ක්ෂණික ආහාර නිපදවා තාක්ෂණික පැවැරුම් කාර්යාලය හරහා වාණිජකරණය කරන ලදී - මහාචාර්ය කේ.ජී. සෝමසිරි මයා- වෛද්‍ය පීඨය
* අණ්වීක්ෂයේම කොටසක් ලෙස ඇති කැමරාව, පාංශු ද්‍රවමාණය සහ ද්‍රාව සන්නායකතා මීටරය- විද්‍යා පීඨය
* සූර්ය බලයෙන් ක්‍රියාකරන ස්වයංක්‍රීය දැත් පිරිසිදුකාරකය, ස්වයංක්‍රීය කුඩා ඇණිළි සලකුණුකරණය සහ පාලනය කළ හැකි ඇතුළත උෂ්ණත්වය සහ සුහරු ආරක්ෂිත විවර පද්ධතිය සහිත විකරණය කළ හස්මාටි ඇඳුම - තාක්ෂණ පීඨය

## 8. තත්ත්ව ආරක්ෂණ සුවිශේෂී සිදුවීම්

* තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම (CQA)
* තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනතාන සහා ස්ථාවර කමිටුව ස්ථාපිත කිරීම
* 2021-2023 සඳහා තත්ත්ව ආරක්ෂණ උපායමාර්ගික සැලැස්ම සම්පාදනය
* තත්ත්ව ආරක්ෂණ අතුරු නීති සංශෝධනය
* විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම ‘‘ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සහ සමපදස්ථ ඇගයීම’’
* දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් සහ 2) පුස්තකාල සේවා සඳහා නව අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කුටි දෙකක් ස්ථාපිත කිරීම
* තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයේ වෙබ් පිටුව දියත් කිරීම
* නව උපාධි අපේක්ෂක වැඩසටහන් හතක්, පශ්චාත් උපාධි වැඩසටහන් හතරක් සහ සහතික පත්‍ර/ ඩිප්ලෝමා/උපාධි අපේක්ෂක පාඨමාලා 21ක් ප්‍රතිශෝධනය හෝ හඳුන්වාදීම
* වාර්ෂික රැකියා නියුක්තතා වාර්තාව සකස් කිරීම
* ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තාව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම
* කෘෂිකර්ම පීඨයේ, වෛද්‍ය පීඨයේ, ඉංජිනේරු පීඨයේ, සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වැඩසටහන් සමාලෝචන සම්බන්ධීකරණය

# ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක පාදක රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක

| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක | රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක |
|---|---|
| **ඉලක්කය 4. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා දිරිගැන්වීම.** | **ඉලක්කය 2. අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම**<br>• වර්ෂ 2023 වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 70%ක් ආචාර්ය උපාධි හෝ ආචාර්ය උපාධි සමාන සුදුසුකම් සපුරා ඇති බව සහතික කිරීම.<br>• පීඨයන්හි සියලු වැඩසටහන් සමාලෝචන සම්පූර්ණ කිරීම සහ ආයතනික සමාලෝචනය සඳහා විශ්වවිද්‍යාලය සූදානම් කිරීම.<br>• වයි-ෆයි පහසුකම් පුළුල් කිරීම මගින් 2023 වන විට සියලු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා තොඇතා. පහසුකම් වෙත ප්‍රවේශය සැපයීම.<br>✓ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ වයි-ෆයි ආවරණ කලාප ප්‍රතිශතය ඉහළ නැංවීම.<br>✓ වයි-ෆයි මගින් ආවරණය වන නේවාසිකාගාර ප්‍රතිශතය ඉහළ නැංවීම.<br>✓ අධ්‍යයන කාර්ය මන්ඩලයේ සියලු දෙනා සඳහා පුද්ගලික පරිගණක ලබාදෙන බව සහතික කිරීම. |
| | **ඉලක්කය 3. අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම**<br>• වර්ෂ 2023 වන විට උපාධිය ලබා වසරක් තුළ සමස්ත රැකියා නියුක්තතාව 95% දක්වා ඉහළ නැංවීම පිණිස සියලු උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වල විෂයමාලා සංශෝධනය.<br>• වර්ෂ 2023 වන විට සියලු විෂයමාලාවන්ට නිමැවුම් පාදක අධ්‍යාපන මූලධර්ම හඳුන්වාදීම සම්පූර්ණ කිරීම. |
| | **ඉලක්කය 4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම**<br>• විශේෂ හැකියා සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා සැපිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් වර්ෂ 2023 වන විට ප්‍රධාන ගොඩනැගිලිවලට සැපයීම සහතික කිරීම.<br>• වර්ෂ 2023 වන විට විශේෂ හැකියාවන්ගෙන් යුත් ශිෂ්‍යයන් 25 දෙනෙකු සඳහා ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කිරීම. |

| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක | රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක |
|---|---|
| **ඉලක්කය 5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම** | **ඉලක්කය 4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම**<br>• වර්ෂ 2023 වන විට සියලු ශිෂ්‍ය සංගම් සහ අධ්‍යයන කවයන්හි නිලධාරීන් අතර යටත් පිරිසෙයින් 30%ක කාන්තා නියෝජනයක් සහතික කිරීම. |
| **ඉලක්කය 9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම** | **ඉලක්කය 2. අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම**<br>• 2020 වන විට පරිපාලන ක්‍රියාදාමය සහ කර්තව්‍යයන්ගෙන් 60%ක් ස්වයංකෘත කරනු ලබන බවට සහ 2023 වන විට එය මුළුමණින්ම ස්වයංකෘත පද්ධතියක් බවට පත්කරන බවට සහතික කිරීම.<br>• 2023 වන විට සියලු පීඨ,පුස්තකාල සහ පරිපාලන ඒකකවල කළමනාකරණ තොරතුරු පද්ධතිය ඒකාබද්ධ කිරීම.<br>• නවීන ඉගැන්වීම් පහසුකම් සහිත සියලු දේශනාගාර සහ විද්‍යාගාර ඇතුළුව වර්ෂ 2023 වන විට භෞතික වත්කම් 50%කින් වැඩි කිරීම.<br>• 2023 වන විට ඩිජිටල් පුස්තකාල පහසුකම් 60% කින් ඉහළ නැංවීම. |
| | **ඉලක්කය 1. අධ්‍යාපනය, පර්යේෂණ සහ සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම.**<br>• වර්ෂ 2023 වන විට පර්යේෂණ සඳහා ධාරිතාව සහ පහසුකම් 25%කින් වැඩිකිරීම. |
| | **ඉලක්කය 6. නව නිපැයුම් සහ නව්‍යකරණ දායද කිරීම**<br>• 2023 වන විට රුහුණ විශ්වවිද්‍යාලයේ නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍රවල දත්ත සමුදායක් සකස්කර පවත්වා ගැනීම.<br>• 2023 වන විට වසරක් සඳහා ජාතික පේටන්ට් බලපත්‍ර පහක් සහ එක් අන්තර්ජාතික පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම.<br>• 2023 වන විට වසරට පේටන්ට් බලපත්‍ර දෙකක් වාණිජකරණය කිරීම.<br>• වසරකට නව නිපැයුම් සහ නව්‍යකරණ පිළිබඳ ජාතික සහ අන්තර්ජාතික ප්‍රදර්ශනවලදී සහභාගිවීම් 5ක් සපුරා ගැනීම.<br>• නව නිපැයුම් සකස්කිරීම පිළිබඳ දැනුවත්කිරීම් වැඩසටහන් 10 ක් ප්‍රවර්ධනය කිරීම සහ 2023 වනවිට පේටන්ට් බලපත්‍ර ලබාගැනීම. |

| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක | රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක |
|---|---|
| | **ඉලක්කය 3. අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම**<br>• වර්ෂ 2023 වන විට විශ්වවිද්‍යාලය සිදුකරනු ලබන පර්යේෂණ 80%ක් ජාතික/කලාපීය අවශ්‍යතා සඳහා පිළියම් යෙදීම පිණිස වන බවට සහතික කිරීම.<br>• 2023 වන විට පර්යේෂණ වාණිජකරණය සඳහා වන යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.<br>• 2023 වන විට පර්යේෂණ ව්‍යාපෘති 10ක් සාර්ථකව වාණිජකරණය කරන බවට සහ බාහිර ගිවිසුම් 20කට එළඹෙන බවට වගබලා ගැනීම. |
| **ඉලක්කය 10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම** | **ඉලක්කය 4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම**<br>• සියලු වාර්ගික ආගම් ප්‍රජාවන් සඳහා සමගියෙන් සහ සාමදානයෙන් යුතුව අධ්‍යයන කටයුතු කිරීමට සහ ජීවත්වීමට හැකි හිතකර පරිසරයක් පවත්වා ගැනීම.<br>• ස්ත්‍රීපුරුෂභාවය, වාර්ගිකත්වය සහ ආගම නොතකා සියලු ක්‍රියාකාරකම්වලදී සමාන අවස්ථා සහතික කිරීම. |
| **ඉලක්කය 14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍රීය සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය** | **ඉලක්කය 7. අද්විතීයබව මූර්තිමත් කිරීම**<br>• රුහුණ විශ්වවිද්‍යාලය සුවිශේෂී කිරීම පිණිස මිරිදිය සහ සාගර විද්‍යාවන් ආශ්‍රිතව දැනට පවතින උපාධි වැඩසටහන් සඳහා නව උපාධි වැඩසටහන් පහක් සහ නව පාඨමාලා ඒකක 10ක් හඳුන්වා දීම.<br>• 2023 වන විට වෙරළාශ්‍රිත මධ්‍යස්ථානය (CoRAC) වැඩි දියුණු කිරීම.<br>• වර්ෂ 2023 වන විට ජාත්‍යන්තර සමුද්‍රීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග නව සබැඳි 5ක් ඇති කර ගැනීම.<br>• වර්ෂ 2023 වන විට ජාතික මට්ටමේ ජලාලයක් ඇතුළුව විශ්වවිද්‍යාලය අවට විශ්වවිද්‍යාල නාගරියක් සංවර්ධනය කිරීම.<br>• 2023 වන විට ප්‍රාදේශීය ධීවර ප්‍රජාව, ධීවර කර්මාන්තය සහ වරාය කර්මාන්තය වෙත දැනුම සහ තාක්ෂණය පැවැරුම් සඳහා පාඨමාලා ඒකක 10ක් සහ නව සහතිකපත්‍ර පාඨමාලා පහක් හඳුන්වා දීම. |

| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක | රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක |
|---|---|
| **ඉලක්කය 16. සාමකාමී සහ සියලු දෙනා අයත්වන සමාජයක් ප්‍රවර්ධනය කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගවීම සහිත සහ සර්වග්‍රාහී ආයතන ගොඩනැගීම** | **ඉලක්කය 4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම**<br>• ලිංගික සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.<br>• 2023 වන විට දැඩි ආර්ථික/ සමාජීය අවශ්‍යතා සහිත සියලු සිසුන් සඳහා මූල්‍ය/සමාජීය සහාය ලබා දීම.<br>✓ ශිෂ්‍යාධාර/මහපොළ ශිෂ්‍යත්වය මගින් මූල්‍ය ආධාර ලබන ලබන්නා වූ ශිෂ්‍ය ප්‍රතිශතය ඉහළ නැංවීම.<br>✓ අනෙකුත් ශිෂ්‍යත්ව සංඛ්‍යාව වැඩි කිරීම. |
| | **ඉලක්කය 5. යහපාලනය සහතික කිරීම**<br>• පවත්නා පාලන නීති හා රෙගුලාසි විධිමත් කොට ඒවාට අනුගත වීම.<br>• වගවීම සහ පාරදෘශ්‍යභාවය පවත්වා ගැනීම.<br>• සංවිධානමය කාර්යසාධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම.<br>• සාධාරණ කාලරාමුවක් තුළ පාර්ශවකරුවන්ට සේවය සැලසීම.<br>• සඵල සහ කාර්යක්ෂම පාරිභෝගික හිතකාමී පරිසරයක් පවත්වාගැනීම මගින් පාර්ශකරුවන් සමග විවෘත සහ විස්තීරණ සබඳතාවක් ප්‍රවර්ධනය කිරීම. |
| **ඉලක්කය 17. තිරසර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය ක්‍රියාවට නැංවීමේ විධි ශක්තිමත් කිරීම සහ යළි පණගැන්වීම** | **ඉලක්කය 7. අද්විතීයබව මූර්තිමත් කිරීම**<br>• 2023 වන විට ජාත්‍යන්තර සමුද්‍රීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග නව සබැඳි 5ක් ඇති කර ගන්න. |

# තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

**(2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටසේ අංක 17 (ඇ) වගන්තිය ප්‍රකාරවය)**

**2020 වසරේ හරිත පරිසර සංකල්පය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

## 1. හරිතාගාරය



භූ අලංකරණ ක්‍රියාකාරකම් සඳහා පැල අවශ්‍යතා සපුරාලීම පිණිස පැල නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කරන ලදී.එම නිෂ්පාදනාගාරයේ විවිධ වර්ගයේ අලංකාර ශාක සහ මල් හටගන්නා ශාක වගා කරන ලද අතර දැනට ක්‍රියාත්මත කරමින් පවතින භූ අලංකරණ ව්‍යාපෘති සඳහා ඒවා යොදා ගන්නා ලදී. විසිතුරු පැල සහිත පෙර නිමි පෝච්චි ගණනාවක් පවත්වා ගැනීම ආරම්භ කළ අතර එමගින් අනාගත උත්සව අවස්ථාවන්හිදී සැරසිලි සඳහා වන වියදම් අඩු වනු ඇත.

## 2. භූ අලංකරණ ගුරු සැලැස්ම




කෘෂිකර්ම පීඨයේ සහ උද්භිද විද්‍යා අධ්‍යනාංශයේ විශේෂඥයන් සමග පැවැත්වූ සාකච්ඡා මාලාවකින් අනතුරුව, වැල්ලමඩම පරිශ්‍රයේ භූ අලංකරණ සංවර්ධනය සඳහා ගුරු සැලැස්මක් සකස් කරනු ලැබීය. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සුන්දරත්වය සහ ශාක විශේෂ විවිධත්වය ඉහළ නැංවීම පිණිස දැනට පවතින වටිනා ශාක විශේෂ සංරක්ෂණය කිරීම ද ගුරු සැලැස්මට අන්තර්ගත කරනු ලැබීය. විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ප්‍රධාන වැව ඉදිරිපිට පවත්නා දැනට වාහන අංගනය ලෙස යොදා ගන්නා වගා කළ හැකි භූමිය විධිමත් වාහන අංගනයක් හා විවේක උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වී තිබේ.

## 3. අපද්‍රව්‍ය බැහැර කිරීම

විශ්වවිද්‍යාලය තුළ විධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. දෛනිකව රැස්වන අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට එකතු කරන ලබන අතර වීදුරු, පොලිතීන් සහ කඩදාසි අපද්‍රව්‍ය ලෙස ඒවා බැහැර කිරීමට කටයුතු යොදා ඇත. ආහාර අපද්‍රව්‍ය කෘෂිකර්ම පීඨයේ ගොවිපොළේ ඌරන්ගේ කෑම සඳහා යවන අතර තවත් කොටසක් වැල්ලමඩම පරිශ්‍රයේ කොම්පෝස්ට් නිෂ්පාදනාගාරය වෙත යොමු කරනු ලැබේ.

### *3.1 කොම්පෝස්ට් නිෂ්පාදනය*



විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය නොකඩවා සිදුකරයි. දිනපතා එකතුවන ශාක පත්‍ර සහ ආපනශාලාවලින් එකතු කරගනු ලබන ආහාර අපද්‍රව්‍ය යම් ප්‍රමාණයක් කොම්පෝස්ට් නිපදවීම සඳහා යොදා ගන්නා අතර ඒවා මල් පාත්ති සහ අනෙකුත් ශාක සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ.

# කොටස III - කාර්ය මණ්ඩල තොරතුරු

**සේවක වර්ගීකරණය (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අංක DMS 1528(S) වෙළුම-1 ප්‍රකාරව)**

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පිරවීමට නියමිත ඇබෑර්තු |
|---|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL - 1 | 394 | 344 | 50 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | PL - 2 | 124 | 98 | 26 |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL - 3 | 81 | 61 | 20 |
| | | | | |
| **ද්විතීයික මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U – MN 1 | 344 | 131 | 111 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික | U – MT 1 | 173 | 51 | 70 |
| ආශ්‍රිත නිලධාරීන් - ඛණ්ඩය 2 | U – MN 2 | 2 | 2 | - |
| ආශ්‍රිත නිලධාරීන් - ඛණ්ඩය 1 | U – MN 3 | 26 | 22 | 4 |
| කාර්යමණ්ඩල සහායක / අධි සහ ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සහායක | U – MN 4 | අනුමත කාර්ය මණ්ඩලයක් නොමැත. (U-MN 1 හා U-MT1 හි උසස්වීම් ලබාගත් සේවකයින්) | 154 | - |
| | | | | |
| **තෘතීයික මට්ටම** | | | | |
| අධ්‍යයන සහාය - ඛණ්ඩය 2 | U – AS 1 | 81 | 18 | 16 |
| අධ්‍යයන සහාය - ඛණ්ඩය 1 | U – AS 2 | | 47 | |
| කණිෂ්ඨ විධායක / කළමනාකරුවන් | U – EX 1 | 34 | 28 | 6 |
| | | | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| මධ්‍ය මට්ටමේ විධායක නිලධාරීන් | U – EX 2 | 25 | 15 | 5 |
| මධ්‍ය මට්ටමේ විධායක නිලධාරීන් | U – EX 2 (a) | | 5 | |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | U – EX 3 | 2 | 2 | - |
| කථිකාචාර්ය | U – AC 3 | 788 | 505 | 188 |
| සහාය මහාචාර්යවරු | U – AC 4 | | 11 | |
| මහාචාර්යවරු / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු | U – AC 5 | | 84 | |

# කොටස IV - ශිෂ්‍ය තොරතුරු

## ශිෂ්‍ය පැතිකඩ

| කාණ්ඩය | පීඨය | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂි. | ස.සෞ.වි. | ඉංජි. | ධී.සා.වි හා තා. | මා.ශා හා ස.වි | කළම. | වෛද්‍ය | විද්‍යා. | තාක්ෂණ | |
| සිසුන් බඳවා ගැනීම (නව ඇතුළත් කරගැනීම) | 257 | 142 | 275 | 100 | 471 | 397 | 202 | 430 | 185 | **2459** |
| ඉකුත් වසර හා සැසඳීමේදී ශිෂ්‍ය බඳවාගැනීමේ ප්‍රතිශතයේ වැඩිවීම (%) | 15.2 | 25.4 | 9.09 | 28 | -2.3 | 0.5 | - | 14.2 | 1.62 | **7.89** |
| සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව | 812 | 459 | 971 | 298 | 1632 | 1379 | 1066 | 1186 | 560 | **8363** |

## ශිෂ්‍ය ඇතුළත් කරගැනීම් – පසුගිය වසර 5

| පීඨය | ශිෂ්‍ය ඇතුළත් කරගැනීම | | | | |
|---|---|---|---|---|---|
| | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| කෘෂිකර්ම | 830 | 972 | 780 | 784 | 812 |
| සම සෞඛ්‍ය විද්‍යා | 312 | 441 | 324 | 358 | 459 |
| ඉංජිනේරු | 1150 | 1120 | 894 | 915 | 971 |
| ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ. | 148 | 253 | 212 | 239 | 298 |
| මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා. | 1684 | 2062 | 2093 | 2025 | 1632 |
| කළමනාකරණ | 1502 | 1802 | 1591 | 1298 | 1379 |
| වෛද්‍ය | 945 | 1001 | 1004 | 1226 | 1066 |
| විද්‍යා | 890 | 1310 | 1025 | 1085 | 1186 |
| තාක්ෂණ | - | 269 | 444 | 425 | 560 |
| **එකතුව** | **7461** | **9230** | **8367** | **8355** | **8363** |

## අධ්‍යයන වර්ෂය අනුව පීඨයන්හි ශිෂ්‍ය ව්‍යාප්තිය

| පීඨය | උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වැනි වසර | පස්වැනි වසර | පස්වැනි වසර | එකතුව |
| කෘෂිකර්ම | 257 | 191 | 225 | 139 | - | - | **812** |
| සම සෞඛ්‍ය විද්‍යා | 142 | 102 | 105 | 65 | - | - | **414** |
| ඉංජිනේරු | 275 | 248 | 224 | 224 | - | - | **971** |
| ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ. | 100 | 63 | 74 | 61 | - | - | **298** |
| මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා. | 471 | 476 | 445 | 240 | - | - | **1632** |
| කළමනාකරණ | 397 | 391 | 309 | 282 | - | - | **1379** |
| වෛද්‍ය | 202 | 191 | 187 | 156 | 169 | 161 | **1066** |
| විද්‍යා | 430 | 355 | 323 | 78 | - | - | **1186** |
| තාක්ෂණ | 185 | 143 | 115 | 117 | - | - | **560** |

## ශිෂ්‍ය කටයුතු සම්බන්ධ පත්වීම්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| විනය නිලධාරී | 01 |
| නියෝජ්‍ය විනය නිලධාරී | 07 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක | 01 |
| ශිෂ්‍ය උපදේශක | නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන් 5 ක් ඇතුළුව 68 කි. |
| අධ්‍යයන ප්‍රතිපාලක | 11 |
| අධ්‍යයන උප ප්‍රතිපාලක | 19 |
| **එකතුව** | **107** |

# 2020 වසර තුළ සැපයූ නේවාසිකාගාර පහසුකම්

| පිහිටීම | ශාලාවේ නම | කාමර සංඛ්‍යාව | නවාතැන් පහසුකම් ලැබූ ශිෂ්‍යයන් | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | එකතුව |
| වැල්ලමඩම | වැල්ලමඩම 01 කාන්තා නේවාසිකාගාරය | 47 | - | 93 | 93 |
| | වැල්ලමඩම 02 කාන්තා නේවාසිකාගාරය | 53 | - | 420 | 420 |
| | වැල්ලමඩම 03 කාන්තා නේවාසිකාගාරය | 51<br>Sick Room : 02 | - | 311 | 311 |
| | එළියකන්ද නව කාන්තා නේවාසිකාගාරය | 99 | - | 178 | 178 |
| | එළියකන්ද පැරණි කාන්තා නේවාසිකාගාරය | 54 | - | 171 | 171 |
| | පඹුරන 02 කාන්තා නේවාසිකාගාරය | 11 | - | 9 | 9 |
| | එළියකන්ද නව පිරිමි නේවාසිකාගාරය | 99 | 142 | - | 142 |
| | එළියකන්ද පැරණි පිරිමි නේවාසිකාගාරය | 15 | 1 | - | 1 |
| | මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය | 67 | 226 | - | 226 |
| | වලව්වත්ත භික්ෂු නේවාසිකාගාරය | 23 | 45 | - | 45 |
| ඉංජිනේරු පීඨය හපුගල | පිරිමි ළමුන්ගේ නේවාසිකාගාරය C (පිරිමි) | 103 | 386 | - | 386 |
| | පිරිමි ළමුන්ගේ නේවාසිකාගාරය D (පිරිමි) | 94 | 324 | - | 324 |
| | ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරය A (කාන්තා) | 23 | - | 128 | 128 |
| | ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරය B (කාන්තා) | 16 | - | 64 | 64 |
| වෛද්‍ය පීඨය | ස්ටෙක්මෝ හවුස් කාන්තා නේවාසිකාගාරය | 85 | - | 170 | 170 |
| | කුවේට් කාන්තා නේවාසිකාගාරය | 102 | - | 204 | 204 |
| | නව කාන්තා නේවාසිකාගාරය (ස්ත්‍රී) | 10 | - | 58 | 58 |
| | කුවේට් පිරිමි නේවාසිකාගාරය | 102 | 153 | - | 153 |
| | පිරිමි නේවාසිකාගාරය | 9 | 37 | - | 37 |
| කෘෂිකර්ම පීඨය | සමූහ නේවාසිකාගාර අංක1 (ස්ත්‍රී) | 5 | - | 29 | 29 |
| | සමූහ නේවාසිකාගාර අංක2 (ස්ත්‍රී) | 5 | - | 19 | 19 |
| | සමූහ නේවාසිකාගාර අංක3 (ස්ත්‍රී) | 5 | - | 26 | 26 |

| පිහිටීම | ශාලාවේ නම | කාමර සංඛ්‍යාව | නවාතැන් පහසුකම් ලැබූ ශිශ්‍යයන් | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | එකතුව |
| කෘෂිකර්ම පීඨය | සමූහ නේවාසිකාගාර අංක 4 (කාන්තා) | 5 | - | 21 | 21 |
| | ඒකක නේවාසිකාගාර අංක 5 (කාන්තා) | 5 | - | 41 | 41 |
| | ඒකක නේවාසිකාගාර අංක 6 (කාන්තා) | 5 | - | 40 | 40 |
| | නව නේවාසිකාගාරය (කාන්තා) | 99 | - | 380 | 380 |
| | සමූහ නේවාසිකාගාර අංක 1 (පිරිමි) | 5 | 25 | - | 25 |
| | සමූහ නේවාසිකාගාර අංක 2 (පිරිමි) | 5 | 13 | - | 13 |
| | සමූහ නේවාසිකාගාර අංක 3 (පිරිමි) | 5 | 30 | - | 30 |
| | සමූහ නේවාසිකාගාර අංක 4 (පිරිමි) | 5 | 31 | - | 31 |
| | ඒකක නේවාසිකාගාර අංක 1 (පිරිමි) | 11 | 28 | - | 28 |
| | ඒකක නේවාසිකාගාර අංක 2 (පිරිමි) | 11 | 09 | - | 09 |
| | ඒකක නේවාසිකාගාර අංක 3 (පුරුෂ) | 11 | 32 | - | 32 |
| | ඒකක නේවාසිකාගාර අංක 4 (පිරිමි) | 11 | 28 | - | 28 |
| තාක්ෂණවේද පීඨය | සරසවි මැදුර පිරිමි නේවාසිකාගාරය | 99 | 371 | - | 371 |
| | සරසවි මැදුර කාන්තා නේවාසිකාගාරය | 99 | - | 192 | 192 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | ගොඩකන්ද පිරිමි නේවාසිකාගාරය (කුලී) | 9 | 43 | - | 43 |
| | ලබුදුව නව කාන්තා නේවාසිකාගාරය | 8 | - | 41 | 41 |
| | ලබුදුව පැරණි කාන්තා නේවාසිකාගාරය | 21 | - | 46 | 46 |

## නේවාසිකාගාර පහසුකම් (පීඨ අනුව)

| පීඨය | ශිෂ්‍ය සංඛ්‍යාව | | | ශිෂ්‍ය සංඛ්‍යාව | නේවාසිකාගාර පහසුකම් සැපයූ ශිෂ්‍යාන්ගේ % |
|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | එකතුව | | |
| කෘෂිකර්ම | 196 | 556 | 752 | 812 | 92.61% |
| සම සෞඛ්‍ය විද්‍යා | 43 | 87 | 130 | 459 | 28.32% |
| ඉංජිනේරු | 710 | 192 | 902 | 971 | 92.89% |
| යී හා සා.වි. හා තා. | 119 | 130 | 249 | 298 | 83.55% |
| මා.ශා .සහ ස.වි. | 86 | 464 | 550 | 1632 | 33.70% |
| කළමනාකරණ | 57 | 308 | 365 | 1379 | 26.46% |
| වෛද්‍ය | 153 | 352 | 505 | 1066 | 47.37% |
| විද්‍යා | 152 | 280 | 432 | 1186 | 36.42% |
| තාක්ෂණ | 371 | 192 | 563 | 560 | 100.53% |
| **එකතුව** | **1887** | **2561** | **4448** | **8202** | **54.23%** |

## මූල්‍ය ආධාර

මහපොළ, ශිෂ්‍යාධාර සහ අනෙකුත් ශිෂ්‍යත්ව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව

| පීඨය | මහපොළලාභීන් සංඛ්‍යාව | ශිෂ්‍යාධාර ලැබූ සංඛ්‍යාව | අනෙකුත් ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | ශිෂ්‍ය ගහණය | ශිෂ්‍යත්වයක් ලැබූ ශිෂ්‍යාන්ගේ % |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම | 250 | 277 | 8 | 812 | 65.89 |
| සම සෞඛ්‍ය විද්‍යා | 109 | 156 | 5 | 459 | 58.52 |
| ඉංජිනේරු | 458 | 28 | 2 | 971 | 50.26 |
| යී හා සා.වි. හා තා. | 58 | 110 | - | 298 | 56.38 |
| මා.ශා .සහ ස.වි. | 1044 | 347 | 26 | 1632 | 86.83 |
| කළමනාකරණ | 883 | 245 | 25 | 1379 | 83.61 |
| වෛද්‍ය | 471 | 60 | 54 | 1066 | 54.88 |
| විද්‍යා | 294 | 456 | 21 | 1186 | 65.01 |
| තාක්ෂණ | 379 | 72 | 5 | 560 | 81.43 |
| **එකතුව** | **3946** | **1751** | **146** | **8363** | **69.87** |

## ශිෂ්‍ය සංගම් හා සමිති

| කාණ්ඩය | පීඨය | | | | | | | | | පොදු සංගම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂි | ස.සෞ.වි. | ඉංජී. | ධී.සා.වි. තා | මා.ශා.ස හ ස.වි. | කළම. | වෛද්‍ය. | විද්‍යා. | තාක්ෂණ. | | |
| ශිෂ්‍ය සංගම් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | - | **09** |
| විෂය ආශ්‍රිත හා අනෙකුත් සමිති සංඛ්‍යාව | 04 | - | 12 | 04 | 08 | 03 | 02 | 13 | - | 03 | **49** |

## සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය

* කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ උපාධි ප්‍රදානෝත්සවය 2021 මාර්තු 26 දක්වා කල් තබන ලදී.

# කොටස V – ප්‍රාග්ධන ප්‍රදාන අරමුදල් බෙදාහැරීම

**ප්‍රාග්ධන වියදම් 2016 – 2020**

| වැය ශීර්ෂ විස්තර | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණුකිරීම | 180,077,813 | 198,025,863 | 189,318,593 | 105,937,734 | 70,284,007 |
| ස්ථාවර වත්කම් අත්කරගැනීම | 353,651,161 | 379,938,850 | 240,754,338 | 126,307,630 | 202,255,538 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 453,819,220 | 388,292,469 | 856,316,366 | 81,364,572 | 836,086,912 |
| මානව ප්‍රාග්ධනය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති | 1,465,400 | 2,972,524 | 4,720,832 | 2,898,105 | 794,610 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම | 7,699,874 | 18,052,145 | 6,873,230 | 8,399,894 | 3,064,759 |
| **මුළු ප්‍රාග්ධන වියදම් එකතුව** | **996,713,468** | **987,281,851** | **1,297,983,360** | **324,907,935** | **1,112,485,826** |

## 2020 දෙසැම්බර් 31 දිනට සිදුකරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති

| ව්‍යාපෘති නාමය | පිහිටීම | TCE වටිනාකම | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වෛද්‍ය පීඨය සඳහා දොළොස් මහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, භාවිතයට සුදුසු තත්වයට පත්කිරීම සහ නිමා කිරීම සහ නඩත්තුව | කරාපිටිය, ගාල්ල | මිලියන 1,179.7 | 09.09.2020 - 08.09.2021 | 20% |
| වෛද්‍ය පීඨය සඳහා නව දස මහල් මහාචාර්ය වාට්ටු සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, භාවිතයට සුදුසු තත්වයට පත්කිරීම සහ නිමා කිරීම සහ නඩත්තුව | කරාපිටිය, ගාල්ල | මිලියන 1,300 | 15.12.2019 - 14.06.2022 | 55% |
| ඉංජිනේරු පීඨයේ, නාවික අධ්‍යයන සහ නැව් කටයුතු සහ ඉංජිනේරු වැඩහළේ දක්ෂිණ මධ්‍යස්ථානය සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සහ නිමාකිරීම | හපුගල, ගාල්ල | මිලියන 943 | 2019- 31.07.2021 | 20% |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදිකිරීම (අදියර 1) | වලහන්දුව, ගාල්ල | මිලියන 1,660 | 03.12.2020- 02.06.2023 | 16% |
| කරාගොඩ, උයන්ගොඩ, කඹුරුපිටිය තාක්ෂණ පීඨය සඳහා තෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, භාවිතයට සුදුසු තත්වයට පත්කිරීම සහ නිමා කිරීම (ගෘහ භාණ්ඩ ඇතුළුව) සහ නඩත්තුව- AHEAD ව්‍යාපෘතිය මගින් අරමුදල් සැපයේ. | කරගොඩ, උයන්ගොඩ | මිලියන 421.26 | 21.06.2019- 20.12.2021 | 45% |

| ව්‍යාපෘති නාමය | පිහිටීම | TCE වටිනාකම | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ සහිතව තාක්ෂණවේද පීඨයේ ශිෂ්‍ය ආපන ශාලාව ඉදිකිරීම | කරගොඩ, උයන්ගොඩ | මිලියන 53 | උපදේශක තේරීම අවසන් කර ඇත. ඉදිකිරීම මෙතෙක් ප්‍රදානය කර නොමැත | 3% (උපදේශක තේරීම අවසන් කර ඇත.) |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- ආරාධිතයන්ගේ නිවස්න | වැල්ලමඩම , මාතර | මිලියන 400.42 | 11.08.2020 - 07.02.2021 | 75% |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- ශාරීරික අභ්‍යාස පුහුණු ශාලාව | වැල්ලමඩම , මාතර | | 26.08.2020- 06.06.2021 | 16% |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- පරිපාලන ගොඩනැගිල්ල | වැල්ලමඩම , මාතර | | 11.08.2020- 07.02.2021 | 15% |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- තනිකඩ නිල නිවාස | වැල්ලමඩම , මාතර | | ප්‍රසම්පාදන ක්‍රියාදාමය සිදුකරමින් පවතී | 12% |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- පුස්තකාල ගොඩනැගිලි | වැල්ලමඩම , මාතර | | ප්‍රසම්පාදන ක්‍රියාදාමය සිදුකරමින් පවතී | 0% |
| කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ ගොඩනැගිලි සංකීරණය (දෙවන අදියර) | වැල්ලමඩම , මාතර | මිලියන 276.40 | 19.10.2017- 31.03.2021 | 78% |

| ව්‍යාපෘති නාමය | පිහිටීම | TCE වටිනාකම | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| රුහුණ විශ්වවිද්‍යාලයේ CSL-CER ගොඩනැගිල්ල සඳහා රැඳවුම් බැම්ම සහ කාණු පද්ධතිය ඉදිකිරීම (CSL-CER ව්‍යාපෘති අරමුදල්) | වැල්ලමඩම , මාතර | මිලියන 26.60 | 2020.12.02- 2021.03.01 | 15% |
| විශ්වවිද්‍යාල නාගරිකය සංවර්ධන ව්‍යාපෘතිය | වැල්ලමඩම , මාතර | මිලියන 556.60 | මෙතෙක් ප්‍රදානය කර නොමැත | |

# කොටස VI – පීඨ වාර්තා

## කෘෂිකර්ම පීඨය

### පීඨාධිපතිගේ ප්‍රකාශනය

ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසර අභියෝගවලින් පිරි වසරක් විය. 2020 මාර්තු සිට 2020 මැයි දක්වා රට අගුලු දැමීමේ තත්ත්වයක පැවැති අතර ඒ හේතුවෙන් රුහුණ විශ්වවිද්‍යාලය ද වසා දැමුණු අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්වවිද්‍යාලය වෙත පැමිණීමට අවසර හිමි නොවුණි.

කෙසේවෙතත් මාර්ගගත ක්‍රමවේදය යොදා ගනිමින් සිසුන් සඳහා දේශන පවත්වනු ලැබීය. විශ්වවිද්‍යාලය නැවැත විවෘත කිරීමෙන් පසුව දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් සාමාන්‍ය කාලසටහනට අනුව දේශන සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකරන ලදී. තාක්ෂණයෙන් සබල කරන ලද සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් අවශ්‍යතාවය පැන නැගුණි. එක් අධ්‍යයන වාරයක කටයුතු සූම් දේශන තාක්ෂණය යොදාගනිමින් පැවැත්වූ අතර තවත් අධ්‍යයන වාරයක කටයුතු ද ඒ අන්දමින් සිදුකරමින් පවතී. අවසන් වසරේ සිසුන් සඳහා කර්මාන්ත පුහුණු වැඩසටහන අවලංගු කරන ලද අතර කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ (ARMT) සහ කෘෂිව්‍යාපාර කළමනාකරණ (AB) ශිෂ්‍යයන් සඳහා ද එම පුහුණුව අවලංගු කරන ලදී. නමුත් හරිත තාක්ෂණවේද (GT)) ශිෂ්‍යයන් කර්මාන්ත පුහුණුව සාර්ථකව නිමා කරනු ලැබූ අතර ඔවුන්ගේ ඇගයීම් ද සම්පූර්ණ කරන ලදී. කර්මාන්ත පුහුණු වැඩසටහන වෙනුවට සිය අවසන් වසරේ පර්යේෂණ සංරචකය ආරම්භ කරන ලෙස කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ සහ කෘෂිව්‍යාපාර කළමනාකරණ ශිෂ්‍යයන් හට දැනුම් දෙනු ලැබීය.

ඒ අනුව, කෘෂිකර්ම යන්ත්‍රෝපකරණ මෙහෙයුම් තාක්ෂණවේද ඩිප්ලෝමාව (DAMOT) ආරම්භ කිරීමට පීඨය කටයුතු කරමින් සිටියි. කෘෂි ව්‍යවසායකත්වය සහ ලාභදායී ගෙවතු වගාව, අපනයන ඉලක්කගත භෝග විද්‍යාත්මකව වගාකිරීම, නාගරික කෘෂිකර්මාන්තය සහ ඛාද්‍ය ගෙවතු වගාව දුරස්ථ ක්‍රමවේදය මගින් පැවැත්වීමට නියමිත ප්‍රධාන පාඨමාලා වේ.

යුරෝපීය සංගම් ප්‍රදානය මගින් අරමුදල් සපයන බ්‍රිටේ (BRITAE) ව්‍යාපෘතිය යටතේ සුහුරු කෘෂි පාරිසරික පද්ධති පාදක ප්‍රත්‍යාස්ථිති මධ්‍යස්ථානය (අති නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂන පහසුකම්වලින් සමන්විත සියලු උපකරණ සහිත නවීන සම්පත් මධ්‍යස්ථානය) ස්ථාපිත කිරීම යෝජනා වී තිබේ.

වැඩසටහන් සමාලෝචනයේදී මනා කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමට පීඨය සමත් වූ අතර කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ සහ හරිත තාක්ෂණ උපාධි වැඩසටහන් සඳහා "A" ශ්‍රේණිය ද කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ උපාධි වැඩසටහන සඳහා "B" ශ්‍රේණිය ද ලබා ගැනීමට හැකි විය.

මගේ අදහස වනුයේ 2020 වසර තුළ මතුවූ අභියෝගයන්ට පීඨය සාර්ථකව මුහුණ දුන් බවයි. පීඨයේ එවැනි කාර්ය මණ්ඩලයක් හා ශිෂ්‍යයන් සමග කටයුතු කිරීමට ලැබීම ගැන මම ආඩම්බර වන්නෙමි.

### පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | ළමා මන්දපෝෂණය පිළිබඳව සෞඛ්‍ය විද්‍යා ගුරුවරුන් පුහුණු කිරීම | දකුණ, උතුරු මැද සහ සබරගමුව පළාත්වල සෞඛ්‍ය විද්‍යා ගුරුභවතුන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/ විෂය වැඩිදියුණු කිරීම්) | පීඨය මෑතකාලීන විෂයමාලා සංශෝධනය සඳහා සක්‍රීය දායකත්වය සැපයූ අතර උපාධි අපේක්ෂකයන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් පවත්නා පාඨමාලා සංශෝධනය කරන ලදී. | කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ වැඩසටහනේ උපාධි අපේක්ෂකයන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/ විෂය වැඩිදියුණු කිරීම්) | සත්ත්ව විද්‍යා විශේෂිකරණ මොඩියුලයට නව පාඨමාලා දෙකක් හඳුන්වා දෙන ලදී. (සත්ත්ව විද්‍යාවේ විස්තෘත නිබන්ධන සහ තිරසර පශු සම්පත් නිෂ්පාදන පද්ධති) | පශු විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | නාගරික සංවර්ධන අමාත්‍යාංශය, ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය ඒකාබද්ධව සංවිධානය කළ ආහාර නාස්තිය අඩුකිරීම හා වැළැක්වීම පිළිබඳ ඩිජිටල් උපදේශනය<br><br>උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සම පාලක විභාග පරීක්ෂකවරයකු ලෙස සහභාගි වන ලදී.<br><br>කෘෂිකර්ම පීඨයේ පාංශු විද්‍යා අධ්‍යනාංශය විසින් සංවිධානය විසින් තාක්ෂණ නිලධාරීන් වෙනුවෙන් 2020 සැප්තැම්බර් 21 සහ 22 දින පවත්වනු ලැබූ සේවාස්ථාන සුරක්ෂිතතාව සඳහා උපකරණ සැපයීම සහ විද්‍යාගාර පරිපාටි පිළිබඳ (නවීන පරිගණක හා ඒ ආශ්‍රිත කරුණු) දෙදින පුහුණු වැඩමුළුවේ සම්පත් දායකයකු ලෙස කටයුතු කරන ලදී.<br><br>ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරනු ලැබූ "සහසක් නිමවුම් 2020" ජාතික මාර්ගගත නවොත්පාදන හා නව්‍යකරණ තරහයේ ජූරි මණ්ඩල සභිකයකු ලෙස කටයුතු කරන ලදී.<br><br>RIC-AHEAD යටතේ තත්කාල ජංගම පාදක තොරතුරු පද්ධතියක් (ගොවි නැණ) වාණිජකරණ කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා නියෝජ්‍ය සම්බන්ධීකාරකයකු ලෙස සේවය පවත්වාගෙන යන ලදී.<br><br>IESLCE ඉංජිනේරු විද්‍යා අධ්‍යයන වැඩසටහනේ මෘදුකාංග ඉංජිනේරු විද්‍යා මොඩියුල EC5005 සඳහා ප්‍රශ්නපත්‍ර ප්‍රමිතිකාරකයකු ලෙස කටයුතු කරන ලදී- උපාධිධාරී ඩිප්ලෝමා මට්ටමේ අවසන් විභාගය<br><br>කෘෂි තාක්ෂණික උපාධි වැඩසටහනේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා ප්‍රශ්නපත්‍ර ප්‍රමිතිකාරකයකු සහ දෙවන විභාග පරීක්ෂකවරයකු ලෙස කටයුතු කරන ලදී- කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය<br><br>ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පරිගණක සාක්ෂරතා අදියර i සහ අදියර iiහි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදී. | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | AHEAD ප්‍රදාන වැඩසටහන යටතේ කෘෂිකර්ම පීඨයේ කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශය විසින් පවත්වනු ලැබූ තාක්ෂණය මගින් සබල කරනු ලැබූ ඉගෙනුම් ඉගැන්වීම් මෙවලම් පිළිබඳ වැඩමුළු මාලාවක සම්පත්දායකයකු ලෙස කටයුතු කරන ලදී. | |
| | ඩයලොග් ඇක්සියාටා සමාගම සමග IoT පාදක සුහුරු කෘෂිකර්මය පිළිබඳ ව්‍යාපෘතිය පවත්වාගෙන යාම. | ජෛවපද්ධති තාක්ෂණවේදය සහ කෘෂිකර්ම විද්‍යා විෂයයන් උගන්වනු ලබන ගුරුභවතුන් සහ හදාරන සිසුන් |
| | ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පරිගණක සාක්ෂරතා අදියර iii සහ අදියර ivහි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදී. | |
| | සත්ත්ව විද්‍යා අධ්‍යනාංශයේ සාමාජිකයන් උසස් පෙළ ගුරු භවතුන් සහ සිසුන් සඳහා ශ්‍රී ලංකා රූපවාහිණිය විකාශය කරනු ලබන ‘‘ගුරුගෙදර’’ අධ්‍යාපන වැඩසටහනට සම්බන්ධ වන ලදී. | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලය සමග සර්මකලාපීය කෘෂිකාර්මික වැඩසටහන | |
| කමිටු සහ ඒවා සම්බන්ධ සාමාජිකයන් ගණන | විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ කමිටුව (සාමාජිකයන් 02) | |
| | විශ්වවිද්‍යාල වෙබ් සංවර්ධන වැඩසටහන (සාමාජිකයන් 01) | |
| | විශ්වවිද්‍යාල තො.තා. කමිටුව යටතේ ජාලගත සේවා අනුකමිටුව (සාමාජිකයන් 01) | |
| | විශ්වවිද්‍යාල තො.තා. කමිටුව යටතේ දෘඪාංග/මෘදුකාංග අනුකමිටුව (සාමාජිකයන් 01) | |
| | පසු අස්වනු තාක්ෂණ ජාතික කමිටුව, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති මණ්ඩලය) | පසු අස්වනු තාක්ෂණ අංශය සංවර්ධනය කිරීම |
| | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන සංසදය | තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | උඩරට එළවලු මධ්‍ය පරිමාණ පොලි ටනල් ගෙවතු වගා ඒකක තුළ පහත රටදී වගා කිරීම සඳහා දැනටමත් සකස් කර ඇති IoT පාදක ආරක්ෂිත නිවස්න ස්වයංකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම පිළිබඳ පර්යේෂණය සඳහා ජාතික විද්‍යා අරමුදලේ ප්‍රදානය | |
| | එරැස්මස් වැඩසටහන ( BRITAE) | සර්මකලාපීය කෘෂි පාරිසරික පද්ධතිවල ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | SECRA | විශ්වවිද්‍යාල කර්මාන්ත හවුල්කාරිත්වය |
| | ඒකකය 4 ප්‍රත්‍යාස්ථිතිය | ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශයේ පේටන්ට් බලපත්‍ර (කාර්මික සැලසුම) අයදුම්පත්‍ර අංකය පේටන්ට් බලපත්‍ර (සැලස්ම) ID LK/I/13361, 08.09.2020<br><br>ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශයේ පේටන්ට් බලපත්‍ර (කාර්මික සැලසුම) අයදුම්පත්‍ර අංකය පේටන්ට් බලපත්‍ර (සැලස්ම) LK/I/13329, 27.08.2020 | |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | කොටපොළ ප්‍රාදේශීය සභාවේ ජල සුරක්ෂිතතාව සහ දේශගුණ විපර්යාස යළි සලකා බැලීම - කොටපොළ ප්‍රදේශයේ ප්‍රජා නායකයන් සඳහා පුරවැසි විද්‍යා වැඩසටහන | සිදුවීමට ආසන්න දේශගුණ ආශ්‍රිත ජල සුරක්ෂිතා ගැටලු සහ ජල සම්පත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සහ ජල දූෂණය අධීක්ෂණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමට නියමිත ජල සංවේදී නායකයන් කණ්ඩායමක් (දේශපාලනඥයන්, සිවිල් සමාජය සහ නිලධාරීන්) හඳුනාගැනීම<br><br>ප්‍රදේශයේ කෘෂිකාර්මික ඵලදායිතාවය කෙරෙහි දේශගුණික විපර්යාසයන්හි බලපෑම හඳුනාගැනීම<br><br>ප්‍රජා නායකයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කිරීම |
| සබැඳි වැඩසටහන් | සකුරා විද්‍යා සැලැස්ම, සෑම වසරකම පවත්වන ජපාන-ආසියා තරුණ හුවමාරු වැඩසටහන, වැඩසටහන සඳහා සහභාගිවීම පිණිස නිත්‍ය පදනමකින් සාමාජිකයන් 8 දෙනෙකු ජපානයේ සංචාරය කරයි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එය මෙම වසරේ මාර්ගගත සැසියක් ලෙස පවත්වන ලදී. රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ කෝබේ විශ්වවිද්‍යාලය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම යටතේ 2020 නොවැම්බර් 11 දිනය පුරාම මාර්ගගත සැසියක් ලෙස වැඩසටහන් පැවැත්වුණි<br><br>ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුම යටතේ ජාත්‍යන්තර කෘෂිකර්ම වැඩසටහනේ 2020 වසර සැසිය 2020 නොවැම්බර් 21 සිට දෙසැම්බර් 19 දක්වා සාර්ථකව පවත්වනු ලැබීය. රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි විද්‍යාතනය මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී. වත්මනෙහි පවතින වසංගත තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන මාර්ගගත දේශනමාලාවක් ලෙස පවත්වනු ලැබීය | කෘෂි ඉංජිනේරු විද්‍යා විශේෂ උපාධිය හදාරන සියලු අවසන් වසරේ සිසුන් (කෘෂි පර්යේෂණ කළමනාකරණ තාක්ෂණ සිසුන් 10 දෙනෙකුද හරිත තාක්ෂණ සිසුන් 19 දෙනෙකු ද සිටී) මේ සඳහා සහභාගි විය. විශ්වවිද්‍යාල තුනක් එනම් ඉන්දුනීසියාවේ බොගොර් විශ්වවිද්‍යාලය, සුමාත්‍රාහි අන්ඩලාස් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය මේ සඳහා සහභාගි විය<br><br>හරිත තාක්ෂණ සහ කෘෂිකර්ම සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලාවේ අවසන් වසරේ සිසුන් 30 දෙනෙකු වැඩසටහන සඳහා සහභාගි විය |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සබැඳි වැඩසටහන් | නිවර්තන කෘෂිකර්මය පිළිබඳ දේශන පැවැත්වීම පිණිස එක්සත් ජනපදය, නෙදර්ලන්තය, මයික්‍රොනීසියා, තායිලන්තය, ඉන්දුනීසියාව, ජපානය සහ ශ්‍රී ලංකාව යන රටවල ප්‍රමුඛ පෙළේ විද්වතුන් පහළොස් දෙනෙකුට ආරාධනා කරනු ලැබිය. (විනාඩි 50ක දේශනයක් සහ විනාඩි 10 ක ප්‍රශ්න හා පිළිතුරු සැසියක්) බොගෝර් කෘෂිකර්ම විශ්වවිද්‍යාලය (ඉන්දුනීසියාව), කොන් කේන් විශ්වවිද්‍යාලය (තායිලන්තය), ඉබරාකි විශ්වවිද්‍යාලය (ජපානය), රුයුක්යුස් විශ්වවිද්‍යාලය (ජපානය), සහ රුහුණ විශ්වවිද්‍යාලයේ (ශ්‍රී ලංකාව) කෘෂිකර්ම පීඨයේ දර්ශනපති හා උපාධි අපේක්ෂක සිසුන් 50 දෙනෙකු පමණ වැඩසටහන සඳහා සහභාගි විය<br><br>“ශ්‍රී ලංකාවේ සහස්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳ තත්ත්වය” පිළිබඳ දේශනයක් පවත්වන ලදී<br><br>“ශ්‍රී ලංකාවේ සැබෑ කුරුඳු” පිළිබඳ දේශනයක් පවත්වන ලදී<br><br>ජාත්‍යන්තර කෘෂිකර්ම වැඩසටහන 2020 සඳහා “ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය: ප්‍රතිපත්ති සහ උපායමාර්ග” මැයෙන් දේශනයක් පවත්වන ලදී<br><br>ඒකක 4 ප්‍රත්‍යාස්ථීනිය<br><br>BECK<br><br>එරස්මස් + | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 11 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 01 |
| දේශීය සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 04 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ නිබන්ධන | 01 |
| වාචික ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 32 |
| පෝස්ටර් ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 03 |
| පොත් | 01 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 04 |
| සංස්කරණ කාර්යය | 14 |
| **එකතුව** | **71** |

## සම සෞඛ්‍ය විද්‍යා පීඨය

### පීඨාධිපතිගේ ප්‍රකාශනය

නව පීඨ සංකීර්ණයක් සඳහා 2020 දෙසැම්බර් 10 වන දින මුල්ගල තැබූ බැවින් 2020 වසර පීඨ ඉතිහාසයේ සුවිශේෂී වසරක් ලෙස සටහන් වුණි. කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම්වලට බලපෑමක් ඇති වුවද, නව තාක්ෂණය යොදාගනිමින් ශාස්ත්‍රීය සහ අනෙකුත් ආශ්‍රිත ක්‍රියාකාරකම් සාර්ථකව පැවැත්වීමට සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හැකි වුණි.

රජයේ උපදෙස් පරිදි සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2020 මාර්තු 16 දින සියලු කටයුතු අත්හිටුවන ලදී. සූම් තාක්ෂණයේ අධාරයෙන් සියලු අධ්‍යනාංශ දේශන සහ නිබන්ධන පන්ති 2020 අප්‍රේල් 20 වන දින සිට අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. අධ්‍යයන කටයුතු සාර්ථකව නිමාකිරීමෙන් පසුව පීඨය පහත දැක්වෙන විභාග පවත්වනු ලැබීය.

<u>වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය</u>

වසර අවසාන විභාගය - 4 වන වසර - 2014/2015 (08වැනි) කාණ්ඩය (18/12/2020 - 13/01/2021)
වසර අවසාන විභාගය - 2 වන වසර - 2016/2017 (10 වැනි) කාණ්ඩය (17/11/2020 - 03/12/2020)
වසර අවසාන විභාගය - 2 වන වසර - 2017/2018 (11 වැනි) කාණ්ඩය (24/08/2020 - 02/09/2020)

<u>හෙද විද්‍යා අධ්‍යනාංශය</u>

| | |
|---|---|
| 3වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 10 වන කාණ්ඩය (10.12.2019 - 09.01.2020) |
| 5වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 09 වන කාණ්ඩය (14.01.202 |
| 7වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 08 වන කාණ්ඩය (27.01.2020) |
| 2වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 11 වන කාණ්ඩය (06.10.2020 - 21.10.2020) |
| 4වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 10 වන කාණ්ඩය (18.11.2020 - 03.11.2020) |
| 6වන අධ්‍යයන වාර අවසාන විභාගය | - 09 වන කාණ්ඩය (15.12.2020 - 23.12.2020) |

<u>ඖෂධවේද අධ්‍යනාංශය</u>

| | |
|---|---|
| සිව්වැනි ඖෂධවේද උපාධිය - කොටස II | -06වන කාණ්ඩය (29.06.2020 – 10.08.2020) |
| තෙවැනි ඖෂධවේද උපාධිය - කොටස II | -07වන කාණ්ඩය(29.08.2020 – 07.09.2020) |
| දෙවන ඖෂධවේද උපාධිය - කොටස II | -08වන කාණ්ඩය (08.09.2020 – 18.09.2020 |
| පළමු ඖෂධවේද උපාධිය - කොටස II | -09වන කාණ්ඩය (23.09.2020 – 06.10.2020) |
| පළමු ඖෂධවේද උපාධිය - කොටස I | -10වන කාණ්ඩය (16.11.2020 – 27.11.2020) |

මීට අමතරව, නොකඩවා තෙවන වසරටත් පීඨයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය වන RuFARS – 2020 සාර්ථකව පැවැත්වීමට සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හැකි වුණි. මෙම වසරේ අප උද්ධෘත 64ක් ( වාඩික 29 සහ පෝස්ටර් 35) ක් ප්‍රකාශයට පත්කරන ලදී.

2021 මාර්තු 21 දින පැවැත්වීමට නියමිත 18 වන ශාස්ත්‍රීය සැසි සහ 17 වන උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවයේ සම සත්කාරකත්වය දැරීමේ අවස්ථාව සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හිමි වුණි.

තවද, තායිලන්තයේ චුලාබෝර්න් උපාධි ආයතනය සහ ජපානයේ අන්තර්ජාතික සීමාවාසී උපද්ශන සේවාවේ ආසියානු සංවර්ධන මධ්‍යස්ථාන සංගමය (ADCA) සමග අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් තැබීම පිණිස පීඨය විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමතිය අපේක්ෂාවෙන් සිටී.

පීඨයේ 12වන ශිෂ්‍ය කාණ්ඩයේ සමාරම්භක උත්සවය 2020.02.19 දින පැවැත්වූ අතර වත්මනෙහි ඔවුන් සිය අදාළ අධ්‍යයන වාරයන්හි කටයුතු කරමින් සිටී.

2020 වසර තුළ පීඨය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් පවත්වනු ලැබීය.

**<u>පරිපාලන තනතුරු</u>**

අපගේ ආචාර්යවරු විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන පරිපාලන තනතුරු ලබා ගන්නා ලදී.
**ප්‍රධානී, ඖෂධවේද අධ්‍යනාංශය** - කේ.ඒ. තේ.ඩී. විජේසේකර මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඖෂධවේද අධ්‍යනාංශය)

**<u>උසස්වීම්</u>**

අප ආචාර්යවරුන් පහත පරිදි උසස්වීම් ලබාගන්නා ලදී.

**මහාචාර්ය**

ආචාර්ය ඉමේන්ද්‍ර කොටපොල මයා- හෙදවිද්‍යා අධ්‍යනාංශය

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය**

ආචාර්ය ඩබ්.වී.ආර්.ටී.ජී. බණ්ඩාර මයා - වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය එච්.එච්. පීරිස් මයා - වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය එස්.කේ. හෙට්ටිහේවා මයා - ඖෂධවේද අධ්‍යනාංශය

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය**

ආචාර්ය එච්.ඩබ්ලිව්.ඒ.එස් . සුබසිංහ මයා- ඖෂධවේද අධ්‍යනාංශය
කේ.කේ.පී.එම්.කේ. ද සිල්වා මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය
එම්.ඩබ්ලිව්. කේ. ගමගේ මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය
එච්.ජේ.එච්. මධුශාන්ති මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය
අචාාචාර්ය - එස්.එම්ඩි.ඩී. සුන්දරපෙරුම මයා - හෙදවිද්‍යා අධ්‍යනාංශය

**කථිකාචාර්ය (ස්ථිර)**

ආචාර්ය ආර්.එච්.එම්.පී.එන්. රත්නායක මයා - හෙදවිද්‍යා අධ්‍යනාංශය

**<u>නව බඳවාගැනීම්</u>**

2020 වසර තුළ පහත දැක්වෙන නව සාමාජිකයන් පීඨයට බඳවා ගන්නා ලදී.

ජී.එච්.සී. නදීශානි මිය -සහකාර ලේඛාධිකාරී
එස් ඉරේෂා මිය - සහකාර මූල්‍යාධිකාරී
ඩබ්.එච්.පී. කුමාර - සහකාර ජාල කළමනාකරු

**පීඨ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු**

- වලහන්දුව, වලහනුදුව වතුයායෙන් අක්කර 10ක් අත්කර ගැනීම සඳහා සම සෞඛ්‍ය විද්‍යා පීඨයට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අනුමතිය හිමිවුණි.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨය වලහන්දුවේ ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමේ උත්සවය 2020 දෙසැම්බර් 10 වන දින පැවැත්වුණි.
- උළුවිටකේ පරිශ්‍රයේ පිහිටි වෛද්‍ය විද්‍යාගාර සහ ඖෂධවේද අධ්‍යනාංශ සඳහා LEARN පහසුකම ස්ථාපිත කරන ලදී.

සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම පිණිස 2020 වසරේදී රු. මිලියන 10ක් වැය කරන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | නව උපාධි වැඩසටහන් සකස් කිරීමේ කටයුතු පීඨය ආරම්භ කරන ලදී. | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි |
| සමාජ සේවා | <u>හෙද විද්‍යා අධ්‍යයනාංශය</u><br>පහත දැක්වෙන උපාධි වැඩසටහන් සඳහා විෂයමාලා සංවර්ධයන කිරීම පීඨය ආරම්භ කර තිබේ<br>මහජන සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය (මහජන සෞඛ්‍ය විද්‍යාව, මහජන සෞඛ්‍ය විද්‍යාගාර තාක්ෂණය,මහජන සෞඛ්‍ය කෘමි විද්‍යාව සහ සූනි විද්‍යාව යන ක්ෂෙත්‍ර හතර ආවරණය කරයි)<br>සෞඛ්‍ය තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය (කන්තුක තාක්ෂණවේදය, ස්නායුක විද්‍යා තාක්ෂණවේදය සහ දෘෂ්ටිමිතිය යන ප්‍රධාන ක්ෂෙත්‍ර තුන ආවරණය කරයි)<br>සෞඛ්‍ය අන්තරායණ චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (ප්‍රශ්ලේෂක හා සෘජුවර්තක සහ ව්‍යාවෘතික චිකිත්සාව යන ක්ෂෙත්‍ර දෙක දැනට ආවරණය කරයි | පවුලේ/ප්‍රජාවේ සෞඛ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය ප්‍රවර්ධනය<br>වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි |
| විෂයමාලා සංවර්ධනය | <u>වෛද්‍ය විද්‍යාගාර සේවා අධ්‍යනාංශය</u><br>වත්මනෙහි වෛද්‍ය විද්‍යාගාර සේවා විද්‍යාවේදී උපාධිය අධ්‍යයන වාර ක්‍රමයක් ලෙස පවත්වනු ලැබේ. එබැවින් විෂයමාලා ප්‍රතිශෝධනයත් සමගින් මෙම සම්ප්‍රදායික වාර ක්‍රමය වර්ෂාර්ධ ක්‍රමයක් බවට පරිවර්තනය කරන අතර ප්‍රතිශෝධිත විෂයමාලාව අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ඉදිරිපත් කර ඇත<br><u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u><br>හෙද විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී ගෞරව උපාධියේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාදාමය අධ්‍යනාංශය මේ වන විට සිදුකරමින් පවතියි<br><u>ඖෂධවේද අධ්‍යනාංශය</u><br>ඖෂධවේද උපාධි වැඩසටහනේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාදාමය අධ්‍යනාංශය ආරම්භ කර තිබේ | ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය සඳහා විදේශයන්හි රැකියා සඳහා වැඩි අවස්ථා හිමිවනු ඇතැති පීඨය අපේක්ෂා කරයි |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | CCPDHE පාඨමාලාවේ එක් මොඩියුලයක් සම්බන්ධීකරණය කර තිබේ.<br>අනුරූපණ, විභාග අත්පොත සහ මහජන සබඳතා වැඩමුළුව | අළුතින් බඳවාගත් කාර්යමණ්ඩලය සංවර්ධනය |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | <u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u><br>සම සෞඛ්‍ය විද්‍යා පීඨය සහ සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂ, ගාල්ල අතර ප්‍රජා පර්යේෂණය | දකුණු ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආශ්‍රිත ගැටපු/ සංඛ්‍යාලේඛන හඳුනාගැනීම |

| වැඩසටහන | **ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු** | **ප්‍රතිලාභීන්/ නිමැවුම** |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් විසින් ප්‍රජා සංචාර සිදුකිරීම | සෞඛ්‍ය අධ්‍යාපනය, පවුලේ/ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය |
| | අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් පර්යේෂණ ව්‍යාපෘති | දැනුම ප්‍රචාරණය |
| | **<u>ඖෂධවේද අධ්‍යනාංශය</u>** | සාමාන්‍ය ජනතාව |
| | ශාකසාර ඖෂධ නිෂ්පාදන වාණිජකරණය | |
| ජාත්‍යන්තර සංවර්ධනයේදී දායකත්වය | දේශීය සහ අන්තර්ජාතික සෞඛ්‍යරක්ෂණ අවශ්‍යතාවන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති අධ්‍යනාංශය විසින් සිදුකරන ලදී | |
| | ඊට අමතරව, පීඨයේ වාර්ෂික පර්යේෂණ සමුළුව: RuFARS – 2020 තෙවන අනුගාමී වසරටත් සාර්ථකව පවත්වන ලදී. මෙම වසරේ අප උද්ධෘත 64ක් ( වාඩික 29 සහ පෝස්ටර් 35) ක් ප්‍රකාශයට පත්කරන ලදී | දැනුම ප්‍රචාරණය |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | මෙහෙයුම් කමිටුව - ස.සෞ.වි.පී. 10 | |
| | අධ්‍යයන මණ්ඩලය 11 | |
| | ආචාරධර්ම සමාලෝචන කමිටුව 15 | |
| | පීඨ පර්යේෂණ කමිටුව 10 | |
| | සසෞවිපී-අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටු ඒකකය 12 | |
| | දුක් ගැනවිලි කමිටුව 11 | |
| | විෂයමාලා සංවර්ධන සහ ආචාරධරම කමිටුව 12 | |
| | තාක්ෂණික ඇගයීම් කමිටුව (විද්‍යාගාර උපකරණ) 05 | |
| | තාක්ෂණික ඇගයීම් කමිටුව (ගෘහ භාණ්ඩ) 05 | |
| | **කාර්මික ඇගයීම් කමිටුව (කාර්යාල උපකරණ)** 05 | |
| | දේශන ශාලා කමිටුව 10 | |
| | පුස්තකාල හා තො.තා. කමිටුව 10 | |
| | නේවාසිකාගාර හා ආපනශාලා කමිටුව 10 | |
| | ශිෂ්‍යත්ව කමිටුව 11 | |
| | පීඨ අත්පොත් සංවර්ධන කමිටුව 09 | |
| | ස.සෞ.වි. පීඨයේ වැඩසටහන් සමාලෝචනයේ ස්.අ.වා (SER) සමාලෝචන කමිටුව 08 | |
| | සසෞවි පීඨයේ පීඨාධිපත් උපදේශන කමිටුව 08 | |
| | වෙබ් අඩවි සංවර්ධන කමිටුව 10 | |
| | පීඨ ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණ කමිටුව 07 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>-දේශීය<br>-ජාත්‍යන්තර | **<u>වෛද්‍ය විද්‍යාගාර විද්‍යා අධ්‍යනාංශය</u>**<br>දේශීය<br>ඊ.ඩබ්. සිල්වා මියට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් රුත මිලියන 1.5 ක පර්යේෂණ ප්‍රදානයක් ලැබුණි | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/පේටන්ට බලපත්‍ර/ විශේෂ සාධන | <u>වෛද්‍ය විද්‍යාගාර විද්‍යා අධ්‍යනාංශය</u><br><br>කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ 2020 වාර්ෂික අධ්‍යයන සැසිවලදී පී. විජේවර්ධන මියට දෙවන ස්ථානය සඳහා සම්මානය හිමි විය<br><br>එස්. මහකුමාර, කේ.බී. ගුණවර්ධන සහ සම්පත් ගුණවර්ධන, ගාල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල ළමුන් පිටේ එල්ලා ගෙන යන මලුවල බර සහ ගුණාත්මකබව පිළිබඳ ඇගයීම, RuFARS – 2020 හි සිදුකළ පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා කුසලතා සම්මානය | කාර්යමණ්ඩලයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම |
| පවත්වන ලද වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්මේලන (ජාත්‍යන්ර හා දේශීය) | මහාචාර්ය කේ.කේ.ඒ.එස්. යාපා මහතා පැවැත්වූ විෂයමාලා සකස්කිරීම පිළිබඳ වැඩමුළුව, 2020 මැයි 28<br><br>මහාචාර්ය ටී.පී.ඩී. ගමගේ මහතා පැවැත්වූ විභාග අත්පොත වැඩමුළුව, 2020 ජූනි 15<br><br>ආචාර්ය ඒ.බී. සිරිසේන මහතා පැවැත්වූ SWOT විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව, 2020 ජූනි 22<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති නිශාන්ත ගමගේ මහතා පැවැත්වූ තොරතුරු සම්පත් පිළිබඳ වැඩමුළුව, 2020.06.02<br><br>මහාචාර්ය කේ.කේ.ඒ.එස්. යාපා මහතා විසින් පවත්වන ලද ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ වැඩමුළුව , 2020 ජූලි 20<br><br>RuFARS – 2020 රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨයේ පර්යේෂණ සමුළුව, 2020.10.02 -දේශීය<br><br>මහජන සෞඛ්‍ය විද්‍යාව, මහජන සෞඛ්‍ය විද්‍යාගාර තාක්ෂණය සහ මහජන සෞඛ්‍ය කෘමි විද්‍යාව -2020.01.24<br><br>මහජන සෞඛ්‍ය විද්‍යාගාර තාක්ෂණය- 2020.02.12<br><br><u>වෛද්‍ය විද්‍යාගාර විද්‍යා අධ්‍යනාංශය</u><br><br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.කේ බී. මුද්දුව, මහාචාර්ය ඒ ද එස් නාගහවත්ත, ආචාර්ය කේ.ඒ.සී. වික්‍රමරත්න සහ ආචාර්ය අයි.ඩී. සිරිවර්ධන සම්පත් දායකයන් ලෙස 2020 ජූලි 07 වන දින පවත්වන ලද සිව්වැනි වසරේ වැඩ පාදක වැඩමුළුව<br><br>නව පාඨමාලා ඒකකයක් සැලසුම්කිරීම පිළිබඳ වැඩමුළුව ‘‘වෛද්‍යා විද්‍යාගාර සඳහා උපකරණ සම්පාදනය’’, 2020 සැප්තැම්බර් 25 වන දින<br><br>එක්සත් රාජධානියේ වුල්වහැම්ප්ටන් විශ්වවිද්‍යාලයේ විදේශීය සම්පත් දායකයන් ලෙස පවත්වන ලද සායනික ඖෂධවේද වැඩමුළුව, ඖෂධවේද අධ්‍යනාංශය | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි<br><br>පවතින විෂයමාලාව සංශෝධනය කර වාර ක්‍රමය වරඟාර්ධ ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලදී<br><br>කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සබැඳි වැඩසටහන් | **<u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u>**<br>හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා සීමාවාසික වැඩසටහනක් ආරම්භ කිරීම පිණිස ජපානයේ ඔසාකාහි අන්තර්ජාතික සීමාවාසිකත්ව උපදේශන සේවාවේ ආසියා සංවර්ධන මධ්‍යස්ථාන සංගමය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවිද්‍යා අධ්‍යනාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී | |
| | ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටැඩ් විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් රුහුණ විශ්වවිද්‍යාලය (හෙදවිද්‍යා අධ්‍යනාංශය, සම සෞඛ්‍ය පීඨය) ඇතුළුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පහක් විත්ත විකෂේපය පිළිබඳ විද්‍යා විද්‍යාපති උපාධියක් ආරම්භ කරන ලදී | පවත්නා විෂය මාලාව සංශෝධනය කර කාලීන ක්‍රමය අධ්‍යයන වාරය දක්වා වෙනස් කරන්න |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 13 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 07 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 42 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 06 |
| පොත් | 01 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 17 |
| සංස්කරණ කාර්යය | RuFARS 2020 සංස්කරණ මණ්ඩල සාමාජික |
| **එකතුව** | **90** |

# ඉංජිනේරු පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

2020 වසර තුල කොවිඩ් වසංගත තත්ත්වය උත්සන්න වීම සහ රජය විසින් පැනවූ නිති හා රෙගුලාසි හේතුවෙන් පීඨයේ සැලසුම් වෙනස් කිරීමට සිදුවිය. 2019 ජනවාරි 1 වනදා සිට පීඨාධිපති ලෙස කටයතු කරන සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එච්.පී.සූරියආරච්චි මහතාගේ නායකත්වය යටතේ පීඨය සිය කටයුතු පවත්වා ගෙන යන ලදී.

ශිෂ්‍යයන් 275කින් සමන්විත 21වන ශිෂ්‍ය කාණ්ඩය 2020 මැයි 13 වැනි දින මාර්ගගතව පැවැති සරල සමාරම්භක උත්සවයක් සමග පීඨයට ඇතුලත් කරගන්නා ලද අතර ඔවුන්ගේ සංවර්ධන වැඩසටහන් මාර්ගගතව ආරම්භ කරන ලදී. පෙර වසර සැලකිල්ලට ගැනීමේදී 2018 උසස් පළෙ විභාගයේ ප්‍රතිඵල අනුව වැඩිපුර සිසුන් 25 දෙනෙකු බඳවා ගන්නා ලදී. 2019 උසස් පෙළ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ වන විට විවිරණිකාවක් නිකුත් කර ඇති අතර ඊට අනුව ඉංජිනේරු පීඨයට බඳවාගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 510 කි. ඒ අනුව 2018 වසරේ මෙන්ම 2019 වසරේද උසස් පෙළ ප්‍රතිඵල අනුව 275 ක් බඳවා ගන්නා අතර ඊට අමතරව පරිගණක ඉංජිනේරු විද්‍යා උපාධි වැඩසටහන (ශිෂ්‍යයන් 200), සාගර විද්‍යා සහ නාවුක වාස්තු විද්‍යාව (ශිෂ්‍යයන් 10), සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය සඳහා අතිරේක බඳවා ගැනීම් (ශිෂ්‍යයන 25) ලෙස ශිෂ්‍යයන් ඇතුලත් කරගනු ඇත.

වැඩිපුර බඳවාගන්නා සිසුන් වෙනුවෙන් පීඨයේ අරමුදල් අවශ්‍යතා පිළිබඳව වි.ප්‍ර.කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දැනුම්දීමට පියවර ගෙන ඇත. එසේ පීඨයට වැඩිපුර ඇතුළු කරගන්නා සිසුන් සඳහා AHEAD ව්‍යාපෘතියෙන් රු. මිලියන 40ක් ලැබී තිබේ. ඇතුලත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම වෙනුවෙන් ඉංජිනේරු පීඨය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හතර සහ එම යෝජනාවන්ට පහසුකම් සැලසීම පිණිස වන හදිසි මූල්‍ය සහ මානව සම්පත් අවශ්‍යතා පිළිබඳ වත්මන් තත්ත්වය සාකච්ඡා කිරීම පිණිස රුහුණ විශ්වවිද්‍යාලය සහ වි.ප්‍ර.කොමිෂන් සභාව අතර සාකච්ඡාවක් සුම් තාක්ෂණය යොදාගනිමින් 2020 ජූලි 10 වන සිකුරාදා ප.ව. 1.00 ට පවත්වනු ලැබීය. එම රැස්වීමේදී දේශන ශාලා ගෘහ භාණ්ඩ සහ දේශන ශාලා ප්‍රතිසංස්කරණය කිරීමේ වියදම් සඳහා රු. මිලියන 101ක් නිදහස් කිරීමට කොමිෂන් සභාව එකඟ වූ අතර උපකරණ ප්‍රදානයක් ලෙස පීඨයට ලබාදීමට නියමිතව තිබූ එහෙත් ගෙවනු නොලැබූ රු. මිලියන 30 ක මුදල ගෙවීම ද කොමිෂන් සභාව සිය අවසන් රැස්වීමේදී තහවුරු කරන ලදී.

වැඩි කළ ශිෂ්‍ය සංඛ්‍යාව පළමු වසර සඳහා සූදානම් කිරීම වෙනුවෙන් පැරණි පුස්තකාල ගොඩනැගිල්ල, අතිරේක ශිෂ්‍යයන් 235 දෙනෙක ඇතුළුව 510 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යායේ අවශ්‍යතා සැපිරීම වෙනුවෙන් පරිගණක මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

සිවිල් හා පරිසරික ඉංජිනේරු විද්‍යා ක්ෂෙත්‍රයේ විශේෂ උපාධිය හදාරන 18වන කාණ්ඩයේ උපාධි අපේක්ෂකයන් සඳහා මිනින්දෝරු වැඩ කඳවුරක් 2020 මාර්තු 6 දින ගලිගමුව වාරිමාර්ග ආයතනයේදී සාර්ථකව පවත්වන්නට යෙදුණි.

ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ සහාය ඇතිව, පීඨයේ ඉංජිනේරු විද්‍යා අධ්‍යාපන මධ්‍යස්ථානය 4 වැනි සහ 6වැනි වසරවල ඉංජිනේරු උපාධි අපේක්ෂකයන් සඳහා දිවයිනේ විවිධ කර්මාන්ත ශාලාවල තෙමස් කර්මාන්ත පුහුණුවක් සඳහා කටයුතු යොදන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් එම පුහුණුව අවලංගු කිරීමට සිදු වූ නමුත් ඔත්තේ වර්ෂාර්ධය සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. සමාජ දුරස්ථභාවය පවත්වාගැනීමට නොහැකි වූ බැවින් සෑම ඉගැන්වීම් කටයුතු සූම් තාක්ෂණය ඔස්සේ සිදුකරන ලදී. දේශන නිසි පරිදි පැවැත්වීම සහතික කරනු වස් ට හැකි වන පරිදි අධ්‍යනංශ අනුව සුහුරු පංති කාමර පහක් සකස් කරන ලදී.

අධ්‍යයන කටයුතු සඳහා 2020 නොවැම්බර් 28 දින පීඨය භෞතිකව විවෘත කරනු ලැබූ අතර අවසන් වසරේ සිසුන්ගෙන් ආරම්භ කරමින් එය කාණ්ඩ අනුව සිදුකරන ලදී. රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ඔවුන් සිය විද්‍යාගාර කටයුතු නිමා කළ අතර පීඨය, නේවාසිකාගාර, ආපන ශාලා සහ විද්‍යාගාර තුළ සියලු ස්ථානයන්හි සමාජ දුරස්ථභාවය පවත්වා ගනිමින් අනෙකුත් නිවාරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයට 2021-2025 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් 'පූර්ණ ප්‍රතීතනය' හිමි වුණි.

මෙම වසරේදී පීඨයේ 7වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය (ARS – 2020) 2020 ජූලි 6 වැනි දින ඉංජිනේරු පීඨයේදී මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව පවත්වන ලදී.

'සිවිල් ඉංජිනේරු විද්‍යාවේ මෑත කාලීන ප්‍රගමන' පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු සමිතිය සහ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යනාංශය විසින් ඒකාබද්ධව සංවිධානය කරනු ලැබූ 8 වැනි උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය පීඨ පරිශ්‍රයේදී 2020 සැප්තැම්බර් 3 වන දින සාර්ථකව පවත්වනු ලැබීය. රුහුණ විශ්වවිද්‍යාලයේ සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ සියලු අධ්‍යයන ක්ෂෙත්‍රයන්හි උපාධි අපේක්ෂකයන්ගේ සාධන සහ පර්යේෂණ සම්මන්ත්‍රණයේදී එළි දක්වන ලදී.

විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය වෛද්‍ය රොබෝ යන්ත්‍රයක් නිර්මාණය කළ අතර ද්විමාර්ගික ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයෙන් සමන්විත එමගින් දුරස්ථව කායික විද්‍යාත්මක තොරතුරු ලබා ගනිමින් රෝග විනිශ්චය සිදුකිරීමට වෛද්‍යවරුන්ට ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙය 2020 මාර්තු 05 වන දින කරාපිටිය ශික්ෂණ රෝහලේදී එළි දක්වන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | පරිගරණක ඉංජිනේරු විද්‍යා විද්‍යාවේදී උපාධිය | විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ වාර්ෂික ඇතුලත් කරගැනීම් ශිෂ්‍යයන් 200 කින් වැඩි කරන ලදී |
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | දැනට ක්‍රියාත්මක යාන්ත්‍රික සහ නිෂ්පාදන ඉංජිනේරු විද්‍යා වැඩසටහන සඳහා නව පාඨමාලා ඒකක ලෙස ME6305 බලශක්ති ද්‍රාව විද්‍යාව, ME8301 ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ ME6210 ආගණනීය තරල ගති විද්‍යාව හඳුන්වාදෙන ලදී | උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් මෙන්ම කර්මාන්තය |
| | දැනට පවතින විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා වැඩසටහනට නව පාඨමාලා ඒකක EE6209 ජෛවවෛද්‍ය ඉංජිනේරු විද්‍යාව හඳුන්වා දෙන ලදී | |
| ප්‍රජා සේවා | <u>**විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය**</u><br>SLC-2 ආයුධ පිහිටුවීම් රේඩාර් ඒකක<br><br>දැඩි සත්කාර ඒකකයේ ඇඳන් 20ක් අළුත්වැඩියා කිරීම | කාලතුවක්කු පුහුණු පාසල, මින්නේරිය<br>ශික්ෂණ රෝහල, කරාපිටිය |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | <u>**විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය**</u><br>කොවිඩ්-19 සඳහා MEDICUS+ මූලාකෘතිය සංවරධනය, ද්විමාර්ගික ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයෙන් සමන්විත මෙම රොබෝ යන්ත්‍රයෙන් දුරස්ථව කායික විද්‍යාත්මක තොරතුරු ලබා ගනිමින් රෝග විනිශ්චය සිදුකිරීමට වෛද්‍යවරුන්ට ඉඩ ප්‍රස්ථා සැලසේ<br><br><u>**සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය**</u><br>මහාචාර්ය සුධීර ද සිල්වා- ශ්‍රී ලංකාව මහල් කිහිපයක් පමණක් සහිත ගොඩනැගිලිවල තත්ත්ව ඇගයුම සඳහා ස්වයං ඇගයීම් මාර්ගගත මෙවලමක් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කොළඹ, 2020 ඔක්තෝබර්<br>මහාචාර්ය සුධීර ද සිල්වා- ශ්‍රී ලංකාව මහල් කිහිපයක් පමණක් සහිත ගොඩනැගිලිවල පසු ඉදිකිරීම් සවිකිරීම් සහ ශක්තිමත් කිරීම පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශ සකස්කිරීම සඳහා පත් කළ බාහිර සමාලෝචන කමිටුවේ සාමාජික , ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කොළඹ, 2020 ඔක්තෝබර් | මහාචාර්ය සුධීර ද සිල්වා- ඉදිකිරීම් අංශයට සම්බන්ධ පිරිස් සහ ඉංජිනේරුවන්<br>මහාචාර්ය සුධීර ද සිල්වා- ඉදිකිරීම් අංශයට සම්බන්ධ බිරිස් සහ ඉංජිනේරුවන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | මහාචාර්ය සුධීර ද සිල්වා- පැරණි සේ පෙනෙන හෝ සමානාත්‍ය මහජනතාවාට තර්ජනයක් හෝ අනතුරක් විය හැකි ගොඩනැගිලි පිළිබඳ ව්‍යුහාත්මක ඇගයීම් වාර්තා සකස් කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් පරිපාටිය සකස් කිරීම සඳහා බාහිර සමාලොචක, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කොළඹ, 2020 ඔක්තෝබර් | මහාචාර්ය සුධීර ද සිල්වා- ඉදිකිරීම් අංශයට සම්බන්ධ පිරිස් සහ ඉංජිනේරුවන් |
| | ආචාර්ය ඩබ්ලිව්.කේ.සී.එන් දයන්ති මිය ගින් නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන සහ මූලික සැලසුම් සමාලෝචන කමිටුවේ සම්පත් දායකයකු ලෙස කටයුතු කරන ලදී | ඉදිකිරීම් අංශයට සම්බන්ධ පිරිස් සහ ඉංජිනේරුවන් |
| | සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය කොග්ගල අපනයන පිරිසැකසුම් කලාපය සඳහා යෝජිත මුහුදු මෝය සඳහා මූලික පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කරන ලදී. එම කණ්ඩායම අධ්‍යනාංශයේ පහත දැක්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත විය | |
| | <u>අන්තර් ශික්ෂණ අධ්‍යයන අධ්‍යනාංශය</u> | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| | ආචාර්ය ඩී.එම්.කේ.එන්. සෙනෙවිරත්න සහ ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි අ.පොස (උ.පෙළ) 2019 සංයුක්ත ගණිතය විෂය සඳහා ප්‍රධාන විභාග පරීක්ෂකවරු ලෙස කටයුතු කරන ලදි | |
| | ආචාර්ය ඩී.එම්.කේ.එන්. සෙනෙවිරත්න ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය |
| | ආචාර්ය ඩී.එම්.කේ.එන්. සෙනෙවිරත්න ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යා ආයතනයේ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී | ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය |
| | ශ්‍රී ලංකා කෘතිම බුද්ධි සංගමයේ 2020/21 සභාපති ලෙස ආචාර්ය එන්.එම්.වගආරච්චි කටයුතු කරන ලදී | ශ්‍රී ලංකා කෘතිම බුද්ධි සංගමය 2020/21 |
| | යුරෝ කේත ප්‍රතිශෝධනය- ආචාර්ය රුවන් අප්පුහාමි මහතා කොළඹ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2020 පෙබරවාරි 5 වන දින පැවැති යුරෝ කේත සඳහා ජාතික ඇමුණුම් සකස් කිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමට සහභාගි විය | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | AMIESL සඳහා ඉංජිනේරු උපාධි වැඩසටහන් පිළිගැනීම පිළිබඳ මඩුලු සාමාජික 01<br>තාක්ෂණික ඇගයීම් කමිටුව 02<br>ඉංජිනේරු විද්‍යා පීඨ මණ්ඩලය 55<br>නීවාස අනු කමිටුව 05<br>නේවාසිකාගාර කමිටුව 23<br>ආපනශාලා කමිටුව 23<br>පර්යේෂණ කමිටුව 08<br>ඉංජිනේරු විද්‍යා අධ්‍යයන මණ්ඩලය 08<br>තො.ස.තා. කළමනාකරණ කමිටුව 06<br>අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය 06<br>ගොඩනැගිලි හා ඉඩම් කමිටුව 05<br>පීඨයේ තාක්ෂණික පැවැරුම් CEL 05 | ශ්‍රී ලකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු විද්‍යා උපාධි වැඩසටහනේ ඉංජිනේරු විද්‍යා උපාධිය<br><br>මැද මාපලගම ශ්‍රී වර්ධනාරාම විහාරයේ අකුණු ආරක්ෂකය ස්ථාපනය කිරීම<br><br>තිහගොඩ ප්‍රාදේශීය සභාව සඳහා CCTV කැමරා පද්ධතියක් මිලදි ගැනීම සඳහා නිර්දේශ සැපයීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | <u>විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය</u><br><br>සිරුරේ පළඳින අටවන ලද බෝම්බ (IEDs) සොයාගැනීමේ අතේ ගෙන යා හැකි රේඩාර් පද්ධතියක් සකස් කිරීම/ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පැවැරුම් කාර්යාලයෙන් රු. 1,075,000,000<br><br>MEDICUS+ : රෝගීන් දුරස්ථව අධීක්ෂණය සහ තත්කාල සන්නිවේදනය සඳහා රොබෝ යන්ත්‍රය/ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පැවැරුම් කාර්යාලයෙන් රු. 250,000,000 | ආචාර්ය සී.කේ.ඩබ්. සෙනෙවිරත්න<br><br>චතුම් සංකල්ප මයා |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ICSTEESD – 2020 සමුළුවේ පළමු සැසියේදී “controller for the power injection from a grid energy storage within an AC micro grid” පර්යේෂණ පත්‍රිකාවට හොඳම පර්යේෂණ පත්‍රිකාවට හිමි සම්මානය හිමි විය<br><br>රුමේනියාවේ, නිර්මාණකරණය හා නව්‍යකරණය පිළිබඳ යුරෝපියානු ප්‍රදර්ශනයේදී “Hemo X – Non Invasive Screening Tool to Detect Anemia” සඳහා රන් සම්මානය හිමි විය | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | 2020 පෙබරවාරි 15 වැනි දින පැවැති ඇමෙරිකානු විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික රැස්වීමේදී සිය වෘත්තීය ජීවිතයේ මුල් අවධියේන සිටින සංවර්ධන වන රටවල කාන්තා විද්‍යාඥයන් සඳහා පිරිනමන OWSD-එල්ස්වියර් පදනම් සම්මානය ආචාර්ය චම්පිකා එල්ලාවල මියට හිමි විය | ආචාර්ය චම්පිකා එල්ලාවල මිය |
| | ජපානයේ ඔවනොමිසු විශ්වවිද්‍යාලය සහ ටෝයෝ විශ්වවිද්‍යාලය සමග සහයෝගිතා පර්යේෂණ යටතේ ජපානයේ ටෝකියෝහි විද්‍යාගාර පුහුණු වැඩසටහනකට සහභාගිවීමට ජපානයේ ටෝයෝ විශ්වවිද්‍යාලය සිවිල් හා විදුලි ඉංජිනේරු අධ්‍යනාංශයේ ආචාර්ය තුෂාර චමින්ද, මහතාට ආරාධනා කරන ලදී | ශිෂ්‍යයන්ගේ ප්‍රතිලාභය සඳහා |
| | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය සමග සහයෝගිතාවයෙන් විදුලි ඉංජිනේරු විද්‍යාගාර සැසි පිළිබඳ දෙදින වැඩමුළුව | පළාතේ තාක්ෂණික නිලධාරීන් 70 දෙනෙකු |
| | පීඨයේ 7 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව (ARS – 20*20*) 2020 ජූලි 06 වැනි දින ඉංජිනේරු පීඨයේදී සූම් තාක්ෂණය යොදා ගනිමින් සාර්ථකව පවත්වන ලදී | පීඨයේ කාර්යමණ්ඩලය සහ පීඨ සිසුන් |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | රුහුණ විශ්වවිද්‍යාලයේ IEEE ඔස්සේ ගණිත පංති පවත්වන ලදී. | ගාල්ල, කැලේගම SOS ළමා ගම්මානයේ ළමුන් |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 15 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 14 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 20 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 01 |
| පොත්වල ඡේද | 06 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය) | 01 |
| සංස්කරණ කාර්යයන් | 02 |
| **එකතුව** | **60** |

# ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

2005 වසරේදී ස්ථාපිත කරනු ලැබූ ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ 15 වැනි වසර 2020 වර්ෂයයි. මේ දක්වා පීඨය ධීවර, ජලජීවී වගාව, සාරස විද්‍යාව, සාගර විද්‍යාව සහ සමුද්‍රීය භූ විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත උපාධිධාරීන් කණ්ඩායම් නවයක් බිහි කොට තිබේ. එසේම 2020වසරේදී, පීඨයේ සාගර සහ මිරිදිය විද්‍යා විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා තෙවන ශිෂ්‍ය කණ්ඩායම බඳවාගන්නා ලදී. සාගර සහ මිරිදිය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන හඳුන්වාදීමට සමගාමීව, ධීවර සහ සාගර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධියේ සංශෝධිත විෂයමාලාව 2020 වසරේදී IV මිටටම සඳහා හඳුන්වා දෙන ලදී. තවද, සාගර සේවා සහ සම්පත් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන  නම් නව උපාධි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පීඨය මුල පුරා ඇති අතර, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය සහ කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් 2023 වසරේ සිට එය පවත්වනු ඇත. පීඨ මණ්ඩලය,  අ.ත.ආ.ඒකකය, දු.අ.අ.ඒකකය, ත.ආ.ස්.කමිටුව විසින්  ධීවර කර්මාන්තයට අදාළ චාරිත්‍රමය නීතිය, ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක්  සකස් කර නිර්දේශ කරන ලදී.  සමාලෝචන මඩුල්ලක් විසින් පාඨමාලා ව්‍යුහය සමාලෝචනය කරන ලද අතර ප්‍රතිශෝධිත විෂයමාලාව තත්ත්ව ආරක්ෂණ ස්ථාවර කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

ශිෂ්‍යයන් වෙනුවෙන් සපයන සේවා ව්‍යාප්ත කිරීම පිණිස ඡායා පිටපත් සහ මුද්‍රණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මුළු රටම අගුලු දමා තිබූ කාල සීමාව තුළ මාස දෙකකට ආසන්න කාලයක් අධ්‍යයන වැඩසටහන් අවහිර වී කල් දැමීමට සිදු විය. කෙසේවෙතත්, පීඨය සූම් සහ  LMS තාක්ෂණය යොදා ගනිමින් ඵලදායීව මාර්ගගත ඉගැන්වීම් සිදු කළ අතර එමගින් 2020 පළමු වර්ෂාර්ධයේ වැඩ ප්‍රමාණයෙන් සාමාන්‍යයෙන් 50% ක පමණ නිමා කරන ලදී. තවද, සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා නිල විද්‍යුත් තැපැල් ලිපින සපයන ලද අතර පසුව නව සාමාන්‍යය තත්ත්වයන්ට අනුකූලව කටයුතු කරමින් අධ්‍යයන වැඩසටහන් භෞතිකව පවත්වන ලදී.

එසේම, ශ්‍රී  ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි විද්‍යාගාරයක් ලෙස දකුණු පළාතේ කර්මාන්තශාලාවල ජලය සහ අපජලය පරීක්ෂා කිරීම යි සහ.සා.වි හා තා. පීඨයේ සාරස විද්‍යා හා ජලතාක්ෂණ අධ්‍යනාංශයේ විද්‍යාගාරයේදී අඛණ්ඩව සිදුකරන ලදී. ලෝක තෙත්බිම් දිනය සමරමින් පීඨයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 2 වැනි දින පවත්වන ලදී. තවද, ‘මෘදු කුසලතා’ සහ ‘ලිම් සොා’ සංගම්වල ශිෂ්‍යයන් ග්‍රාමීය පාසලකට පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර 2020 ජනවාරි 22 සහ 2020 ජූනි 02 යන දිනයන්හි ලෝක පරිසර දිනය සැමරීම සඳහා ලිපි, ඡායාරූප සහ ආදර්ශ පාඨ තරඟයක් මාර්ගගතව පවත්වන ලදී.  ජාත්‍යන්තර නියමාවලි යටතේ පිහිනුම් සහ කිමිදුම් පිළිබඳ පුහුණුව සැපයීම පිණිස  මූල්‍ය කමිටුවේ නිර්දේශය සහ පාලන මණ්ඩලයේ අනුමතිය සහිතව සමුද්‍රීය ශාස්ත්‍ර සහ සාගර භූවිද්‍යා අධ්‍යනාංශයේ ‘කිමිදුම් ඒකකයක්’ ස්ථාපිත කරන ලදී. තවද පීඨ සාමාජිකයන් සමාජ සේවා ක්‍රියාකාරකම්වල නිරත වූ අතර විවිධ ආයතන සමග සබඳතා ගොඩ නගා ගෙන තිබේ. ආචාර්ය පී.බී.ටී.පී.කුමාර මහතා සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ලෙස පත්කරනු ලැබූ අතර මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා 2020 වසරේදී නාරා ආයතනයේ සාමාජිකයකු ලෙස පත් කරන ලදී. 2020 වසර තුළ ජාත්‍යන්තර සහයෝගිතා ශක්තිමත් කරගනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ සමුද්‍රීය පර්යේෂණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම පිණිස තායිවානයේ ජාතික සුන් යැට් සෙන් විශ්වවිද්‍යාලයෙන් ඇ.ඩො. 1618 ක ප්‍රදානයක් ලැබුණි.

පීඨ සාමාජිකයන් 2020 වසරේදී ජාත්‍යන්තර සූචිගත වාරසඟරා පත්‍රිකා 10ක්, සූචිගත නොවන පත්‍රිකා 2ක් සහනිබන්ධන 11ක් සහ පොත් ඡේද 2ක් විවිධ සංසදවලදී ප්‍රකාශයට පත් කර තිබේ. පීඨ සාමාජිකයන් ජාතික සහ ජාත්‍යන්තර සම්මාන සහ ඇගයීම් දිනාගන්නා ලදී; ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ආර්.ටී. කුමාරතුංග මහතාට සම්මාන මහාචාර්ය පදවි නාමය පිරිනැමූ අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී.ඩී. ගමගේ මහතාට 2019 වසර සඳහා වූ ගුආන්ඩොන් පළාත් විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතා සම්මානය 2020 වසරේදී පිරිනමනු ලැබීය. කේ.එච්.එච්. නිරෝෂණ මහතා 2020 මාර්තු මාසයේදී එක්සත් රාජධානියේ ලන්ඩනයේ බකිංහැම් මැදුරේදී පොදුරාජ්‍ය මණ්ඩල විද්වතුන්, වෙව්නින් විද්වතුන් සහ ACU බිලූ වාටර් අධිසාමාජිකයන් නියෝජනය කරන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | පළමු වරට සාගර සහ මිරිදිය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධියේ මට්ටම IV සඳහා මුළු විෂය මාලාව 2020 දී හඳුන්වා දෙනු ලැබීය<br><br>ධීවර සහ සාගර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය මට්ටම IV සඳහා ප්‍රතිශෝධිත පාඨමාලාව 2020 දී හඳුන්වා දෙනු ලැබීය<br><br>සාගර සේවා සහ සම්පත් කළමනාකරණ නව උපාධි වැඩසටහන සඳහා විෂයමාලා සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සාකච්ඡා කරමින් පවති | උපාධිධාරීන් සඳහා රැකියා සහ පශ්චාත් උපාධි අවස්ථා වැඩි කරන ලදී<br><br>රැකියා වෙළඳපොළේ හිඳැස සුදුසුකම් ලත් උපාධිධාරීන්ගෙන් පිරවීම |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | පීඨ මණ්ඩලය විසින් ධීවර කර්මාන්තයට අදාළ වාරිත්‍රමය නීතිය, ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක් සකස් කරන ලද අතර, අ.ත.ආ.ඒකකය, දූ.අ.අ.ඒකකය, ත.ආ.ස්.කම්ටුව විසින් ඒවා නිර්දේශ කරන ලදී. පත්කරන ලද සමාලෝචක මඩුල්ල විසින් පාඨමාලා ව්‍යුහය සමාලෝචනය කරන ලදී | ධීවර ප්‍රජාවේ සාමාජිකයන්, ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයන් හා සම්බන්ධ කුඩා පරිමාණ ව්‍යාවසායකයන් සහ රාජ්‍ය නිලධාරීන් |
| ගාස්තු අයකරන පාඨමාලා | සාගර සේවා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීම කමිටුවේ සාකච්ඡා කරමින් පැවැතුණි | පීඨ දෙකක් (ධී.සා.වි.තා සහ මූ.ක.පීඨ) විසින් ඒකාබද්ධ ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස හඳුන්වා දෙන ලදී |
| ප්‍රජා සේවා | සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යනාංශයේ ඇති ධී.සා.වි.පීඨයේ සේවා විද්‍යාගාරය අඛණ්ඩව පවත්වා ගැනීම<br><br>ලෝක තෙත්බිම් දිනය සමරමින් පීඨයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 2 වැනි දින පවත්වන ලදී<br><br>මෘදු කුසලතා සමිතිය විසින් 2020 ජනවාරි 22 වන දින ග්‍රාමීය පාසලකට පොත් හා ලිපිද්‍රව්‍ය පරිත්‍යාග කිරීම | ජලය සහ අපජල විශ්ලේෂණ වාර්තා ලබා දෙනු ලැබීය<br><br>පරිසරය පිරිසිදුව තබා ගැනීම ගැන මහජනතාව දැනුවත් කරන ලදී<br><br>සමාජ සේවා කටයුතු සඳහා සිසුන් දිරිගැන්වීම |
| විෂයමාලා සංවර්ධනය පාඨමාලා ඒකක/ විෂය වැඩිදියුණු කිරීම) | සාගර සහ මිරිදිය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධියේ මට්ටම IV සඳහා මුළු විෂය මාලාව 2020 දී හඳුන්වා දෙනු ලැබීය<br><br>වැඩි දියුණු කර ධීවර සහ සාගර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහනේ IV වන මට්ටමේ විෂයමාලාවට හඳුන්වා දෙනු ලැබීය | දේශීය සහ ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා විෂයමාලාව උත්ශ්‍රේණි කරන ලදී |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | CCPDHE 2020 වැඩසටහනේ 7 වන මොඩියුලය සම්බන්ධීකරණය කරන ලදී<br><br>මාර්ගගත පුහුණු වැඩසටහනට සහභාගි විය | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | යෝජිත හම්බන්තොට නගර විශ්වවිද්‍යාලයේ උපදේශන සේවාව වි.ප්‍ර. කොා. සභාව විසින් ප්‍රදානය කරන ලදී | මානව සම්පත් සංවර්ධනය, ජාතික සංවර්ධනය සඳහා දැනුම ප්‍රචාරණය |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ජාතික ජලජීවී සම්පත් නියෝජිතායතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් ,24/07/2020 දක්වා ජාතික සමුද්‍රීය පරිසර කවුන්සිලයේ සාමාජිකයෙක්, ධීවර හා ජලජ සම්පත් සඳහා වූ ශ්‍රී ලංකා සංගමයේ උප සභාපති සහ විධායක කමිටුවේ සාමාජිකයෙකු ලෙස තේරී පත් විය<br><br>සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ (MEPA) සාමාන්‍යාධිකරී ලෙස පත්කරන ලදී<br><br>අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාගර කටයුතු පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. එසේම ජාතික විද්‍යා පදනමේ සහ සාගර විද්‍යා සහ සුමුද්‍රීය විද්‍යා පිළිබඳ ජාතික තේමාත්මක පර්යේෂණ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු ලෙස ද ඔහු කටයුතු කරන ලදී<br><br>ශ්‍රී ලංකා ජලජ විද්‍යා සඟරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයකු ලෙස සේවය කරයි<br><br>ශ්‍රී ලංකා ජලජ විද්‍යා සඟරාවේ (මාර්ගගත ISSN: 1391 – 2038) සමාලෝචකයකු ලෙස කටයුතු කරයි | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | 2018 අගෝස්තු 21 සිට වසර තුනක කාලසීමාවක් සඳහා අධ්‍යාපන සහ පර්යේෂණ සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයේ (CSL CER) සම -අධ්‍යක්ෂ<br><br>කෘෂිකාර්මික සහ පර්යේෂණ ආයතන ආසියා ශාන්තිකර සංගමය (APAARI), බැංකොක්, තායිලන්තය විසින් ප්‍රකාශයට පත්කරන ලද ඌනඋපයෝජිත මත්ස්‍ය සහ සාගර ජාන සහ ඒවායේ සමුන්නතිකරණය පිළිබඳ කලාපීය වැඩමුළුවේ තාක්ෂණික සැසිවල සම සංස්කාරක ලෙස කටයුතු කරන ලදී<br><br>ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය විසින් පවත්වනු ලැබූ වෙරලබඩ භූ දර්ශන සහ පාරිසරික පද්ධති වල අවදානම්පාත්‍රබව කෙරෙහි මුහුදු මට්ටම ඉහළයාම සහ දේශගුණික වෙනස්වීම (RCA 7031) ඇගයීම පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ මෙරට නියෝජිතයා ලෙස කටයුතු කරන ලදී<br><br>සමාලෝචක/ වැව් සහ ජලාශ විද්‍යාව, තිරසර භාවිතය සඳහා ප්‍රතිපත්තිය සහ කළමනාකරණය ( මාර්ගගත ISSN:1440-1770)<br><br>සමාලෝචක/ ජලජ පර්යේෂණ පිළිබඳ ඊජිප්තු සඟරාව (ISSN: 1687-4285) | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | පියයේ ස්වයං ඇගයීම් වාර්තා ලිවීමේ කමිටුව 06<br>ඉතිහාසය ලිවීමේ කමිටුව 03<br>පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය 06<br>සාගර විද්‍යා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව/ උපාධිය හඳුන්වාදීම සඳහා කමිටුව 11<br>අත්පොත සහ කාලසටහන සකස්කිරීමේ කමිටුව 05<br>විෂයමාලා සංවර්ධන කමිටුව 12 | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | අධ්‍යයන මණ්ඩල -ද.අ.අ.ක. | 05 | |
| | පීඨයේ පුස්තකාල කමිටුව | 07 | |
| | තාක්ෂණික පැවැරුම් ඒකකය | 07 | |
| | පර්යේෂණ යාත්‍රාව සංවර්ධනය සඳහා කමිටුව | 04 | |
| | කිමිදුම් ඒකකය | 05 | |
| | පීඨයේ ශිෂ්‍ය විනය කමිටුව | 03 | |
| | පර්යේෂණ හා සංවර්ධන කමිටුව | 04 | |
| | ශිෂ්‍යත්ව කමිටුව | 04 | |
| | ශිෂ්‍ය ඉල්ලීම් කමිටුව | 04 | |
| | ආචාරධර්ම කමිටුව | 05 | |
| | පීඨයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව | 07 | |
| | CoRAC කමිටුව | 04 | |
| | පීඨය සඳහා විද්‍යාගාර ආරක්ෂණ ලේඛන සකස්කිරීම සඳහා කමිටුව | 04 | |
| | පර්යේෂණ ප්‍රදාන කමිටුව | 05 | |
| | මූල්‍ය කමිටුව | 06 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | ජාතික විද්‍යා පදනම - තේමාත්මක පර්යේෂණ ප්‍රදානය NTRP/2017/CC&ND/TA-05/P-01/01 LKR 17,340,142 | | විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| | රුහුණු විශ්වවිද්‍යාලයේ තායිවාන ශ්‍රී ලංකා සාගර පර්යේෂණ මධ්‍යස්ථානය් සාගර පර්යේෂණ සංවර්ධනය පිණිස තායිවානයේ ජාතික සුන් යැට සෙන් විශ්වවිද්‍යාලයෙන් ඇ.ඩො. 1618ක ප්‍රදානයක් ලැබුණි | | පීඨයේ සාගර ජලජීවී පහසුකම් සහ පර්යේෂණ සංවර්ධනය කරන ලදී |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | 2019 වසර සඳහා වූ ගුආන්ඩොන් පළාත් විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතා සම්මානය 2020 වසරේදී පිරිනමනු ලැබීය | | පුද්ගලික කුසලතා සංවර්ධනය කරගනු ලැබූ අතර අනෙකුත් සාමාජියක් දිරිගන්වන ලදී |
| | 2020 මාර්තු මාසයේදී එක්සත් රාජධානියේ ලන්ඩනයේ බකිංහැම් මැදුරේදී දේශගුණය සහ පරිසරය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ සිදුකරන පොදුරාජ්‍ය මණ්ඩල විද්වතුන්, වෙච්නින් විද්වතුන් සහ ACU බිලූ වාටර් අධිසාමාජිකයන් ඇතුළු විද්වත් කණ්ඩායම් නියෝජනය කරන ලදී | | |
| | සම්මාන මහාචාර්ය පදවි නාමය පිරිනමන ලදී | | |
| | ආචාර්ය උපාධිය කියවීම සඳහා කථිකාචාර්ය (පරිවාස) තුනකට තරඟකාරී ශිෂ්‍යත්ව ලැබුණි | | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන අභ්‍යන්තර හා දේශීය | ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය සහ සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් 2020 ජනවාරි මාසයේ අනුරාධපුර කලාවැවදී පවත්වනු ලැබූ ‘‘නීල ජෛව ආර්ථික විද්‍යා පර්යාලෝකය’ ජාත්‍යන්තර වැඩමුළුවේ සම්පත් දායක | | කාර්ය මණ්ඩල සාමාජිකයින්ට විවිධ විෂයයන් සඳහා අවස්ථා ලබා දීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන අභ්‍යන්තර හා දේශීය | ශ්‍රී ලංකා විද්‍යානිවර්ධන සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික සංවර්ධනය සඳහා සමුද්‍රීය සම්පත් සහ සාගර විද්‍යාව පිළබඳ පර්යේෂණ අවශ්‍යතා මැයෙන් පැවැත්වූ වෙබිනාරයේ දේශනයක් පවත්වන ලදී<br><br>ධී.සා.වි හා තා. පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා මාර්ගගත ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාකාරකම් සඳහා මයික්‍රොසොෆ්ට් A1 භාවිතය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය | |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | 2020 ජූනි 02 දින ලෝක පරිසර දිනය සැමරීම සඳහා සාරස විද්‍යා සංගමයේ ශිෂ්‍යයන් මාර්ගගත තරඟයක් පවත්වන ලදී<br><br>එම සංගමය ද්‍රාව ව්‍යූහ පිළිබඳ වාර්තා විඩියෝවන් සකස් කර යූටියුබ් වෙත උඩුගත කරන ලදී<br><br>‘මෘදු කුසලතා’ සංගමයේ ශිෂ්‍යයන් ග්‍රාමීය පාසලකට පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් 2020 ජනවාරි 22 වැනි දින සංවිධානය කරන ලදී<br><br>පීඨයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 2 වැනි දින පවත්වන ලදී | පීඨයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 2 වැනි දින පවත්වන ලදී<br><br>පරිසරය ආරක්ෂාකිරීමේ වැදගත්කම පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වගකීම ශිෂ්‍යයන් බාරගන්නා ලදී |
| සබැඳි වැඩසටහන් | ධී.සා.වි.තා පීඨය සහ තායිවානයේ ජාතික සුන්යැට් සෙන් විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම<br><br>දකුණු චීන සමුද්‍රීය විද්‍යා සාගර ආයතනය සහ රු.වි. අතර අවබෝධතා ගිවිසුම<br><br>නෝර් ලංකා බිලූ ව්‍යාපෘතිය<br>තායිවානයේ ජාතික කෞතුකාගාර සහ සාගර ජලාලය (NMMBA)සහ ධීසාවිතා පීඨය අතර සබැඳි වැඩසටහන<br>ස්වට්සර්ලන්තයේ සූරිච් ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලයේ ත්‍රෛමාසික සිමාවාසික පුහුණුවක් සඳහා ජංගම ශිෂ්‍යත්වයක් හිමිවුණි | උපාධිධාරීන්ට විද්‍යාශූරී/විද්‍යාපති උපාධිය හැදෑරීමට ශිෂ්‍යත්ව හිමිවුණි<br>ආධුනික කථිකාචාර්යවරුන්ට දර්ශනශූරී/දර්ශනපති උපාධි හැදෑරීමට ශිෂ්‍යත්ව හිමිවුණි |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 10 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 11 |
| පොත්වල පරිච්ඡේද | 02 |
| **එකතුව** | **25** |

# උපාධි අධ්‍යයන පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

රටට සහ ලෝකයට කරන්නා වූ සේවයක් ලෙස, උසස් ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ සඳහා විශිෂ්ඨත්වයේ උත්කෘෂ්ඨ මධ්‍යස්ථානයක් වීම ඉලක්ක කරගනිමින් විවිධ ක්ෂෙත්‍රයන්හි උසස් දැනුමැති ඉහළ මට්ටමේ විද්වතුන් සහ පර්යේෂකයන් බිහිකිරීමට පීඨය කැපව සිටියි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පසුගිය වසරේ රටේ සෑම අංශයකම අත්විඳි පසුබෑම් මධ්‍යයේ පීඨයේ මූලික කාර්යය වුයේ කිසිදු බාධාවකින් තොරව දැනට පවතින වැඩසටහන් පවත්වාගෙන යාමයි. පීඨය ඉතාමත් සාර්ථකව එම කාර්යය ඉටුකරගත් අතර සාමාන්‍ය තත්ත්වය පැවැති කාලයේදී මෙන්ම කිසිදු අඩුවීමකින් තොරව දැනට ක්‍රියාත්මක වැඩසටහන් සඳහා නව ශිෂ්‍ය කාණ්ඩ බඳවාගැනීමට සමත් විය.

කෙසේ වෙතත්, විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා මෙම වසරේ තරමක් අඩුවීමක් සිදුවූ අතර එය අනෙකුත් විශ්වවිද්‍යාලයන්ට ද පොදු වූ සංසිද්ධියක් විය.

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් බඳවා ගැනීම් | මුළු බඳවාගැනීම් |
|---|---|---|
| ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය | 20 | 121 |
| ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය | 78 | 176 |
| සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 72 | 316 |
| ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | – | 225 |
| සාමය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 23 | 73 |
| ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය | 24 | 92 |
| භෝග නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | – | 118 |
| **එකතුව** | **217** | **1,121** |

## පර්යේෂණ උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය බඳවාගැනීම්

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් ඇතුලත්කර ගැනීම් | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| දර්ශනපති | 20 | 133 |
| දර්ශනවේදී | 01 | 56 |

උපාධි අධ්‍යයන පීඨය දර්ශනපති හා දර්ශනවේදී උපාධිවල විවිධ විෂය ක්ෂෙත්‍රයන්ට අදාළව අභිමුඛ පරීක්ෂාවන් 22ක් මෙම වසරේ පවත්වන ලදී.

## පශ්චාත් උපාධි වැඩසටහන් පාඨමාලාවලින් ලැබූ ආදායම

| පාඨමාලාව | තථ්‍ය ආදායම | තථ්‍ය වියදම | ශේෂය |
|---|---|---|---|
| ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති | 7,319,391.00 | 2,313,400.87 | 5,005,990.13 |
| කෘෂි ආර්ථික විද්‍යා සහ සම්පත් කළමනාකරණ විද්‍යාපති | 6,000.00 | - | 6,000.00 |
| ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති. | 3,000.00 | - | 3,000.00 |
| ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති | 1,654,365.00 | 1,905,500.20 | (251,135.20) |
| සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාපති | 218,250.00 | 1,095,680.00 | (877,430.00) |
| සමාජවිද්‍යා ශාස්ත්‍රපති | 7,426,100.00 | 3,202,623.15 | 4,223,476.85 |
| භෝග නිෂ්පාදන තාක්ෂණ විද්‍යාපති. | 1,476,000.00 | 146,860.00 | 1,329,140.00 |
| කෘෂි ආර්ථික විද්‍යා සහ සංවර්ධන විද්‍යාපති | 17,000.00 | - | 17,000.00 |
| සාමය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති | 1,362,000.00 | 639,526.59 | 722,473.41 |
| ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති | 11,831,350.00 | 3,942,352.20 | 7,888,997.80 |
| **එකතුව** | **31,313,456.00** | **13,245,943.01** | **18,067,512.99** |

# මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි සහ වාග් විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, භූගෝල විද්‍යාව, ඉතිහාසය හා පුරා විද්‍යාව, පාලි සහ බෞද්ධ අධ්‍යයන, රාජ්‍ය ප්‍රතිපත්ති, සිංහල හා සමාජ විද්‍යාව යන අධ්‍යනාංශ නවයෙන්; තොරතුරු තාක්ෂණ ඒකකයකින් සහ නූතන භාෂා සහ ශිෂ්ඨාචාරය සහ ආපදා කළමනාකරණය යන මධ්‍යස්ථාන දෙකින් සමන්විත වේ.

2020 වසර තුළ පීඨයේ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි සමාලෝචනයක් විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මේ අරමුණු 07 ක් යටතේ සංක්ෂිප්තව පහත දක්වා ඇත.

**අධ්‍යාපනය, පර්යේෂණ සහ සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම-** පීඨය සිය ප්‍රධාන කාර්යය ලෙස අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා ශාස්ත්‍රපති උපාධිය (සාමාන්‍ය) සහ ශාස්ත්‍රපති (විශේෂ) උපාධිය (ශාස්ත්‍රපති ගෞරව උපාධිය ලෙස මෑතකදී සංශෝධනය කරන ලදී) පිරිනමන අතර බාහිර ශිෂ්‍යයන් සඳහා ශාස්ත්‍රපති උපාධිය (සාමාන්‍ය) පිරි නමයි. පීඨයට සාමාන්‍යයෙන් බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 350 ක් වුවද, 2020 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරාගනු ලැබූ සිසුන් 478 දෙනෙකු ඊට බඳවා ගන්නා ලදී. පීඨයේ ප්‍රජා විනිවිදුම්කරණ වැඩසටහන්වලට රටේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකවන ක්ෂෙත්‍ර ගණනාවකට අදාළව ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම ඇතුලත් විය. අධ්‍යයන සහ පර්යේෂණ විෂය ක්ෂෙත්‍රයන්හි විෂයපථය පුළුල්වීමත් සමග, විශාල සිසුන් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගැනීමට පීඨය සමත්ව තිබේ. සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර සමාලෝචන සඟරාවේ නිකුතු 04ක් ද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිලිබඳ පීඨ සඟරාවේ නිකුතු දෙකක් ද 2020 වසරේ ප්‍රකාශයට පත්කරන ලදී.

**අධ්‍යාපන පර්යේෂණ සහ සේවාවන්හි ගුණාත්මකභාවය අභිවර්ධනය කිරීම-** පුළුල් පරාසයක මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ශික්ෂාවන්හි ක්‍රියාත්මකවන සම්ප්‍රදායන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීම මගින් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය ශිෂ්‍යයන් වෘත්තීය ජීවිතයක් සඳහා පුරුදු පුහුණු කරයි. අධ්‍යාපනය යනු යහපත් පුරවැසිභාවය, අනොන්‍ය ගෞරවය, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ වෙනස් මතවාද ඉවසීම සඳහා ශක්තිමත් පදනමක් ගොඩනගන්නා වූ සාධනීය බලවේගයක් බව පීඨය සළකයි. පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ 90%ක් පශ්චාත් උපාධි සුදුසුකම් සපුරාගනු ලැබූ අතර 2019 වසරේ 32% ක්ව පැවැති දර්ශනශූරී සුදුසුකම් සහිත අධ්‍යයන කාර්යමණ්ඩල ප්‍රතිශතය 2020 වසරේදී 40% දක්වා ඉහළ නංවාගන්නා ලදී. එසේම 2019 වසර තුළ, පීඨය, සියලු පාඨමාලා ඒකක සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිතා කිරීම අනිවාර්ය කරන ලදී. එම පද්ධතිය භාවිතාකිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් කිහිපයක් ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන් යන දෙපිරිස සඳහාම පවත්වන ලදී.පීඨයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය පූර්ණව ස්වයංක්‍රීයකරණය කරන ලද අතර 100% ක සාධනයකින් යුතුව පීඨයේ සියලු ආචාර්යවරුන් විසින් අධ්‍යයන වැඩප්‍රමාණ ආදර්ශය සම්පූර්ණ කරන ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, පීඨයේ සියලු අධ්‍යයන ක්‍රියාකාරකම් වර්ෂය තුළදී මාර්ගගත ක්‍රමවේද භාවිතා කරමින් පවත්වන ලදී.

**අධ්‍යාපනයේ සහ පර්යේෂණවල අදාළත්වය අභිවර්ධනය කිරීම-** වෙළඳපොළ/ සමාජ අවශ්‍යතා සපුරාලනු පිණිස පීඨය විසින් පිරිනමන උපාධි වැඩසටහන් වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් පීඨය නව විෂයමාලා හඳුන්වාදෙන ලදී. ආශ්‍රිත වෙනත් ක්‍රියාකාරකම් කිහිපයක් සමග ඒකාබද්ධ කිරීම මගින් පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එම ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයන් 1600කට වැඩි පිරිසක් විශ්වවිද්‍යාලයේ විවිධ වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් සඳහා සහභාගි විය. 2020 වසරේදී පවත්වනු ලැබූ වාර්ෂික ශිෂ්‍ය සැසිවලදී (RASAS-2020), ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවකට තමන් පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණුබෙදා හදා ගැනීමටත් පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳවා වැඩිදුර ඉගෙනුමටත් අවස්ථාව සැලසුණි. ආචාර්යවරුන්ට සහ පර්යේෂකයන්ට සිය පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට, සාකච්ඡා කිරීමට සහ බෙදාහදා ගැනීමට ඉඩ ප්‍රස්ථා සපයමින් NORHED-CPDS ව්‍යාපෘතියේ මූල්‍ය ආධාර සහිතව පීඨයේ වාර්ෂික ජාත්‍යන්තර සමුළුව (RUICHSS-2020) මාර්ගත ක්‍රමවේදය භාවිතා කරමින් පවත්වනු ලදී. එසේම අළුතින් බඳවාගත් සිය සිසුන් සඳහා පීඨය තීව්‍ර ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු සන්නිවේදන පාඨමාලාවක් පවත්වන ලදී.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වාර්ගිකත්වය, ආගම සහ විශේෂ අවශ්‍යතාවයන් සහිත පුද්ගලයන්ට අදාළව සාධරණත්වය සහ යුක්තිය සහතික කිරීම** - විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට සහාය ලබා දෙන සිය ඒකකය පීඨය අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. සමාජ සංහිඳියාව පිළිබඳ පාඨමාලා ඒකකය පීඨය දිගටම පවත්වාගෙන යනු ලැබීය. 2020 වසරේදී Erasmus + අරමුදල් සැපයීම යටතේ ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීමේ නව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. විෂයමාලා සංශෝධනය යටතේ පීඨයේ සියලු ශිෂ්‍යයන් සඳහා අනිවාර්ය විෂයයක් ලෙස දෙමළ භාෂා පාඨමාලා ඒකකයක් හඳුන්වාදෙනු ලැබීය. පීඨයේ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර ඒකකය අභ්‍යන්තර සිසුන් ඉලක්ක කරගනිමින් දෙමළ, චීන, ප්‍රංශ සහ හින්දි ඇතුළුව භාෂා පාඨමාලා කිහිපයක් පවත්වන ලදි.

**සම්පත් සඵලව සහ කාර්යක්ෂමව කළමනාකරණය මගින් යහපාලනය අභිවර්ධනය කිරීම** - පීඨයේ ඇබෑර්තුවලින් 80%ක් පමණ පුරවනු ලැබූ අතර ඉතිරි ඇබෑර්තු සඳහා දැන්වීම් පළකරන ලදී. ඇතුළු කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 350 සිට 600 දක්වා ඉහළ නැංවීම හේතුවෙන් එසේ වැඩිපුර බඳවාගත් සිසුන් වෙනුවෙන් නව ආචාර්යවරුනු හතර දෙනෙකු පීඨයට හිමිවුණි. ශිෂ්‍ය උපදේශන සහ ශිෂ්‍ය මිත්‍රෝපදේශක වැඩසටහන් සාර්ථකව පවත්වාගෙන යනු ලැබූ අතර ශිෂ්‍ය දුක්ගැනවිලි වාර්තා කිරීමේ මාර්ගගත පද්ධතිය හඳුන්වාදීම මගින් දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කරන ලදී.

**නව්‍යකරණය සහ නවෝත්පාදන සවිබල ගැන්වීම** - මෙම කරුණ සම්බන්ධයෙන් අධ්‍යනාංශ ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ සැසි කිහිපයක් පැවැත්වීමට පීඨයට හැකිවූ අතර පීඨයේ නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දත්ත සමුදායක් සකස්කර පවත්වා ගෙන යාමට කටයුතු ආරම්භ කරන ලදී. .නව නිපැයුම් සහ නවෝත්පාදන පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රදර්ශනයන්ට සහභාගවීමට ශිෂ්‍යයන් දිරිමත් කරන ලදී.

**අද්විතීයභාවය මූර්තිමත් කිරීම** - සංචාරක ව්‍යාපාරය අදාළ නව ඩිප්ලෝමා වැඩසටහනක් හඳුන්වාදීමට පීඨය කටයුතු යොදන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | ආර්ථික විද්‍යාවථ භූගෝල විද්‍යාව සහ සමාජ විද්‍යාව සඳහා නව උපාධි වැඩසටහන් තුනක විෂයමාලා සංවර්ධනය කරමින් පවතී | අනුමතිය ලබාගැනීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කිරීමෙන් පසුව එක් එක් උපාධි පාඨමාලාව යටතේ ශිෂ්‍යයන් 50 දෙනෙකු බඳවා ගනු ඇත |
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | දේශපාලන විද්‍යාව, ඉතිහාසය, පුරා විද්‍යාව සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන්වල අදාළත්වය ඉහළ නැංවීම පිණිස නව පාඨමාලා ඒකක හතරක් හඳුන්වා දෙන ලදී | ශිෂ්‍යයන් 150 |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සහ ඉංග්‍රීසි ඩිප්ලෝමාව යන පාඨමාලා දෙකෙහි විෂයමාලා ප්‍රතිශෝධනය කරන ලදී<br>ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව යනුවෙන් නව පාඨමාලාවක් හඳුන්වා දෙන ලදී<br>ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන සහ මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව දිගටම පවත්වාගෙන යන ලදී | අ.පොස. උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සමත් 2500 දෙනෙකු පමණ |
| ගාස්තු අයකරන පාඨමාලා | සියලු දුරස්ථ අධ්‍යාපන පාඨමාලා, එනම් ශාස්ත්‍රවේදී (බාහිර) පාඨමාලාව, මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව, ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව, ඉංග්‍රීසි ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව ගාස්තු අයකරන පාඨමාලා ලෙස පවත්වාගෙන යන ලදී | ආසන්න වශයෙන් 2000 ක් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් විශේෂයෙන් දකුණු පළාතේ විවිධ ක්ෂෙත්‍රයන්හි නියැළෙන වෘත්තිකයන් විය |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ගාස්තු අයකරන පාඨමාලා | තවද, ගාස්තු අයකරන පාඨමාලා ලෙස පීඨය උපාධි අධ්‍යයන පීඨය සමග එක්ව පශ්චාත් උපාධි ශික්ෂණ පාඨමාලා තුනක් පවත්වා ගෙන යයි | |
| ප්‍රජා සේවා | ප්‍රජා ධාරිතා ගොඩනැගීම, හුවමාරු වැඩසටහන්, පුහුණු වැඩමුළු, සහ සුබසාධන ක්‍රියාකාරකම් වැනි විවිධ ප්‍රජා සේවා ක්‍රියාකාරකම්වල පීඨය නිරතවන ලදී<br><br>භූගෝල විද්‍යා, ඉතිහාසය සහ පුරා විද්‍යා අධ්‍යනාංශ විසින් උසස් පෙළ ගුරුභවතුන් සහ ශිෂ්‍යයන් සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදී | අපොස උසස් පෙළ හදාරණ ශිෂ්‍යයන්<br>ගුරුභවතුන්<br><br>සාමාන්‍ය මහජනතාව (ප්‍රජාවන්) |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | අළුතින් සංශෝධිත විෂය මාලාව ශිෂ්‍යයන් 1000ක් සඳහා ක්‍රියාත්මක කෙරේ<br><br>ශාස්ත්‍රවේදී ගෞරව උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක පැතිකඩ සකස් කරන ලදී<br><br>පීඨයේ අතුරු ව්‍යවස්ථා ප්‍රතිශෝධනය කර ක්‍රියාත්මක කරන ලදී<br><br>ශාස්ත්‍රවේදී (බාහිර) වැඩසටහන සඳහා ද ප්‍රතිශෝධිත විෂයමාලාව සකස් කරමින් පවතී | පීඨයේ සියලු අභ්‍යන්තර ශිෂ්‍යයන් (වත්මනෙහි 1842)<br><br>ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය හදාරන ශිෂ්‍යයන් (1250ක් පමණ) |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | මාර්ගගත අධ්‍යාපනය, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, තොරතුරු කළමනාකරණ පද්ධතිය පිළිබඳ වැඩමුළු කිහිපයක් පවත්වන ලදී | පීඨයේ ස්ථිර හා තාවකාලික ආචාර්යවරුන් (140ක් පමණ) |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | කොවිඩ් 19 වසංගතයේ සමාජ හා ආර්ථික බලපෑම පිළිබඳ පර්යේෂණ අධ්‍යයන දෙකක් පවත්වා ඒවායේ වාර්තා මාධ්‍ය ඔස්සේ සාමාන්‍ය ජනතාව සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නන් සමග බෙදාහදා ගන්නා ලදී<br><br>අ.පොස.ස උසස් පෙළ උත්තර පත්‍ර ඇගයීමේ ක්‍රියාදාමය සඳහා පීඨයේ අධ්‍යනාංශ හයක් දායක වන ලදී<br><br>කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ ‘‘සදාචාරාත්මක මාධ්‍ය වාර්තාකරණය’’ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙ වෙත ඉදිරිපත් කරන ලදී | අපොස උසස් පෙළ උත්තර පත්‍ර ඇගයීම සඳහා පීඨ සාමාජිකයන්ගේ දායකත්වය රටේ උසස් පෙළ සිසුන් 1,000,000 කඩ වැඩි පිරිසකට උපකාරක වන ලදී<br><br>රටේ සාමාන්‍ය ජනතාව |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | පීඨය ජාත්‍යන්තර වැඩමුළු සහ හවුල්කාරිත්ව වැඩසටහන් කිහිපයකට දායකත්වය ලබා දෙන ලදී<br><br>පීඨය අනුගාමී සයවන වසරටත් ජාත්‍යන්තර සම්මේලනයක් පවත්වන ලදී | ජාත්‍යන්තර ශාස්ත්‍රීය සහ පර්යේණ ආයතනවල පර්යේෂකයන් සහ ආචාර්යවරුන් |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | අධ්‍යාපන, සමාජ සුබසාධන, පරිසර සහ සංස්කෘතික ජාතික සහ පළාත් අමාත්‍යාංශවල ජාතික සහ පළාත් මට්ටමේ විවිධ කමිටුවලට පීඨ සාමාජිකයන් සම්බන්ධ විය | පොදු ජනතාව/ජාතික සහ පළාත් ප්‍රතිපත්ති |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | භූගෝල විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශයට AHEAD ප්‍රදාන ලැබුණි<br><br>දර්ශනශූරී උපාධිය හැදෑරීම සඳහා ආචාර්යවරුන් තිදෙනෙකුට AHEAD ප්‍රදාන ලැබුණි | පීඨයේ සියලුම ශිෂ්‍යයන්<br><br>AHEAD ප්‍රදාන යටතේ ආචාර්ය උපාධිය හදාරන ආචාර්යවරු තිදෙනෙකු |

| වැඩසටහන | **ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු** | **ප්‍රතිලාභීන්/ නිමැවුම** |
|---|---|---|
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | සමාජ විද්‍යා අධ්‍යනාංශය NORHED ප්‍රදානයෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය 2020 වසරේදී නිමාකරන ලදී (2014-2020) | සමාජවිද්‍යා අධ්‍යනාංශයේ NORHED-CPDS ව්‍යාපෘතිය මගින් නිමාකරන ලද ප්‍රකාශන දෙකක් |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | පීඨයේ එක් ආචාර්යවරයකුට NORHED විසින් පශ්චාත් දර්ශනශූරී අධිශිෂ්‍යත්වයක් පිරිනමන ලදී | පීඨයේ එක් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයකු |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | භූගෝල විද්‍යාව සහ දේශපාලන විද්‍යාව හදාරන ශිෂ්‍යයන් සඳහා විශේෂඥයන් විසින් වැඩමුළු 12ක් පවත්වන ලදී | සිය උපාධි වැඩසටහන් සඳහා භූගෝල විද්‍යාව සහ දේශපාලන විද්‍යාව හදාරන සිසුන් 800ක් පමණ |
| | "සංස්කෘතිය, නවීනත්වය සහ සමාජ පරිණාමනය" යන තේමාව යටතේ පීඨයේ 06 වැනි ජාත්‍යන්තර සම්මේලනය පවත්වන ලදී | ආචාර්යවරුන්ට සහ පර්යේෂකයන්ට තම පර්යේෂණ නිමැවුම් බෙදාහදා ගැනීමට ජාත්‍යන්තර සම්මේලනය අත්වැලක් විය |
| | අනුගාමී පස්වැනි වසරටත් රුහුණු කලා සිසුන්ගේ වාර්ෂික සැසි (RASAS-2020) පවත්වන ලදී | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වල මානව සහ සමාජ විද්‍යා පීඨවල තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 400 කට මෙම අධ්‍යාපන සැසිවලින් ප්‍රතිලාභ හිමිවුණි |
| ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් | පීඨය ප්‍රජා සේවා ව්‍යාපෘති 10ක් පවත්වන ලදි | **දකුණු පළාතේ ප්‍රජාව** |
| | ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් ලෙස පීඨය විවිධ විෂයයන් සඳහා ගුරුවරුන් රාශියකට පුහුණුව සපයන ලදී | **පාසල් ගුරුවරුන් 300ක් පමණ** |
| සබැඳි වැඩසටහන් | සමාජීය විද්‍යා අධ්‍යනාංශය නෝර්වේ,නේපාලය සහ පාකිස්ථානයේ විශ්වවිද්‍යාල තුනක් සමග සිය සබැඳි වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී | |
| | ආර්ථික විද්‍යා අධ්‍යනාංශය නෝර්වේහි ඇග්ඩර් විශ්වවිද්‍යාලය සමග සිය සබැඳි වැඩසටහන දිගටම පවත්වා ගෙන යන ලදී | |
| | භූගෝල විද්‍යා අධ්‍යනාංශය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමග හවුල්කාරිත්ව ඇතිකර ගන්නා ලදී | **උපාධි සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයන්** |
| | යුරෝපීය උසස් අධ්‍යාපන ආයතන 06ක් සහ ජාතික උසස් අධ්‍යාපන ආයතන 03ක් සමග හවුල්කාරිත්වයෙන් Erasmus + වැඩසටහන් දෙකක් සඳහා පීඨයට අනුමතිය ලැබුණි | |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 10 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 37 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 14 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 46 |
| පොත් | 14 |
| පොත්වල ඡේද | 13 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 41 |
| සංස්කරණ කාර්යයන් | 16 |
| **එකතුව** | **194** |

# කළමනාකරණ සහ මූල්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධි වැඩසටහන දේශීයව මෙන්ම ජාත්‍යන්තරවද ව්‍යාපාර කළමනාකරණ වෘත්තියේ මතුවෙමින් පවතින අවශ්‍යතා සපුරාලීමට හැකි වඩා ඉහළ මට්ටමේ උපාධිධාරීන් බිහිකිරීම අරමුණු කර ඇත. පීඨයේ සියලු උපාධි වැඩසටහන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 6 වන මට්ටමේ ස්ථානගත සිවි අවුරුදු ගෞරව උපාධි වැඩසටහන් වේ. මෙම වැඩසටහන් හැදෑරීම මගින්, නූතන ව්‍යාපාර පරිපාලන විෂය ක්ෂෙත්‍රය හැඩගස්වන සාධක අවබෝධ කරගැනීමට සහ කළමනාකරණය කිරීමට අවශ්‍ය කරනු ලබන සන්නිවේදන කුසලතා, විශ්ලේෂණාත්මක කුසලතා සහ ගැටලු විසඳීමේ කුසලතා සමගින් විශේෂඥතා ක්ෂෙත්‍ර හතරකට අදාළ (එනම් ගිණුම්කරණය, ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය) මූලික සංකල්ප, න්‍යාය සහ ශිල්පීය ක්‍රම ශිෂ්‍යයන් ඉගෙන ගනු ඇත. තවද, ආරක්ෂා කළ හැකි තර්ක ගොඩනැගීමේදී, අනිවාර්ය ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතිය යාවජීව ඉගෙනුම් කුසලතා හා නිපුණතා ප්‍රවර්ධනය කරන අතර සීමාවාසික පුහුණුව ශිෂ්‍යයන් ලබාගෙන ඇති දැනුම, කුසලතා හා ආකල්ප ආයතනික පරිසරයක් තුළ කෙසේ ආදේශ කරන්නේද යන්න පිළිබඳ අත්දැකීම් ලබාදෙමින් ශිෂ්‍යයන් කර්මාන්තයට නිරාවරණය කරයි.

පීඨය නිරන්තර පදනමකින් තම උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කරන අතර විශ්වවිද්‍යාල සංයුක්ත සැලැස්ම-2023හි නිශ්චිතව දක්වා ඇති ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ප්‍රයත්න දරයි. පහත වගු 2020 වසරේ සාධන පිළිබඳ විස්තර සපයයි.

## පීඨ සමාලෝචනය

කළමනාකරණ හා මූල්‍ය පීඨයට ව්‍යාපාර කළමනාකරණ (ගෞරව), මූල්‍ය විද්‍යාව (ගෞරව) සහ ව්‍යාපාර නීතිය (ගෞරව) යන උපාධි පාඨමාලා තුන සඳහා අනුමැතිය හිමි විය. නව අධ්‍යයන අංශ දෙකක් සඳහා එනම් ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය දෙපාර්තමේන්තුව සඳහාද අනුමැතිය හිමි විය. මෙයට අමතරව පීඨයේ සියළුම උපාධි අපේක්ෂකයින් සඳහා UTEL (University Test of English Language) සමගාමීව ඉංග්‍රීසි භාෂා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් පීඨය ආරම්භ කරන ලදි. නව උපාධි මාලා දෙකක් සඳහා විෂය මාලාව සකස් කිරීම [එනම් සංචාරක ව්‍යාපාරය (ගෞරව) සහ සැපයුම් දාම කළමනාකරණය (ගෞරව)] ආරම්භ කර ඇති අතර එම වැඩසටහන් 2022 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

පීඨය විසින් නව මාර්ගගත පාඨමාලාවක් වන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් විශ්වවිද්‍යාල දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හරහා හඳුන්වා දී ඇති අතර අලෙවිකරණය ඩිප්ලෝමා පාඨමාලාව මාර්ගගත වැඩසටහනක් ලෙසද නැවත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එම පීඨය තුළ ව්‍යාපාර පරිපාලනය තුල පශ්චාද් උපාධි ඩිප්ලෝමාව, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති සහ ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති සහ පශ්චාද් උපාධි පාඨමාලා තුන ක්‍රියාත්මක වන අතර පීඨය විසින් MPhil සහ ආචාර්ය උපාධි සඳහාද දායක වේ.

විශ්වවිද්‍යාල සේවක සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන CCPDHE වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා සියළුම අලුතින් බඳවා ගන්නා අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයන් පීඨය විසින් උනන්දු කරවයි. මෙම පීඨය විසින් එම වැඩසටහනේ ඒකක දෙකක් සඳහා දායක වෙමින් විශ්වවිද්‍යාලය තුළ උගතුන් බිහි කිරීමට දායක වේ. අධ්‍යයන කාර්යය මණ්ඩලය උසස් පෙළ ප්‍රධාන පරීක්ෂකවරු ලෙස මෙන්ම අවශ්‍ය පරිදි විෂය නිර්දේශ සමාලෝචන ක්‍රියාවලියටද දායක වේ. තවද පීඨයේ බොහෝ කාර්යය මණ්ඩල සාමාජිකයින් දකුණු පළාත් උපාධිධාරී යෝජනා ක්‍රමයේ පුහුණු වැඩසටහන සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගී වී ඇත. අමතරව, රූපවාහිනී අයි නාලිකාව සහ නේත්‍රා රූපවාහිනිය ඔස්සේ විකාශනය වන “ගුරු ගෙදර අධ්‍යාපන වැඩසටහන්” (උසස් පෙළ ගිණුම්කරණ විෂය) වැඩසටහන් දහයක්ද පීඨ කාර්යය මණ්ඩලය විසින් පවත්වා ඇත (මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය එක්ව සංවිධානය කරන ලදි). ප්‍රාදේශීය සංවර්ධව බැංකුවේ මාතර ප්‍රාදේශීය ශාඛාව සමඟ ප්‍රජා සංවර්ධනය යටතේ සුභසාධන ව්‍යාපෘතියකට දායක වී ඇත(ව්‍යාපෘතියේ නම : “මාතර ඉසුරු ඇඹුල් තියල්”). තවද සයන්ස්පීඩියා ටිකට් පොත එල්ටොන්ස් නවෝත්පාදන සම්මාන උළෙලේ අවසන් පස්දෙනා පීඨය නියෝජනය කරන ලදි (රටවල් 65ක් අතරින්).

[කේම්බ්‍රිජ් තක්සේරු ඉංග්‍රීසි සමඟ එක්ව දේශීය නව නිපැයුම් සඳහා වූ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ එල්මන් සංවිධානය].

AHEAD වැඩසටහන යටතේ ELTA ELSE පීඨ ප්‍රධානය පීඨයේ ඉගැන්වීමේ හා ඉගෙනීමේ පරිසරය මාර්ගගත ඉගැන්වීමේ පහසුකම්, පරිගණක විද්‍යාගාරය, භාෂාගාරය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා හිමිවිය. ඊට අමතරව AHEAD වැඩසටහන සඳහා ආචාර්ය උපාධි පහක් පමණ ඇත. මෙම පීඨය 2020 වසරේදී කළමනාකරණය සහ ආර්ථිකය පිළිබඳ නවවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සහ උපාධි පර්යේෂණ සංසදය පැවැත්විය.

පීඨයේ කාර්යය මණ්ඩලය සමස්ථයක් ලෙස පීඨයේ සහ විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම්, පර්යේෂණ හා පරිපාලන කටයුතු සඳහා කැපවී කටයුතු කරයි.

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 08 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 20 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 04 |
| **එකතුව** | **35** |

# වෛද්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

**පළමු මාස දෙක වැදගත් සිදුවීම්වලින් තොරවූ අතර අධ්‍යයන කටයුතු මැනවින් සිදුවෙමින් පැවැතුණි.**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 මාර්තු 13 වන දින විශ්වවිද්‍යාලය සහ පීඨය මාස දෙකක් සඳහා වසා දමන ලදී. මුල් වසා දැමීමෙන් පසුව, විවිධ කාණ්ඩවල වෛද්‍ය ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන්හි ප්‍රමුඛතාව අනුව කඩින් කඩ පීඨය විවෘතකරනු ලැබීය. මෙම කාලසීමාව තුළදී අවහිරයකින් තොරව සායනික පත්වීම් පවත්වාගෙන යාමට උපරිමව උත්සාහ දරනු ලැබූ අතර 36 වැනි ශිෂ්‍ය කාණ්ඩය සඳහා වෛද්‍ය උපාධි අවසාන විභාගය සාර්ථකව පවත්වා 37වැනි ශිෂ්‍ය කාණ්ඩය නියමිත කාලය තුළ නියම කරනු ලැබූ පරිදි වෛද්‍ය උපාධි අවසන් විභාගය සඳහා පෙනී සිටීමට සූදානම් කරන ලදී. ඉගැන්වීම් කටයුතු බොහෝමයක් මාර්ගගත ක්‍රමවේදයන්ට පරිවර්තනය කරනු ලැබූ අතර අවදානම් අවම කරමින් අවසාන විභාග සඳහා අවශ්‍ය කරනු ලබන අත්‍යාවශ්‍ය ප්‍රායෝගික සැසි සම්පූර්ණ කිරීම පිණිස ශිෂ්‍ය කාණ්ඩ කඩින් කඩ ගෙන්වා ගැනීම සඳහා ප්‍රවේශයක් පීඨය සකස් කරන ලදී. මෙම කාලසීමාව තුළ, සැලකිය යුතු ප්‍රමාදවීම්වලින් තොරව පාඨමාලා ඇගයීම් ඇතුළුව සියලු විභාග සාර්ථකව පැවැත්වීමට අපට හැකි විය. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් මාසයේදී ශිෂ්‍යයන් හය දෙනෙකු කොවිඩ්-19 ධනාත්මක වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත නේවාසිකාගාරයම නිරෝධායන ප්‍රදේශයක් බවට පත්කර පීඨය විසින් කළමනාකරණය කරනු ලැබූ අතර එමගින් අභ්‍යන්තර පැතිරීම සාර්ථකව වළක්වාලන ලදී.

**කාර්ය මණ්ඩලය**

පහත දැක්වෙන සාමාජිකයන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් ලෙස උසස් කරන ලදී.
කායික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය මහින්ද කොම්මලගේ මහතා
වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය කේ.ඩී.පතිරණ මහතා

පහත දැක්වෙන සාමාජිකයන් මහාචාර්යවරුන්/සහාය මහාචාර්යවරුන් ලෙස උසස් කරන ලදී.
ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය එම්.එම්.ඒ.ජේ. කුමාර මහතා
කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශයේ ආචාර්ය සමරවික්‍රම මහතා

**පහත දැක්වෙන සාමාජිකයන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු 1 ශ්‍රේණියට උසස් කරන ලදී.**

භිෂග්වේද අධ්‍යයනාංශයේ ආචාර්ය පී.එල්.ජී.සී. ලියනගේ මයා
කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශයේ ආචාර්ය එල්.බී.එල්. ප්‍රබෝධ මයා
ජෛවරසායන විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය සී.එම්. වික්‍රමතිලක මයා
ජෛවරසායන විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ඒ.පී. අත්තනායක මයා
නාරිවේද හා ප්‍රසවවේද අධ්‍යයනාංශයේ ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක මයා

පහත දැක්වෙන සාමාජිකයන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු II ශ්‍රේණියට උසස් කරන ලදී.

ප්‍රජා වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය පී.එල්.ඒ.එන්. ලියනගේ මයා
වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය පී.පී.ඩබ්.ඩී. ද සොයිසා මයා
ක්ෂුද්‍ර ජෛවවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය එස්.එස්. වික්‍රමසිංහ මිය
ප්‍රජා වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය කේ.කේ. ඩබ්.ජේ. සී ද සිල්වා මයා

පීඨය අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයක් කිහිප දෙනෙකු බඳවාගත් අතර ඒ අතුරින් නව ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් එක් අයකු සහ නව ආධුනික කථිකාචාර්යවරුන් එක් අයකු මේ වන විටත් රාජකාරී බාරගෙන ඇත.

ආචාර්ය එස්.ඒ. මෙන්ඩිස් මහතා ආධුනික කථිකාචාර්යවරයකු ලෙස භිෂග්වේද අධ්‍යයනාංශයට එක් විය.
ආචාර්ය කේ.පී.වී.ආර් ද සිල්වා මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයට එක් විය.

2020 වසරේ අනධ්‍යයන කාණ්ඩයේ නව බඳවා ගැනීම් සිදු නොවීය.

වෛද්‍ය පීඨයේ වසර 30ක අඛණ්ඩ සේවා කාලයකින් පසුව මහාචාර්ය කේ.ජී. සෝමසිරි මහතා විශ්‍රාම යන ලදී.

මහාචාර්ය මැණික් හෙට්ටිහේවා මහත්මිය වසර 25ක් සේවය කිරීමෙන් පසුව භිෂග්වේද අධ්‍යනාංශයේ ඇගේ තනතුරින් විශ්‍රාම යන ලදී.

**අධ්‍යයන කාර්යමණ්ඩලයේ ජාතික දායකත්වය**

පීයාධිපති මහාචාර්ය වසන්ත දේවසිරි මහතා ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති ලෙස 2020 ජනවාරි මාසයේදී පත්කරන ලදී.

මහාචාර්ය සුජීව අමරසේන මහතා කොවිඩ්-19 පාලන ජනාධිපති කාර්යසාධක බලකායේ සාමාජිකයකු ලෙස පත්කරන ලදී.

මහාචාර්ය මධු වික්‍රමතිලක මිය ශ්‍රී ලංකා පෝෂණ සංගමයේ සභාපතිණිය ලෙස පත්කරන ලදී.

**සම්මාන**

ලැබුණු ඉහළම ප්‍රදාන සංඛ්‍යාවෙ වෙනුවෙන් මහාචාර්ය චන්න යහතුගොඩ මහතා උපකුලපති සම්මානය දිනාගන්නා ලදී.

මහාචාර්ය මංජුල හෙට්ටිආරච්චි මහතා 2019 වසරේ විශිෂ්ඨතම විද්වතා සම්මානය දිනාගන්නා ලදී.එය 2020 වසරේදී ප්‍රදානය කරනු ලැබීය.

**පර්යේෂණ ප්‍රදාන**

මෙම කාලසීමාව තුළ පහත දැක්වෙන ආචාර්යවරුන් පර්යේෂණ ප්‍රදාන දිනාගන්නා ලදී.

ආචාර්ය ගයා විජේරත්න වෙත ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානය හිමි විය.
''ජා.ප.සභාවේ ක්ෂණික ප්‍රතිචාර ප්‍රදාන- කොවිඩ්-19 ට එරෙහි පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම්''
ආචාර්ය ගයා විජේරත්න-ප්‍රදාන ඝාමාජික- ජා.ප.ස. CVD 20-07
මාතෘකාව- ''කොවඩ්-19 ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ කොවිඩ් -19 ආවේක්ෂණය''

ආචාර්ය නයනි වීරසිංහ මහත්මියට ජා.ප.ස. ප්‍රදානය හිමි විය.

''ජා.ප.සභාවේ ක්ෂණික ප්‍රතිචාර ප්‍රදාන- කොවිඩ්-19 ට එරෙහි පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම්''
ආචාර්ය නයනි වීරසිංහ මහත්මිය -ප්‍රදාන අංකය - NRC CVD 20 – 08
මාතෘකාව- ශ්‍රී ලංකාවේ ප්‍රජාවේ උපකුලකයක කොවිඩ්-19 සහ අවදානම් සාධකවලට නිරාවරණය වීමට ඇති හැකියාව''

**යටිතල පහසුකම් සංවර්ධනය**

බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමට සැලසුම් කරමින් පීඨය AHEAD අරමුදලින් වෙන්කරනු ලැබූ රු. මිලියන 30 ඒ සඳහා යොදා ගනු ලැබීය. විද්‍යාගාර පහසකම් වැඩි දියුණු කිරීමට සහ පූර්ව සායනික අධ්‍යනාංශවල නිබන්ධන පංති කාමර උත්ශ්‍රේණි කිරීම පිණිස එම මුදල් යොදා ගන්නා ලදී.

2020.02.21 දින පවත්වනු ලැබූ සරල උත්සවයකදී විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා මහාචාර්ය වාට්ටු සංකීර්ණය සඳහා මුල්ගල තබනු ලැබීය. මහාචාර්ය වාට්ටු සංකීර්ණය සඳහා වෙන්කළ මුදල අගය එකතු කළ බද්ද සමග රු.1,138,355,200.00 ක් වූ අතර ඉදිකිරිම් කටයුතු 2020 දෙසැම්බර් මාසයේ ආරම්භ විය.

යෝජිත මහල් දොළහකින් යුතු ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත්තුව මධ්‍යම ඉංජිනෙරු උපදේශන කාර්යාංශයට ප්‍රදානය කරනු ලැබූ අතර මුල් සැලසුමේ අන්තර්ගත නොවූ විභාග පැවැත්වීමේ සහ නිපුණතා සංවර්ධන පහසුකම් සැපයීම පිණිස යෝජිත වෙනස්කම් සිදුකිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වුණි.

ක්‍රීඩා පිටියක් සහ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම පිණිස පීඨය ගාල්ල පින්නදූවේ කෙසෙල්හෙන නම් අක්කර තුනක ඉඩමක් පීඨය පවරා ගත් අතර නේවාසිකාගාර, නිල නිවාස සංවර්ධනය කිරීමට තවත් අක්කර 3ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී. ඒ සඳහා වෙන්කළ මුදල රු. 13,285,750.00 ක් වූ අතර 2020 වසර අවසාන භාගයේදී ඉදිකිරීම් කටයුතු යළි ආරම්භ විය.

**වාර්ෂික ශාස්ත්‍රීය සැසි**

රටේ පැවැති තත්ත්වය හේතුවෙන් පීඨය සිය වාර්ෂික ශාස්ත්‍රීය සැසි නොපවත්වන ලදී.

**ක්‍රීඩා කටයුතු**

බොහෝ ක්‍රීඩා ක්‍රියාකාරකම් අවලංගු කිරීමට පීඨයට සිදුවූ නමුත් ක්‍රීඩා කටයුතුවල ගුණාත්මකබව ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

**වැඩසටහන් සමාලෝචනය**

පීඨයේ වැඩසටහන් සමාලෝචනය 2020 ජනවාරි මාසයේදී පැවැත්වූ අතර එහිදී C ශ්‍රේණිය හිමිවිය. ඌණතා හඳුනාගැනීමට සහ සමසත් තත්ත්ව ආරක්ෂණ ක්‍රියාදාමය ප්‍රතිව්‍යුහගත කිරීමට පීඨය ධනාත්මක පියවර ගෙන ඇත. ක්‍රියාකාරී සැලැස්ම තත්ත්ව ආරක්ෂණ කවයේ අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අදහසින් වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

**විෂයමාලා සංශෝධනය**

විෂයමාලා සංශෝධන කටයුතු 2020 වසර තුළ සාර්ථකව පවත්වාගෙන යනු ලැබූ අතර එම ක්‍රියාදාමය මේ වන විට අවසන් අදියරට පැමිණ තිබේ. මෙම කාලසීමාව තුළ පීඨයේ සක්‍රීය සහභාගිත්වය පැවැති අතර වැඩමුළු 10 ක් පවත්වන ලදී.

දැනට පවතින අභිතකර තත්ත්වයන් මධ්‍යයේ වුවද මෙම කාලසීමාව තුළ පුනරුත්ථාපන ක්‍රියාකාරකම් රැසක් නිමාකළ අතර ජ්‍යෙෂ්ඨ පොදු කාමරය හා පීඨාධිපති කාර්යාලය වැඩි දියුණු කිරීම, සායනික විමර්ශන ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම මගින් කාර්යාල භූමිය පුළුල් කිරීම සහ ප්‍රධාන විදුලි පැනල ප්‍රතිස්ථාපනය කිරීම ඊට ඇතුළත් විය.

තවත් නව ක්‍රියකාරකමක් වූයේ බහුවරණ පිළිතුරු පත්‍ර ඇගයීම අතින් සිදුකිරීම වෙනුවට OMR ක්‍රමය මගින් සිදුකිරීමයි.

කළමනාකරණ තොරතුරු පද්ධතිය උත්ශ්‍රේණි කරනු ලැබූ අතර වාර්ෂික ලියාපදිංචිය සහ විභාග සඳහා ලියාපදිංචිය ක.තො.ප. හරහා සිදුකිරීමට නියමිතය.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම් / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | ජාන සායන, මාතෘ හා ළමා සෞඛ්‍ය සායන, පාසල් වෛද්‍ය පරීක්ෂා කිරීම්, පවුල් ප්‍රතිකාර සායන, චර්මවේදී සායන පවත්වන ලදි | සාමාන්‍ය ප්‍රජාව සහ රෝගීන් |
| | ජන්ම ඌනතා වැළැක්වීම පිළිබඳ අත්පොත පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට බෙදාහැරීම | |
| | ආතති කළමනාකරණය සහ කෝපය පාලනය පිළිබඳ වැඩසටහන් | කලේගාන sos ළමා ගම්මානයේ ළමුන් |
| | මහජන සෞඛ්‍ය පරීක්ෂක අභ්‍යාසලාභීන් සඳහා ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ දේශන පවත්වන ලදි | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු |
| | පරපෝෂවේද රෝග නිර්ණය සඳහා මල නියැදි පරීක්ෂාව, මැලේරියා රෝගීන් සඳහා තුනී සහ ඝන පටල පරීක්ෂණ සහ ප්‍රතිදේහ පරීක්ෂණ, testing body aspirates සහ මූත්‍රා සාම්පල පරීක්ෂාව | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | ත්‍රිමාණ වසා තාක්ෂණ පරීක්ෂණ | 1500 කට අධික පාද වල ත්‍රිමාණ වසා තාක්ෂණ පරීක්ෂාවන් සිදුකරන ලදි. මාස 20, මාස 22 සහ මාස 24 පසු විපරම් සම්පූර්ණ කරන ලදි |
| | කරාපිටිය ශික්ෂණ රෝහලේ හානිකර ඖෂද ප්‍රතික්‍රියා පිළිබඳ වාර්තා කිරීම | රෝගීන්, වෛද්‍යවරු<br>නිමැවුම: හානිකර ඖෂද ප්‍රතික්‍රියා පිළිබඳ වාර්තාව |
| | | සොයාගත් කරුණු ගාල්ල වෛද්‍ය සංගමයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසිවලදී වාචිකව ඉදිරිපත් කිරීම |
| | පටක ව්‍යාධිවේදී සේවා කර්තව්‍ය, සෛල විද්‍යා හා ප්‍රතිශක්ති පටක රසායන විද්‍යා සේවා කර්තව්‍ය | මහාචාර්යවරු, සායනික සේවාවන්හි රෝගීන් |
| | මුත්‍රා වල ද්විරූපී රතු සෛල | |
| | කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් පවත්වන ලදි | අක්මීමන සෞඛ්‍ය හා වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වෛද්‍යවරු, හෙදියන් සහ පවුල් සෞඛ්‍ය සේවක කාර්ය මණ්ඩලය |
| | ගර්භණී මව්වරුන් සඳහා "ගැබිනි මවට ඔවදනක්" නමින් පොතක් රචනා කරන ලදි | ගැබිනි මව්වරුන් |
| | විශ්වවිද්‍යාල ශල්‍ය වෛද්‍ය ඒකකයේ වාට්ටු අංක 3 හා 5 හි රෝගීන් සඳහා සත්කාරක සේවා, බාහිර රෝගී සායන, අපස්ථිත ශිරා සායන සහ ආමාශයික අන්තරීක්ෂණ සේවා | වෛද්‍ය සිසුන්, පශ්චාද් උපාධි සිසුන් සහ රෝගීන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | පවතින විෂයමාලාව නැවත තක්සේරු කරන ලද මොඩියුල ක්‍රමයක් බවට පරිවර්තනය කරමින් නව විෂය මාලාවක් සකස් කිරීමට සහභාගී වූ අතර ඉගෙනුම් ප්‍රතිඵල සහ තක්සේරු කිරීම් නැවත නිර්වචනය කරන ලදි. වෘත්තීය සහ පෞරුෂ වර්ධනය පිළිබඳ මොඩියුලයක් හඳුන්වා දෙන ලදි, ඖෂදවේදය | වෛද්‍ය සිසුන් ක්‍රියාවලියේ 80% ක් පමණ සම්පූර්ණ කර ඇත |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | සම්මත ක්‍රියා පටිපාටිය පුහුණුව පිළිබඳ වැඩමුළුව සහ වෛද්‍ය පීඨයේ 2020 අගෝස්තු 13 වැනි දින ආචාර ධර්ම අනුමැතිය ප්‍රදානය කිරීම පිණිස යෝජනාවක් සමාලෝචනය කිරීමේ සම්පත්දායක | පර්යේෂකයින් |
| | නියැදි හසුරුවීම සහ අපද්‍රව්‍ය බැහැරකිරීම ඇතුළුව කොවිඩ්-19 RT PCR පරීක්ෂණ සිදුකිරීමේදී අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ දේශනයක් පවත්වන ලදී | කාර්ය මණ්ඩලය |
| | තත්ත්ව කළමනාකරණය - ප්‍රතීතනය සුරක්ෂිතතාව සහ විද්‍යාගාර පරීක්ෂණ | කාර්ය මණ්ඩලය |
| | මහමෝදර ශික්ෂණ රෝහලේ විශ්වවිද්‍යාල ඒකකයේ සාමාජිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන සතිපතා පවත්වන ලදී. | විශ්වවිද්‍යාලයේ සහ සෞඛ්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ශ්‍රී ලංකා ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපති ලෙස සේවය කරන ලදි | |
| | පෝෂණ සංගමයේ සභාපති ගාල්ල වෛද්‍ය සංගමයේ සභාපති ක්ෂුද්‍රජීවී විද්‍යා විද්‍යායතන කවුන්සිලයේ, පෝෂණ සංගමයේ, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ, ශ්‍රී ලංකා ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සාමාජිකත්වය දරන ලදි | ආචාර්යවරුන් සහ මහජන සෞඛ්‍ය සේවා සපයන්නන් |
| | විවිධ සැසි වල ආරාධිත දේශක ලෙස කටයුතු කරන ලදි | |
| | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශයේ COVID 19, RT-PCR පරීක්ෂණ පහසුකම් ස්ථාපිත කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරන ජාතික COVID 19 හඳුනා ගැනීමේ කටයුතු සඳහා දායක වීම |
| | ලංකා මහජන සෞඛ්‍ය අධ්‍යාපන ආයතනයේ ලේකම් සහ සාමාජික ලෙස කටයුතු කරන ලදි | |
| | ශ්‍රී ලංකා විද්‍යාඥයින්ගේ සංගමයේ ලේකම් | |
| | ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සෞඛ්‍ය විද්‍යා ක්‍රියාකාරී කමිටුවේ සාමාජික | |
| | ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ ජෛව ආචාරධර්ම පිළිබඳ කමිටුවේ සාමාජික සහ සභාපති ක්ෂුද්‍ර ජීව විද්‍යා විද්‍යාෙව්දී පශ්චාද් උපාධි ආයතනය, ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය පර්යේෂණ සභාවේ සාමාජික | |
| | පශ්චාද් උපාධි විද්‍යායතනයේ සියළුම අධ්‍යයන මණ්ඩල වල සාමාජික සහ පවත්වනු ලබන විභාග සඳහා පරීක්ෂකවරු ලෙස සහභාගී වීම | |
| | පශ්චාද් උපාධි පුහුණු ක්‍රියාවලියේ පුහුණුකරුවන් ලෙස දායක විය | |
| | රක්තවේදී විෂය මාලාව සැකසීම, රසායනාගාර කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව | |
| | ප්‍රතීතන කමිටු සාමාජිකයෙකු ලෙස රෝහල් සහ රසායනාගාර ප්‍රතීතන ක්‍රියාවලියට දායක වීම | |
| | විද්‍යාගාර ගුණාත්මකභාවය පිළිබඳ ජාතික වැඩමුළුවේ සම්පත් දායක (EHA – SLCH නිබන්ධනය 2020 - ශ්‍රී ලංකාව) | |
| | කාර්මික තක්සේරුකරණය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කමිටු සාමාජික | |
| | පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු වල අධීක්ෂකයින් ලෙස කටයුතු කරන ලදි | |
| | සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාතෘ සෞඛ්‍ය හා පවුල් සැලසුම් පිළිබඳ තාක්ෂණික උපදේශන කමිටුවේ සාමාජික | |
| | ISO 15189 හා QMS තාක්ෂණික අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පවත්වන ලද ජාතික පුහුණු වැඩසටහනේ සම්පත් දායක | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ශ්‍රී ලංකාවේ විශේෂිත කැටි ගැසීම් පරීක්ෂණ සඳහා ජාතික EQA වැඩසටහන සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ විද්‍යායතනය පත්කරන ලද කමිටුවේ සාමාජික<br><br>ජාතික අණුක රසායනාගාරය පිහිටුවීම ඇතුළු රක්ත විද්‍යාවේ අණුක රෝග විනිශ්චය විද්‍යාගාර පිහිටුවීම සඳහා ජාතික තැලසීමියා රෝග විනිශ්චය වැඩසටහන, සෞඛ්‍ය කටයුතු අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ විද්‍යායතනය විසින් පත් කරන ලද අනු කමිටුවේ සාමාජික<br><br>සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රමිති පිළිබඳ රෝහල් ප්‍රතිතන ඕස්ට්‍රේලියානු කවුන්සිලය සඳහා මිනින්දෝරු තනතුර<br><br>ශ්‍රී ලංකාවේ EQuiP 7 පිළිබඳ ACHS සඳහා ජාත්‍යන්තර නියමු අධ්‍යයනයට සහභාගී විය<br><br>ඉන්දියාවේ වන්දිගාර් හි පැවති EHAISHBT නිබන්ධනයේදී (4 වන සැසිවාරය) අධික පරිමාණ සම්පත් වලින් සීමා සහිත සැකසුම් වල රක්තවේද පුහුණුව සහ ශ්‍රී ලංකාවේ රක්තවේද සේවා පිළිබඳ දේශනය ඉදිරිපත් කරන ලදි | ප්‍රසව හා නාරීවේද වෛද්‍යවරු |
| ජාත්‍යන්තර මට්ටමේ දායතක්වය | ඉන්දුනීසියාවේ ආහාර සහ පෝෂණ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ 2 වැනි ISFAN ජාත්‍යන්තර සමුළුවේ සමුළු කථිකයෙකු ලෙස සහභාගී විය<br><br>එංගලන්තයේ රසායන විද්‍යා රාජකීය සංගමය විසින් පවත්වන ලද අත්‍යාප පෝසටර් සැසියට සහභාගී විය. අණුක ව්‍යුහය සහ උපකරණිය ප්‍රවේශ පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ (ICMSI – 2020) ආරාධිත දේශනයක් පවත්වන ලදි<br><br>පෝලියෝ තුරන් කිරීම සඳහා අග්නිදිග ආසියානු කලාපීය සහතිකකරණ කොමිෂමේ සාමාජික<br><br>ශිෂ්‍යයන්ගෙන් අඩක් ජාත්‍යන්තර වන වෛද්‍ය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන වෛද්‍ය මූලික විද්‍යා විද්‍යාපති උපාධි වැඩසටහනේ (මාර්ගගත) ශික්ෂක | පර්යේෂකයින් සහ විද්‍යාඥයින්<br><br>ගෝලීය ජනතාව |
| කමිටු සහ සාමාජිකයන් | ප්‍රධානී ඩියුක් - රුහුණ සහයෝගීතාවය වෛද්‍ය පීඨය<br><br>සභාපති සංස්කරණ මණ්ඩලය රුහුණ විශ්වවිද්‍යාල විශේෂ සිදුවීම්<br><br>ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ තක්සේරුකරු සහ ISO 1518 අනුව රසායනාගාර ප්‍රතිතනය සඳහා විගණන කටයුතු කරන ලදි. SLAB 2020-2022 ප්‍රතිතන කමිටු සාමාජික | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | ස්විඩනයේ ජාත්‍යන්තර විද්‍යා පදනමෙන් ඇ.ඩො. 11800 පර්යේෂණ ප්‍රදානය<br><br>ෆෙයාමිර්ඩ්) පර්යේෂණ ප්‍රදානය (රු 247,000) | ප්‍රජාව, පශ්චාද් උපාධි පුහුණුකරුවන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | දකුණු පළාත් කොවිඩ් 19 ආවේක්ෂණය ආශ්‍රිත පර්යේෂණ සඳහා ජාතික පර්යේෂණ සභාවේ ක්ෂණික ප්‍රතිචාර ප්‍රදානය<br><br>කොවිඩ් 19 ප්‍රතිදේහ සොයාගැනීම පිළිබඳ පර්යේෂණ සඳහා ජාතික පර්යේෂණ සභාවේ ක්ෂණික ප්‍රතිචාර ප්‍රදානය: මුදල රු. 472,450, විද්‍යාත්මක රැස්වීම්/ වැඩමුළු සඳහා ජා.වි.ප ප්‍රදානය<br>නියෝජිතායතනය: TFGH, ඇට්ලන්ටා, ඇ.එ.ජ, LEDoxy ප්‍රදානය: වටිනාකම ඇ.ඩො. 339,662/= | |
| සම්මාන/පේටන්ට්/බලපත්‍ර/විශේෂ සාධන | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ 133වැනි සාංවත්සරික ජාත්‍යන්තර වෛද්‍ය කොංග්‍රසයේදී "භිෂග්වේදය සඳහා හොඳම ඉදිරිපත්කිරීම" සඳහා සම්මානය<br><br>ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ 133වැනි සාංවත්සරික ජාත්‍යන්තර වෛද්‍ය කොංග්‍රසය-2020, විල්සන් පීරිස් සම්මානය<br><br>2020 හොඳම නිබන්ධනය සඳහා සම්මානය : 2020 හොඳම නිබන්ධනය සඳහා සම්මානය "පාසල් ළමුන් අතර ප්‍රති ෆයිලේරියා IgG4 මගින් වුවේරෙරියා බැන්ක්‍රොෆ්ටි ආසාදනය ආවේක්ෂණය සහ ශ්‍රී ලංකාවේ අණුක ක්ෂෙනොමොනිටරින් ක්‍රමවේදය<br><br>ඉදිරිපත්කිරීම සඳහා හොඳම නිබන්ධනය සඳහා සම්මානය: ලීෂ්මානියා ඩොනොවානි මගින් ඇතිකරනු ලබන චර්මීය ලිෂ්මේනියාව සඳහා වැලිමැසි ප්‍රතිඛිට ග්‍රන්ථීය- SG747—IgG ප්‍රතිදේහ පාදක ප්‍රතිශක්ති අවශෝෂක පරීක්ෂා කිරීම සංවර්ධනය කිරීම<br><br>ආචාර්ය සි. පාලසුනේත්‍රම් ත්‍යාගය සඳහා සම්මානය : ලීෂ්මානියා ඩොනොවානි මගින් ඇතිකරනු ලබන චර්මීය ලිෂ්මේනියා රෝගය විනිශ්චය කිරීමේදී විකරණීය නීඩිත PCR-RFLP ක්‍රමවේදයේ රෝග නිර්ණක නිරවද්‍යතාව, වාර්ෂික විද්‍යාත්මක සැසි, ශ්‍රී ලංකා ක්ෂුද්‍ර ජීවවිද්‍යාඥයන්ගේ සංගමය, 2020 අගෝස්තු 13-14<br><br>වාචික ඉදිරිපත්කිරීමේ පළමු ස්ථානය සඳහා සම්මානය : ලීෂ්මානියා ඩොනොවානි මගින් ඇතිකරනු ලබන චර්මීය ලිෂ්මේනියා රෝගය විනිශ්චය කිරීමේදී විකරණීය නීඩිත PCR-RFLP ක්‍රමවේදයේ රෝග නිර්ණක නිරවද්‍යතාව, වාර්ෂික විද්‍යාත්මක සැසි, ශ්‍රී ලංකා ක්ෂුද්‍ර ජීවවිද්‍යාඥයන්ගේ සංගමය, 2020 අගෝස්තු 13-14<br><br>ශ්‍රී ලංකා ව්‍යාධිවේදීන්ගේ සංගමයේ වාර්ෂික විද්‍යාත්මක සැසිවලදී හොඳම වාචික ඉදිරිපත්කිරීම, 2020 ඔක්තෝබර් 15-17, ශ්‍රී ලංකාව<br>අර්ධ පිරි වෙස්ටග්‍රෙන් නල ක්‍රමය සමග සම්මත වෙස්ටග්‍රෙන් නල ක්‍රමය භාවිතයෙන් රක්තානු අවසාදන වේගයේ කාර්යසාධනය සංසන්දනය කිරීම | පර්යේෂණ පාදක දැනුම වැඩිදියුණු කිරීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/පේටන්ට්/බලපත්‍ර/විශේෂ සාධන | ප්‍රධාන ලිපිය (ආරාධනයෙන්) රක්තවේද සඟරාව- ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ සංගමයේ ප්‍රකාශනය- “ කැටිගැසීමේ පරීක්ෂණයේ ගුණාත්මකබව සහතික කරමින් සාර්ථකත්වය සඳහා මග” | |
| | ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ සංගමය- රක්තවේදීන් සඳහා විද්‍යාගාර කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා විෂයමාලාව සංවර්ධනය කරන ලදී<br>ශ්‍රී ලංකා ප්‍රසවවේදීන්ගේ සංගමයේ වාර්ෂික විද්‍යාත්මක කොංග්‍රසයේ තරුණ ප්‍රසවවේදීන්ගේ ඉදිරිපත්කිරීම්වල දෙවන හොඳම නිබන්ධය | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන අභ්‍යන්තර හා දේශීය | ගාල්ල වෛද්‍ය සංගමය විසින් පවත්වනු ලැබූ පර්යේෂණ ක්‍රමවේද වැඩමුළුවේ සම්පත් දායිකාවක් | |
| | ශ්‍රී ලංකා ක්ෂුද්‍ර ජීවවිද්‍යාඥයන්ගේ සංගමයේ සිරි වික්‍රමසිංහ දේශනය 2020 – 2020 පෙබරවාරි 29 : මාතෘකාව- පෝලියෝවලින් තොර ලොවක් කරා - ශ්‍රී ලංකාවේ දායකත්වය | වෛද්‍ය නිලධාරීන් සහ පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් |
| | ආචාරධර්ම සමාලෝචන කමිටුව විසින් පවත්වනු ලැබූ ‘සම්මත මෙහෙයුම් පරිපාටිය සහ පර්යේෂණ ආචාර්ධර්ම’ පිළිබඳ වැඩමුළුවේ සම්පත් දායිකා | පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන |
| | දකුණු පළාතේ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට “මෘදු කුසලතා සංවර්ධනය” පිළිබඳ ඉගැන්වීම සහ අධ්‍යාපනික පුහුණුව-2020 | |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | බූස්ස නාවුක හමුදා රෝහලේ මාසික වර්මවේද සායනයක් පවත්වන ලදී | දකුණු පළාතේ නාවික හමුදා පිරිස් |
| | සංස්කාරක, ගාල්ල වෛද්‍ය | සුවකාරක සහ නිවාරණ අංශයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය |
| | ඩියුක් රුහුණ පර්යේෂණ සහයෝගිතාව යටතේ ග්ලෝබල් හෙල්ත් මාස්ට(ර්)ස් වැඩසටහනේ ශිෂ්‍යයන් අධීක්ෂණය කරන ලදී. | ග්ලෝබල් හෙල්ත් මාස්ට(ර්)ස් උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| | අයිවි වෛද්‍ය විශ්වවිද්‍යාලය, අයිවි, ජපානය | වසා බරවා රෝග ආවේක්ෂණ වැඩසටහන සහ සම්ප්‍රේෂණ ඇගයීම් සමීක්ෂණ සහ CL වැඩසටහන |
| | පරපෝෂවේද අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය | අප විද්‍යාගාරයේ රෝග නිර්ණය කරනු ලැබූ සියලු මැලේරියා රෝගීන් සඳහා කොළඹ වෛද්‍ය පීඨයේ PCR තහවුරුකරණයක් සිදුකරන ලදී |
| | CNTD, නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ ලිවර්පූල් පාසල, එ.රා. | ශ්‍රී ලංකාවේ ආන්ත්‍රික වටපණු ආසාදනය පිළිබඳ ජාතික සමීක්ෂණය |
| | වොෂිංටන් විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ. | වසා බරවා රෝගීන්ගේ මානසික සෞඛ්‍යය පිළිබඳ අධ්‍යයනය |
| | ගෝලීය සෞඛ්‍ය සඳහා කාර්යසාධක බලකාය, ඇ.එ.ජ. | වසා බරවා රෝග ආවේක්ෂණ වැඩසටහන |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 62 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 33 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 30 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 03 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 91 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 64 |
| පොත් | 04 |
| පොත්වල පරිච්ඡේද | 03 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 08 |
| සංස්කරණ කාර්යයන් | 53 |
| **එකතුව** | **351** |

# විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යයනාංශ හයකින් පීඨය සමන්විත වන අතර. විද්‍යා පීඨය භෞතීය විද්‍යා, ජෛවීය විද්‍යා සහ පරිගණක විද්‍යා සඳහා සාමාන්‍ය සහ විශේෂ උපාධි පිරිනමයි.

අළුතින් අනුමත කරනු ලැබූ මූල්‍ය ගණිතය සහ කර්මාන්ත සංඛ්‍යානනය පිළිබඳ නව විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන සඳහා 2019 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය කාණ්ඩය අතරින් ශිෂ්‍යයන් බඳවා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර තිබේ.

විද්‍යාවේදී උපාධිය සහ පරිගණක විද්‍යා උපාධිය යන උපාධි වැඩසටහන් දෙකම සඳහා බඳවාගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකිරීමට පීඨය තීරණය කර තිබේ. 2019 වසරේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දුන් ශිෂ්‍ය කාණ්ඩයෙන් ආරම්භ වී ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීමේ සාරාංශය පහත වගුවෙන් නිරූපණය වේ.

**තිරේක මුළු බඳවාගැනීම් 290 පිළිබඳ තොරතුරු සහිතව එක් එක් වැඩසටහන සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව**

| උපාධි වැඩසටහන | **2018/2019** අධ්‍යයන වර්ෂය දක්වා සිදුකළ බඳවාගැනීම් | **2019/2020** අධ්‍යයන වර්ෂය් සිට යෝජිත බඳවාගැනීම් | එක් එක් වැඩසටහන සඳහා වැඩියෙන් බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| විද්‍යාවේදී උපාධිය (B.Sc.) භෞතීය විද්‍යා ධාරාව, ජෛවීය විද්‍යා ධාරාව | 210 | 300 | 90 |
| | 150 | 250 | 100 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය (BCS) | 50 | 100 | 50 |
| මූල්‍ය ගණිතය සහ කර්මාන්ත සංඛ්‍යානන විද්‍යාවේදී (ගෞරව) උපාධිය | අදාළ නොවේ (*නව වැඩසටහන*) | 50 | 50 |
| එකතුව | **410** | **700** | **290** |

පීඨය තුල සහ ඉන් බාහිර අධ්‍යයන කාර්යමණ්ඩලය සමග ඒකාබද්ධව පීඨය මෙන්ම තනි තනි අධ්‍යනාංශ අයදුම්පත්‍ර ඉදිරිපත් කළ බැවින් උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD)ව්‍යාපෘතිය යටතේ පීඨය ප්‍රදාන කිහිපයක් දිනා ගැනීමට මෙන්ම පීඨය සමත් විය.

විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා යෝජනා අවසන් ලෙස සකස් කිරීමේ ක්‍රියාදාමයේ පීඨය වත්මනෙහි නිරතව සිටින අතර සංශෝධිත යෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන සභාව වෙත ඉදිරිපත් කරනු ඇත. නව ගෞරව උපාධි වැඩසටහන් හඳුන්වාදීම සඳහා යෝජනාවක් පීඨය යළි සලකා බැලූ අතර යෝජිත වැඩසටහන්වල වෙනස්කම් කිහිපයක් සිදුකිරීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදී.

හත්වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය පීඨය සාර්ථකව පවත්වන ලද අතර පීඨයේ සාමාජිකයන් තම පර්යේෂණ අනාවරණ දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන සහ සඟරා තුලින් ප්‍රකාශයට පත් කරන ලදී.
පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ගණනාවකට විවිධ ආයතන වෙතින් සහ ප්‍රදාන යෝජනා ක්‍රම මගින් ප්‍රදාන ගණනාවක් හිමිවුණි.

ඊට අමතරව, පීඨ සාමාජිකයන් විශ්වවිද්‍යාලය තුළ සහ ඉන් බාහිරව විවිධ ආකාරයේ අරමුණු සඳහා විශේෂ කමිටුවල කටයුතු කරන ලදී.
විෂයමාලා සංවර්ධනය, පර්යේෂණ නිමැවුම, ජාතික සේවා, ප්‍රජා සේවා, විශ්වවිද්‍යාල සේවා පිළිබඳ සහ ජාත්‍යන්තර දායකත්වය වෙනුවෙන් එක් එක් අධ්‍යනාංශයේ දායකත්වය පිළිබඳ නිශ්චිත තොරතුරු පහත වගුවල දැක්වේ.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | යෝජිත ගෞරව උපාධි වැඩසටහන සඳහා ආචාර්ය ප්‍රසාද් තාරකා විද්‍යා ක්ෂෙත්‍රයේ නව පාඨමාලා ඒකකයක් එක් කරන ලදී. | විද්‍යා පීඨ ශිෂ්‍යයන් |
| | යෝජිත ගෞරව උපාධි වැඩසටහන සඳහා ලක්ෂ්‍යාන් මහතා "රොබෝ විද්‍යාව වෙත හැඳින්වීමක්" යන නව පාඨමාලා ඒකකයක් එක් කරන ලදී. | විද්‍යා පීඨ ශිෂ්‍යයන් |
| | ආචාර්ය නදීකා රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශයේ බාහිර කථිකාචාර්යවරියක ලෙස සේවය කරන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| | විද්‍යාවේදී උපාධියේ භෞතික විද්‍යා - ප්‍රායෝගික (MLS 1101) පරීක්ෂණයේ පරීක්ෂකවරයකු සහ නිරීක්ෂකයකු ලෙස ආචාර්ය නදීකා කටයුතු කරන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් පවත්වනු ලැබූ වෛද්‍ය රසායනාගාර විද්‍යා වර්ෂාවසාන විභාගය | රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| | විද්‍යාවේදී උපාධියේ භෞතික විද්‍යා - ප්‍රායෝගික (MLS 1101) පරීක්ෂණයේ පරීක්ෂකවරයකු සහ විභාග පරීක්ෂකයකු ලෙස ආචාර්ය නදීකා කටයුතු කරන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් පවත්වනු ලැබූ වෛද්‍ය රසායනාගාර විද්‍යා වර්ෂාවසාන විභාගය | රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| | ආචාර්ය මංජුල සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා ශිෂ්‍යයන් සඳහා ආචාර්යවරයකු සහ පරීක්ෂකවරයකු ලෙස කටයුතු කරන ලදී | සම සෞඛ්‍ය විද්‍යා පීඨය |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, මාතර ඉංජිනේරු තාක්ෂණවේද පීඨයේ ඉංජිනේරු විද්‍යා ගණිතය මට්ටම IV සඳහා බාහිර කථිකාචාර්යවරියක ලෙස සේවය කරන ලදී | මාතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ඉංජිනේරු තාක්ෂණ විද්‍යා ගෞරව උපාධි අපේක්ෂකයන් |
| | ආචාර්ය කේ.ඩී. ප්‍රසංගිකා නිවර්තන ජෛවවිවිධත්ව සහ පාරිසරික පද්ධති 2020 එරස්මස් මුන්ඩුස් ඒකාබද්ධ දර්ශනපති උපාධි වැඩසටහනේ ආරාධිත දේශකයකු ලෙස කටයුතු කරන ලදී | විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | ජෛවතාක්ෂණවේදය පිළිබඳ යෝජිත සහතිකපත්‍ර පාඨමාලාව | ක්ෂුද්‍ර ජීවවිද්‍යාව/ ප්‍රතිශක්ති විද්‍යාව/ අණුක ජීවවිද්‍යාව යන ක්ෂෙත්‍රයන්හි අධ්‍යයන කටයුතුවල නිරත/ සේවය කරන අය |
| ප්‍රජා සේවා | විද්‍යා පීඨයේ ආචාර්යවරුන්ගේ සහයෝගයෙන් ආචාර්ය මහානාම කොවිඩ් සහන අරමුදලක් ආරම්භ කරන ලදී. | කොවිඩ් 19 හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දුන් ශිෂ්‍යයන් 100 දෙනෙකු සඳහා 2020 මාර්තු/අප්‍රේල් මාසවල රු. 5000 ක් පරිත්‍යාග කරන ලදී |
| | කොවිඩ්-19 වසංගතය ආරම්භක සමයේදී උද්භිද විද්‍යා, රසායන විද්‍යා සහ සත්ත්ව විද්‍යා අධ්‍යනාංශවල සහයෝගය ඇතිව විෂබීජ නාශක නිපදවීමේ ව්‍යාපෘතියක් ආචාර්ය මහානාම සංවිධානය කරන ලදී | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | රණතුංග මහතා 2020 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් පවත්වන ලද "සහසක් නිමවුම්" නවෝත්පාදක හා නව නිපැයුම් ප්‍රදර්ශනයේ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදි . | ශ්‍රී ලංකාවේ සියලු නව නිපැයුම්කරුවන් සහ නවෝත්පාදකයන් |
| | රණතුංග මහතා මාතර තරුණ සේවා සභාව විසින් සංවිධානය කරන ලද වාර්ෂික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය 2020 හි විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදි . | දකුණු පළාතේ සියලු නව නිපැයුම්කරුවන් සහ නවෝත්පාදකයන් |
| | ආචාර්ය නදීකා විද්‍යා පීඨයේ සමීපස්ථ ආචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදි. | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | කොවිඩ්-19 පළමු රැල්ලේදී ආචාර්ය මංජුල අසරණ ජනතාවට ආහාර බෙදා දීම, රෝහල් සහ පොලීසිය සහ අනෙකුත් අය සඳහා පුද්ගල ආරක්ෂක උපකරණ කට්ටල සහ මුහුණු ආවරණ බෙදා දීම සඳහා කටයුතු කරන ලදි. | ප්‍රජාව |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී.නන්දනි මිය විද්‍යා පීඨයේ සමීපස්ථ ආචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදි. | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | කේ.සී.එන්. ශාන්තිදේවි මහත්මිය සංස්කෘතික මධ්‍යස්ථාන සම්බන්ධීකාරකයකු ලෙස සේවය කරන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලය |
| | සක්‍රීය පුරවැසි වැඩසටහන මගින් ප්‍රජා ව්‍යාපෘති | පාසල් ශිෂ්‍යයන් |
| | දැනුවත්කිරීමේ වැඩසටහන | වෙරළබඩ වැසියන් |
| | ශ්‍රී ලංකා සුළු ධීවර සම්මේලනයේ කඩොලාන කෞතුකාගාරයේ කඩොලාන දැව අංශය ස්ථාපිත කිරීම | පාසල් ශිෂ්‍යයන්, පරිසරවේදීන්, කෞතුකාගාරයේ සංචාරය කරන සියලු දෙනා |
| | 2020 අප්‍රේල් දක්වා සප්තවාර්ෂික නිවාඩු, කොවිඩ්-19 වංසගත තත්ත්වය හේතුවෙන් සැලසුම්කළ බොහෝ ක්‍රියාකාරකම් සිදුකිරීමට නොහැකි විය. | |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | සිදුකරමින් පවතින: දැනට පවතින උපාධි වැඩසටහන් සංශෝධනය (පරිගණක විද්‍යා උපාධිය), පරිගණක විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී (විශේෂ) උපාධිය සැලසුම් කිරීම | |
| | ප්‍රමාණාත්මක පරිසර විද්‍යාව | උද්භිද විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | සංඛ්‍යානය | උද්භිද විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | විද්‍යා පීඨයේ වැඩබලන පීඨාධිපති ලෙස ආචාර්ය මහනාම මහතා සූම් තාක්ෂණය භාවිතය සහ ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය භාවිතය පිළිබඳ වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදී. | විද්‍යා පීඨයේ ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන් |
| | අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ආචාර්ය මහානාම පාඨමාලා ඒකක අනුරූපණය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. | භෞතික විද්‍යා අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය |
| | මහාචාර්ය යාපා ඒකක දෙකක් උගන්වන ලදී. "විෂයමාලා අනුරූපණය" සහ "වැඩසටහන් සමාලෝචනය" | CCPDHE යටතේ අභ්‍යාසලාභීන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | රුහුණ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද "ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය" පිළිබඳ වැටමුළුවකට ආචාර්ය නදීකා මහත්මිය සහභාගි විය. | විශ්වවිද්‍යාලයේ සියලු කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා ප්‍රයෝජනවත් විය |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ AHEAD ක්‍රියාකාරී කමිටුව විසින් සංවිධානය කරනු ලැබූ "වැඩසටහන් සමාලෝචන ක්‍රියාදාමය සහ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකට" ආචාර්ය නදීකා සහභාගි විය | විද්‍යා පීඨයේ සියලු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා ප්‍රයෝජනවත් විය |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා අධ්‍යනාංශය විසින් පවත්වනු ලැබූ " ඩිජිටල් ආකෘතියෙන් පාඨමාලා සංවර්ධනය සඳහා කුසලතා හා දැනුම වර්ධනය කිරීම" පිළිබඳ ඉ.ක.ක්‍රමවේද වැඩමුළුවකට ආචාර්ය නදීකා මහත්මිය සහභාගිවුවාය | විද්‍යා පීඨයේ සියලු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා ප්‍රයෝජනවත් විය |
| | උසස් අධ්‍යාපන වැඩසටහනේ වෘත්තිමය සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ මොඩියුලය 6 | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | භෞතික විද්‍යා විෂය පිල්සලකුණ ප්‍රකාශනය සඳහා වි.ප්‍ර.කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබූ කමිටුවේ මහාචාර්ය ධර්මරත්න හොබවන ලදී. | භෞතික විද්‍යා උපාධි වැඩසටහනේ කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ ප්‍රමිතිය |
| | මහාචාර්ය ධර්මරත්න ජා.වි.පදනමේ මූලික විද්‍යා ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී | පර්යේෂණ සංවර්ධනය සහ ප්‍රචාරණය, විද්‍යාඥයන්, පර්යේෂකයන් සහ ශිෂ්‍යයන් |
| | මහාචාර්ය ධර්මරත්න භෞතික විද්‍යා සහරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. ශ්‍රීලභෞවිද්‍යා | පර්යේෂණ සංවර්ධනය සහ ප්‍රචාරණය, විද්‍යාඥයන්, පර්යේෂකයන් සහ ශිෂ්‍යයන් |
| | මහාචාර්ය ධර්මරත්න රුහුණ විද්‍යා සහරාවේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන ලදී. | පර්යේෂණ සංවර්ධනය සහ ප්‍රචාරණය, විද්‍යාඥයන්, පර්යේෂකයන් සහ ශිෂ්‍යයන් |
| | භෞතික විද්‍යා අධ්‍යනාංශයේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව මහාචාර්ය ධර්මරත්න 2020.02.12 දක්වා තාක්ෂණ පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරන ලදී | ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය |
| | කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණවේද උපාධි වැඩසටහන් ඇගයීමට ලක්කරන ලදී | තාක්ෂණවේද පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය සහ ශිෂ්‍යයන් |
| | ආචාර්ය මහානාම 2020.02.06 සිට 2020.06.08 දක්වා තාක්ෂණ පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරන ලදී | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් සහ ආචාර්යවරුන් |
| | ආචාර්ය මහානාම භෞතික විද්‍යා අධ්‍යනාංශය් ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී | භෞතික විද්‍යා අධ්‍යනාංශය |
| | ආචාර්ය මහානාම උසස් පෙළ 2020 විභාගයේ පිළිතුරු පත්‍ර ඇගයීමේ ප්‍රධාන විභාග පරීක්ෂකයකු ලෙස කටයුතු කරන ලදී | දිවයිනේ පාසල් ශිෂ්‍යයන් |
| | ආචාර්ය සාරංග බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලදී- සංඛ්‍යාන භෞතික විද්‍යාව | අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ආචාර්ය මහානාම භෞතික විද්‍යා අධ්‍යනාංශයේ ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී | භෞතික විද්‍යා අධ්‍යනාංශය |
| | ආචාර්ය මහානාම උසස් පෙළ 2020 විභාගයේ පිළිතුරු පත්‍ර ඇගයීමේ ප්‍රධාන විභාග පරීක්ෂකයකු ලෙස කටයුතු කරන ලදී | දිවයිනේ පාසල් ශිෂ්‍යයන් |
| | ආචාර්ය සාරංග බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලදී- සංඛයාන භෞතික විද්‍යාව | අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය අ.පොස.ස. (උ/පෙ) සංයුක්ත ගණිතය පිළිතුරු පත්‍ර ඇගයීම 2020 ප්‍රධාන පරීක්ෂකවරියක ලෙස සේවය කරන ලදී. ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ අ.පොස.ස. (උ.පෙළ) විද්‍යාව සහ ගණිතය පුනරීක්ෂණ මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක (නෙස්ටොමෝලට් බුද්ධි ප්‍රබෝදය) සම්පත් දායකයකු ලෙස කටයුතු කරන ලදී | අ.පොස.ස. (උ/පෙ) සංයුක්ත ගණිතය 2020 ශිෂ්‍යයන් |
| | ආචාර්ය කේ.ඩී.ප්‍රසංගිකා මිය අ.පොස.ස. උ/පෙළ 2020 විභාගයේ සංයුක්ත ගණිතය පිළිතුරු පත්‍ර ඇගයීම අධීක්ෂණයේ ප්‍රධාන පරීක්ෂකවරියක ලෙස සේවය කරන ලදී | අ.පොස.ස. (උ/පෙ) 2020සංයුක්ත ගණිතය ශිෂ්‍යයන් |
| | ආචාර්ය බී.ජී.එස්.ඒ. ප්‍රදීප් මහතා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ මාර්ගගත පුනරීක්ෂණ වැඩසටහන 2020 හි සම්පත් දායකයකු විය | අ.පොස.ස. (උ/පෙ) 2020සංයුක්ත ගණිතය ශිෂ්‍යයන් |
| | හලාවත කඩොලාන කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම | කඩොලාන විද්‍යාඥයන් , පාසල් ශිෂ්‍යයන් |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | න්‍යෂ්ඨික පර්යේෂණ සඳහා යුරෝපීය සංවිධානයේ (CERN) CMS පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා භෞතික විද්‍යාඥයන් කණ්ඩායමට මහාචාර්ය ධර්මරත්න නායකත්වය දෙන ලදී. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල පර්යේෂණ සංවර්ධනය කිරීම, භෞතික විද්‍යා අධ්‍යනාංශවල කාර්යමණ්ඩල සහ ශිෂ්‍යයන් |
| | දර්ශනපති වැඩසටහනක් ස්ථාපිත කිරීම (ඉරස්මුස් මුන්ඩාස්) | පරිසර ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමට හේතු කාරක වන පරිදි සහභාගිවන්නන් 1000කට දැනුම ප්‍රචාරණය සහ තිරසර සංවර්ධනය සඳහා උපාය මාර්ග සෙවීම සඳහා මෙහෙයවීම |
| | දේශගුණික විපර්යාස සහ සහ පෙව විවිධත්වය කෙරෙහි එහි බලපෑම පිළිබඳ සම්පත් දායකයකු ලෙස දේශනයක් පැවැත්වීම පිණිස ජාත්‍යන්තර සම්මේලනයකට සහභාගි වන ලදි, කලා වාණිජ සහ විද්‍යා විද්‍යාලය, සොනායි, ඉන්දියාව 2020 | |
| | කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ ලෝක සහරාවේ සංස්කරණ මණ්ඩල සාමාජිකයකු ලෙස 2014 සිට කටයුතු කරයි | |
| | ටෙලර් සහ ෆ්‍රැන්සිස් විසින් ප්‍රකාශයට පත්කරන ලද ශාක ව්‍යාධිවිද්‍යාව සහ ශාක ආරක්ෂාව පිළිබඳ සහරා ලේඛනාගාර සමාලෝචකයකු ලෙස කටයුතු කරන ලදී, 2020 ජූලි 20 (අත් පිටපත අංක. GAPP-2019-0212) | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | මහාචාර්ය ධර්මරත්න තාක්ෂණ පීඨ අධ්‍යයන මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. (2020.02.12 දක්වා) | විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංවර්ධනය, පර්යේෂකයන් සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| | මහාචාර්ය ධර්මරත්න විශ්වවිද්‍යාලයේ තේරීම් කමිටු කිහිපයක සහ සනාතන සභාව සහ පාලන මණ්ඩලය පත්කළ කමිටු කිහිපයක කටයුතු කරන ලදී | විශ්වවිද්‍යාලය, කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන්. අතුරු ව්‍යවස්ථා සමාලෝචන කමිටුව සියලු පීඨවල අතුරු ව්‍යවස්ථා සකස් කරන ලදී |
| | ආචාර්ය මහානාම පර්යේෂණ කමිටු රැස්වීම්වලට සහභාගි විය | විද්‍යා පීඨය |
| | ආචාර්ය මහානාම- තාක්ෂණ පීඨයේ අධ්‍යයන මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | ආචාර්ය මහානාම- පාඨමාලා සම්න්ධීකාරකවරුන්ගේ කමිටු රැස්වීම් | විද්‍යා පීඨය |
| | ආචාර්ය මහානාම- කොවිඩ් 19 ප්‍රතිචාර කමිටු රැස්වීම් | විද්‍යා පීඨය |
| | රණතුංග මහතා RUSTAහි විධායක කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී - සාමාජිකයන් 15 | |
| | ආචාර්ය සාරංග 2020 පීඨ දිනයේ සංවිධායක කමිටු සභාපති ලෙස කටයුතු කරන ලදී. (සාමාජිකයන් 7යි) | විද්‍යා පීඨය |
| | ආචාර්ය සාරංග- කර්මාන්ත පුහුණුව සහ පර්යේෂණ සම්බන්ධීකරණය (සාමාජිකයන් 6යි) | විද්‍යා පීඨය |
| | ආචාර්ය සාරංග -පීඨ ක්‍රීඩා සම්බන්ධීකාරක (රග්බි) | විද්‍යා පීඨය |
| | ආචාර්ය නදිකා රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ‘‘වෛද්‍ය කමිටු’’ සාමාජිකාවක ලෙස කටයුතු කළාය. (සාමාජිකයන් 6යි) | රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සියලු ශිෂ්‍යයන් සඳහා ප්‍රයෝජනවත් විය. |
| | ආචාර්ය නදීකා විද්‍යා පීඨයේ ස්වයං ඇගයීම් වාර්තා ලිවීමේ සහ සාක්ෂි රැස්කිරීමේ කමිටුවේ සාමාජිකාවක ලෙස සේවය කළාය. ( සාමාජිකයන් 11) | විද්‍යා පීඨය |
| | ආචාර්ය මංජුල ‘‘පීඨ දිනය-2020’’ කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. - සාමාජිකයන් 08 | රුහුණ විශ්වවිද්‍යාලය |
| | RISTCON 2021 සංවිධායක කමිටුව | |
| | අවිවිජින්න AHEAD/ICE ප්‍රදානය - දෙවන වසර - රු. මිලියන 40 | |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය RISTCON 2021 කමිටු සාමාජිකාවක වූවාය | විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ වැඩසටහන් සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලිවීම සහ සාක්ෂි එකතුකිරීම පිළිබඳ කමිටුවේ සාමාජිකාවක් වූවාය | විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | ආචාර්ය කේ.ඩී.ප්‍රසංගිකා මිය විද්‍යා පීඨයේ වැඩසටහන් සමාලෝචන කමිටුවේ සාමාජිකාවක ලෙස කටයුතු කරන ලදී | විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | කේ.සී.එන්. ශාන්තිදේවි මිය විද්‍යා පීඨයේ ගණිතය සහ සංඛ්‍යාන කමිටුවේ අනුශාසක සහ ආචාර්ය ධර්ම කමිටුවේ සාමාජිකාවක ලෙස කටයුතු කරන ලදි. - සාමාජිකයන් 7 යි | විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | සභාපති - අන්තර් පීඨ නාට්‍ය, රුහුණ විශ්වවිද්‍යාලය -2020 | |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා විද්‍යා පීඨයේ සම්බන්ධීකාරක | |
| | ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවයේ රුහුණු සේවය සඳහා විශ්වවිද්‍යාලීය සම්බන්ධීකාරක | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් |
| | අනුශාසක, කලා හවුල, විද්‍යා පීඨය | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් |
| | විද්‍යා පීඨ දුක්ගැනවිලි කමිටුවේ සාමාජික | |
| | විද්‍යා පීඨ කොවිඩ්-19 සහන කමිටුවේ සාමාජික | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් |
| | ආචාර්ධර්ම කමිටුව/විද්‍යා පීඨය - සාමාජිකයන් 7 යි | |
| | විද්‍යා පීඨ තත්ත්ව ආරක්ක්ෂණ අනු ඒකක සාමාජික | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- අන්තර්ජාතික | CERN සමග පර්යේෂණ සහයෝගිතාවක් ආරම්භ කිරීම පිණිස මහාචාර්ය ධර්මරත්න විසින් විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබූ අයවැය යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (2018 වසරෙන් ආරම්භ වී පස් අවුරුදු කාලසීමාවක් සඳහා රු. මිලියන 250) මෙම ව්‍යාපෘතිය 2020 දී සාර්ථකව ඉදිරියට පවත්වා ගෙන යන ලදී | විශ්වවිද්‍යාල, භෞතික විද්‍යා අධ්‍යනාංශ, කාර්යමණ්ඩලය සහ පර්යේෂකයන්,පශ්චාත් උපාධිධාරී ශිෂ්‍යාන්, භෞතික විද්‍යා ශිෂ්‍යයන් |
| | FSPI- SEDRIC (ජාත්‍යන්තර) | |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ආචාර්ය මහානාම නායකත්වය දරන AHEAD ICE ව්‍යාපෘති කණ්ඩායම පේටන්ට් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී | භෞතික විද්‍යා අධ්‍යනාංශය |
| | මහාචාර්ය ධර්මරත්න මහතා 51 සහ i10 දර්ශකය 96 පවත්වාගෙන යන ලදී 2020 දෙසැම්බර් 28 දිනට) | රුහුණ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම ඉහළ නංවන ලදී |
| | මහාචාර්ය ධර්මරත්න මහතා වඩා පහසු රුධිර පීඩනය මැනීම සඳහා ොපදු අතේ ඔතන පටිය නිෂ්පාදනය සඳහා එක් දේශීය පේටන්ට් බලපත්‍රයක් සඳහා අයදුම්කර ඇත. පේටන්ට් බලපත්‍රය අපේක්ෂාවෙන් සිටී | වෛද්‍ය ක්ෂෙත්‍රයේ තාක්ෂණික දියුණුව |
| | මහාචාර්ය ධර්මරත්න මහතා 2020 සැප්තැම්බර් 30 දින විශ්‍රාම යන ලදී | මෙය භෞතික විද්‍යා අධ්‍යනාංශයට බලවත් පාඩුවකි |
| | ආචාර්ය ඩබ්.ඒ. මොහොට්ටි මහත්මියට උසස් අධ්‍යාපන ඇකඩමියේ අධිසාමාජිකත්වය හිමිවුණි | |
| | විශිෂ්ඨතම තරුණ පර්යේෂක | |
| | විශිෂ්ඨතම ජාත්‍යන්තර කැඳවුම්කරු | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | රුහුණ විශ්වවිද්‍යාලයේ 16වැනි ශාස්ත්‍රීය සැසිවලට අදාළව හොඳම නිබන්ධන ඉදිරිපත්කිරීම සඳහා සම්මානය 2020 මාර්තු 4 දින හිමිකර ගන්නා ලදි | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේල නඅභ්‍යන්තර හා දේශීය | ආචාර්ය නදීශා මිය 7වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සමුළුවේ (RISTCON 2020) සභාපතිවරිය ලෙස කටයුතු කරන ලදී | ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාල සහ ආයතනවල පර්යේෂකයන් 148 දෙනෙකු තම පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණු ප්‍රකාශයට පත් කර තිබේ |
| | මහාචාර්ය ධර්මරත්න මහතා RISTCON 2020 ට සහභාගි වී උපදේශන මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී | විද්‍යාව ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි පර්යේෂකයන් හා ශිෂ්‍යයන් |
| | මහාචාර්ය යාපා ඉංජිනේරු, සම සෞඛ්‍ය විද්‍යා, කළමනාකරණ සහ තාක්ෂණ පීඨවල නවක ශිෂ්‍යයන් සඳහා "සවිඥානක පුරවැසියෙක් වීම" යන තේමාව යටතේ වැඩමුණ ගණනාවක් පවත්වන ලදී | මෙම පීඨවල සියලු නවක ශිෂ්‍යයන් |
| | නව නිපැයුම් නිපුණතා ඉහළ නැංවීම පිණිස ආචාර්ය ජේ.ඒ.පී.බෝධික මහතා දකුණු පළාතේ විවිධ පාසල්වල ශිෂ්‍යයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් පවත්වන ලදී | දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් |
| | ආචාර්ය කේ.ඩී. ප්‍රසාංගිකා මිය 2020 සැප්තැම්බර් 30 වැනිදා විද්‍යා පීඨයේ පළමු වසරේ සිසුන් සඳහා "ඔබේ චිත්තවේගී චක්‍රය කළමනාකරණය කිරීම" මැයෙන් වැඩමුළුවක් පවත්වන ලදී | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | ආචාර්ය කේ.ඩී. ප්‍රසාංගිකා මිය 2020 ජූනි 12 වැනිදා ගාල්ල මහින්ද විද්‍යාලයේ ගණිත ගුරුවරුන් සඳහා ගණිත වැඩමුළුවක් පවත්වන ලදී | උසස් පෙළ සංයුක්ත ගණිත ගුරුවරුන් |
| | ආචාර්ය බී.ජී.එස්.ඒ. ප්‍රදීප් මහතා 2020 සැප්තැම්බර් 30 වනදා වැඩසටහන් සමාලෝචනය සහ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | ආචාර්ය බී.ජී.එස්.ඒ. ප්‍රදීප් මහතා "ඔබේ පාඨමාලා ඒකකය OBE-LCT මූලධර්ම සමග එකේළි කිරීම" මැයෙන් වැඩසටහනක් පවත්වන ලදී | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | කේ.සී.එන්. ශාන්තිදේවි මිය විෂයමාලා අනුරූපණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී | විද්‍යා පීඨයේ, ධීවර හා සාගර විද්‍යා පීඨයේ සහ සම සෞඛ්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | "ගොවි නැණ - ගෙවතු වගා ජංගම යෙදුම" හඳුන්වාදීම පිණිස දකුණු පළාතේ කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා උපදේශකයන් සමග දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී | |
| | "ගොවි නැණ - ගෙවතු වගා ජංගම යෙදුම" හඳුන්වාදීම පිණිස දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ පැවැති ප්‍රදර්ශනයේ දැනුවත්කිරීමේ වැඩසටහන | සාමාන්‍ය මහජනතාව |
| | දෙබරවැවැව දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ පැවැති ප්‍රදර්ශනයේදී "ගොවි නැණ - ගෙවතු වගා ජංගම යෙදුම" හඳුන්වාදීම පිණිස සජීවී ගුවන්විදුලි වැඩසටහනක් (රුහුණු සේවය) සිදුකරන ලදී | |
| | මාර්ගගත ඉගැන්වීම සඳහා G-Suite සහ Dropbox සමගින් එම කටයුතු ආරම්භකරන ලදී | කාර්යමණ්ඩල සාමාජිකයන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලනඅභ්‍යන්තර හා දේශීය | ආතති කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | ශිෂ්‍යයන් සහ කාර්යමණ්ඩල සාමාජිකයන් |
| | විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන් සඳහා ‘‘ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම’’ පිළිබඳ මාර්ගගත වැඩමුළුව | ශිෂ්‍යයන් සහ කාර්යමණ්ඩල සාමාජිකයන් |
| | කර්මාන්ත දැනුවත්කිරීමේ වැඩසටහන | පරිගණක විද්‍යා අධ්‍යනාංශයේ ශිෂ්‍යයන් |
| | විද්‍යා පීඨයේ ශිෂ්‍යන්ගේ පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම පිළිබඳ මාර්ගගත වැඩමුළුව | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | ඩිජිටල් ආකෘතියෙන් පාඨමාලා සකස් කිරීම සඳහා කුසලතා හා දැනුම ගොඩනැගීම පිළිබඳ ඉ.ක.ප. වැඩමුළුව | කාර්යමණ්ඩලය |
| | උසස් අධ්‍යාපනයේ වෘත්තීය සංවර්ධනය සහතිකපත්‍ර පාඨමාලාව (CCPDHE) | කාර්යමණ්ඩලය |
| | (ජාත්‍යන්තර) VUB, බෙල්ජියම | |
| | ජනමාධ්‍ය සහතිකපත්‍ර පාඨමාලාව යටතේ රුහුණ සේවය ඔස්සේ ‘‘ජනමාධ්‍ය සඳහා සංගීතය’’ නමින් වැඩසටහනක් 2020 මාර්තු 14 දින පවත්වන ලදී | |
| | නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ ධීවර සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020 මාර්තු 13 දින පවත්වන ලදී | |
| | නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020.02.28 දින පවත්වන ලදී | |
| | නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ තාක්ෂණවේද පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020 සැප්තැම්බර් 5 වැනි දින පවත්වන ලදී | |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | මාතර සිංහ සමාජයේ සාමාජිකයකු ලෙස මහාචාර්ය ධර්මරත්න මහතා ප්‍රජා ව්‍යාපෘති කිහිපයකට සහභාගි විය | මාතර ප්‍රදේශයේ ජනතාව සහ සිංහ සමාජය |
| | ආචාර්ය මහානාම මහතා RISTCON 2020 සමාලෝචකයකු ලෙස කටයුතු කරන ලදී | ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රජාව |
| | ආචාර්ය නදීකා මිය RISTCON 2020 සමාලෝචකයකු ලෙස කටයුතු කරන ලදී | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන |
| | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි මිය 2020 දී ශිෂ්‍ය උපදේශකයකු ලෙස කටයුතු කරන ලදි | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | ආචාර්ය කේ.ඩී. ප්‍රසාංගිකා මිය 2020 දී ශිෂ්‍ය උපදේශකයකු ලෙස කටයුතු කරන ලදී | |
| | ආචාර්ය කේ.ඩී. ප්‍රසාංගිකා මිය විද්‍යා පීඨයේ ගණිත හා සංඛ්‍යාන සංගමයේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන ලදී | විද්‍යා පීඨය |
| | RISTCON සහ රුහුණ විද්‍යා සභරාවේ සමාලෝචක | |
| | ජනමාධ්‍ය සහතිකපත්‍ර පාඨමාලාව යටතේ රුහුණ සේවය ඔස්සේ ‘‘ජනමාධ්‍ය සඳහා සංගීතය’’ නමින් වැඩසටහනක් 2020 මාර්තු 14 දින පවත්වන ලදී | |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ ධීවර සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020 මාර්තු 13 දින පවත්වන ලදී<br>නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020.02.28 දින පවත්වන ලදී<br>නවක ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා හැඩ ගැසීම සඳහා වූ වැඩසටහන යටතේ තාක්ෂණවේද පීඨයේදී ‘‘ජීවිතය සඳහා සංගීතය’’ වැඩසටහන 2020 සැප්තැම්බර් 5 වැනි දින පවත්වන ලදී | |
| සබැඳි වැඩසටහන් | ආචාර්ය නදීෂා මීය CMS සහයෝගිතාවයේ සාමාජිකාවකි. Data-MC වලංගුකරණ කළමනාකරුවකු ලෙස කටයුතු කරයි<br>ශ්‍රී ලංකා– CERN සහයෝගිතාව 2018 වසරේදි ආරම්භ විය<br>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග සහයෝගිතාවයෙන් දකුණ පළාත් නව නිපැයුම් හා නවෝත්පාදන තරඟය ආරම්භ කරන ලදී | ශ්‍රී ලංකා විද්‍යාත්මක පර්යේෂණ ප්‍රජාව<br>පර්යේෂකයන් හා භෞතික විද්‍යා ශිෂ්‍යයන්<br>දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 81 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 09 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 11 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 05 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 119 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 17 |
| පොත් | 02 |
| පොත්වල ඡේද | 03 |
| වෙනත් ප්‍රකාශනවල විද්වත් ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය) | 04 |
| සංස්කරණ කාර්යයන් | 16 |
| **එකතුව** | **191** |

# තාක්ෂණ පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

විශ්‍රාම යාම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්.ඩී.ජී. ධර්මරත්න මහතා 2020 පෙබරවාරි 12 වැනි දින තාක්ෂණ පීඨයේ පීඨාධිපති තනතුරින් ඉවත් විය. රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ආරම්භක පීඨාධිපතිවරයා ලෙස ඒ මහතා පීඨය වෙනුවෙන් අනුපමේය සේවාවක් ඉටුකර තිබේ. ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා පීඨයේ නව පීඨාධිපතිවරයා ලෙස රාජකාරී භාරගන්නා ලදී. එයින් ඇබෑර්තු වූ ඉංජිනේරු අධ්‍යනාංශයේ අධිපති ලෙස ආචාර්ය බී.එල්.එස්. තිලකරත්න මහතා පත්කරන ලදී. තවද, ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා බහුශික්ෂණ අධ්‍යනාංශයේ වැඩබලන ප්‍රධානියා ලෙසද කටයුතු කරන ලදී. ආචාර්ය පී.කේ.එස්.සී. ගුණවර්ධන සහ ආචාර්ය වත්සලා රාජපක්ෂ පිළිවෙළින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශයේ සහ ජෛවපද්ධති තාක්ෂණ අධ්‍යනාංශයේ ප්‍රධානීන් ලෙස දිගටම කටයුතු කරමින් සිටී. තාක්ෂණ පීඨයේ සහකාර ලේඛාධිකාරී ආර්.එල්. හෙට්ටිආරච්චි මහත්මිය මාතෘ නිවාඩු ලබා සිටියදී ඇයගේ රාජකාරී ආවරණය කිරීම මගින් ධම්මික ඇඹුල්දෙණිය මහතා පීඨයට සිය සේවය ලබා දෙන ලදී. ආර්.එල්. හෙට්ටිආරච්චි මහත්මිය 2020 ජූනි 1 වනදා නැවත සේවයට වාර්තා කරන ලද අතර සහකාර ලේඛාධිකාරී ලෙස දිගටම කටයුතු කරයි. තාක්ෂණ පීඨයේ සහකාර මූල්‍යාධිකාරී රොමේෂ් කැටිපේආරච්චි මහතා ප්‍රධාන මණ්ඩපයට මාරුවීමක් ලද අතර කෘෂිකර්ම පීඨයේ හිටපු සහකාර මූල්‍යාධිකාරී පී.හේවාරත්න මහත්මිය 2020 ඔක්තෝබර් 9 වැනි දින නව සහකාර මූල්‍යාධිකාරී ලෙස පත්කරන ලදී.

අනපේක්ෂිතව පැතිර ගිය කොවිඩ්-19 වෛරසය හේතුවෙන් මෙම වසරේ පීඨයේ අධ්‍යාපන කටයුතුවලට බාධා එල්ල විය. ලොව පුරා පැන නැගුණු වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු 13 වැනි දින පීඨය දින නියමයක් නොමැතිව වසා දැමීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, පීඨයේ වැඩිදියුණු කරන ලද තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල සහාය ඇතිව, 2020 මාරතු 23 වන දින සිට අන්තර්ජාල වේදිකා භාවිතා කරමින් අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීමට අපට හැකිවිය. විවිධ අධ්‍යයන මට්ටම්වල ශිෂ්‍යයන් විභාග සහ අදාළ ප්‍රායෝගික සැසි සඳහා අවස්ථා කිහිපයකදී පීඨයට කැඳවන ලදී. එසේ පැමිණීමෙන් පසු, අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර ශිෂ්‍යයන් නේවාසිකාගාර තුළ නිරෝධායන ක්‍රියාවලියකට යොමු කරන ලදී. මේ සඳහා විශ්වවිදයාලයේ උපකුලපතිතුමන්ගේ, විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ සහ කඹුරුපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පූර්ණ සහාය හිමිවුණි. අවසන් වසරේ අධ්‍යයන කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව පවත්වා ගෙන යාමට සැලසුම් කරන ලදී. ශිෂ්‍යයන් මට්ටම 4 වර්ෂාර්ධ 1 2020 දෙසැම්බර් මස සම්පූර්ණ කරන ලදී. II වන වර්ෂාර්ධය 2021 ජූනි මාසයේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

තාක්ෂණ පීඨයේ 4වැනි ශිෂ්‍ය කණ්ඩායම 2020 ජනවාරි 29 වැනි දින ඇතුළත් කරගන්නා ලදී. නවක සිසුන් සඳහා පෙර සූදානම් කිරීමේ වැඩසටහන 2020 අප්‍රේල් 9 දක්වා පවත්වා ගෙන යාමට සැලසුම් කරන ලදී. එය අධ්‍යනාංශ විසින් පවත්වන ලද ඉංග්‍රීසි ඉගැන්වීමේ සැසි සහ ප්‍රායෝගික සහ දේශන සැසිවලින් සමන්විත විය. එය 2020 මාර්තු 14 දක්වා සාර්ථකව පවත්වන ලදී. රට අගුලු දමා තිබූ කාලසීමාව තුළ බහුශික්ෂා අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩලය විසින් මාර්ගගත ක්‍රමවේද භාවිතා කරමින් ඉංග්‍රීසි සැසි පවත්වන ලදී. මෙම ශිෂ්‍යයන් සඳහා ඉංජිනේරු තාක්ෂණ, ජෛවපද්ධති සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශ විසින් ද සැසි කිහිපයක් පැවැත්විය.

වෛරසය හා ඒ ආශ්‍රිත ගැටලු පැතිරීම වැළැක්වීම පිණිස යෙදුම් සකස් කිරීමට සූම් සැසි ඔස්සේ තාක්ෂණ පීඨයේ සිසුන් අභිප්‍රේරණය කරන ලදී. ශිෂ්‍යයන් කණ්ඩායම් ලෙස ව්‍යාපෘති සකස් කළ අතර තම ප්‍රායෝගික ගැටලු විසඳාගැනීම පිණිස කාර්ය මණ්ඩලය සමග එලදායී සාකච්ඡා පවත්වන ලදී. ඔවුන් සාර්ථක යෝජනා සකස් කර තිබූ අතර ඇතැමෙක් සිය නිෂ්පාදන සකසා තිබුණි. ශිෂ්‍යයන්ට තම නවෝත්පාදන සහ යෝජනා ඉදිරිපත් කිරීමට ඉඩ සලසමින් පීඨය මාර්ගගත නිෂ්පාදන නිරූපණ සැසියක් පැවැත්විය. FOT INVO 2020 ලෙස නම් කරනු ලැබූ එය ආචාර්ය උදාරි රත්නතුංග මිය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ශිෂ්‍යයන් ඉතා උද්‍යෝගයෙන් ඒ සඳහා සහභාගි වූ අතර කාර්යමණ්ඩලයෙන් යහපත් ප්‍රතිපෝෂණයක් ලබාගන්නා ලදී. ඇතැම් ශිෂ්‍ය කණ්ඩායම් පසුව ‘‘සහසක් නිමවුම් 2020’’ ජාතික තරඟයේදී විශ්වවිද්‍යාල කාණ්ඩය යටතේ සහ අනෙකුත් විශ්වවිද්‍යාල මට්ටමේ තරඟවලදී 2වන සහ 3වන ස්ථාන දිනාගැනීමට සමත්විය.

යටිතල පහසුකම් සංවර්ධනයට සමගාමීව AHEAD ප්‍රදානය යටතේ ලැබුණු අරමුදල් යොදා ගනිමින් බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට තාක්ෂණ පීඨය සැලසුම් සකස් කර තිබේ. විශ්වවිද්‍යා ප්‍රතිපාන කොමිෂන් සභාව විසින් සිදුකළ ඉල්ලීම සැලකිල්ලට ගනිමින් මෙම වසරේ වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම 355 දක්වා ඉහළ නංවනු ඇත. එම ශිෂ්‍යයන් ඉංජිනේරු තාක්ෂණය -165, ජෛවපද්ධති තාක්ෂණය -104 සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය-86 ලෙස අධ්‍යනාංශ තුනක් අතරේ බෙදී යනු ඇත.
පීඨය තුළ විනෝදාස්වාද සහ සංස්කෘතික ක්‍රියාකාරකම්වල නියැලීමට ශිෂ්‍යයන් දිරි ගන්වන අතර ඒ සඳහා අවස්ථා සපයනු ලැබේ. මෙම කටයුතුවලදී බහු ශික්ෂා අධ්‍යයන අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩලය ශිෂ්‍යයන්ට අවශ්‍ය සහාය ලබා දේ, සංගීතය, නර්තනය සහ නාට්‍ය යන ක්ෂෙත්‍ර තුනට අදාළව මාර්ගගත වැඩසටහන් හා

ක්‍රියාකාරකම් පවත්වනු ලැබීය. කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ සහයෝගයෙන් නත්තල් දින වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම් / සංක්ෂිප්ත තොරතුරු | | ප්‍රතිලාභීන්/ නිමැවුම් |
|---|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා(පාඨමාලා ඒකක) | ENT4123 ඉලෙක්ට්‍රොනික පද්ධති නිර්මාණය<br>ENT4132 යන්ත්‍රවල යාන්ත්‍රණ<br>ENT4142 යන්ත්‍ර පිරි සැලැස්ම<br>ENT4212 ක්‍රමලේඛ්‍ය ඩිජිටල් විද්‍යුතය<br>ENT4222 බල විද්‍යුතය සහ යෙදුම් | | ඉංජිනේරු තාක්ෂණ ශිෂ්‍යයන්/ විදුලි යාන්ත්‍රික තාක්ෂණය දැනුමෙහි ප්‍රවීණතාව |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | උසස් පෙළ ප්‍රායෝගික විභාගය සඳහා සහභාගිත්වය<br>ආචාර්ය ඊ.යූ.යූ. රත්නතුංග - සම පාලක විභාග පරීක්ෂක- අ.පො.ස. උසස් පෙළ -ජෛවපද්ධති තාක්ෂණ ධාරාවේ ප්‍රායෝගික විභාගය, 2020<br>චමිල ප්‍රියංකර මහතා- සම පාලක විභාග පරීක්ෂක- සම පාලක විභාග පරීක්ෂක- අ.පො.ස. උසස් පෙළ -ජෛවපද්ධති තාක්ෂණ ධාරාවේ ප්‍රායෝගික විභාගය, 2020 | | අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍යයන් |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | පීඨ මණ්ඩල රැස්වීම් | 34 | පීඨාධ්‍ය, ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලයට අදාළ ගැටලු සාකච්ඡා කරන ලදී |
| | ප්‍රධානීන්ගේ රැස්වීම් | 13 | අංශ/අධ්‍යනාංශවලට අදාළ ගැටලු සාකච්ඡා කරන ලදී |
| | නිවාස කමිටුව | 06 | නවාතැන් පහසුකම් හා නේවාසිකාගාරවලට අදාළ ගැටලු සාකච්ඡා කරන ලදී |
| | උපාධි අධ්‍යයන මණ්ඩලය | 10 | පශ්චාත් උපාධි ශිෂ්‍යයන්ගේ පර්යේෂණ යෝජනා සහ අයදුම්පත්‍ර ඇගයීම<br>අවශ්‍ය තන්හිදී පර්යේෂණ සඳහා ආචාර ධර්ම අනුමතිය<br>ප්‍රගති වාර්තා ඇගයීම සහ ඒවා පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ නිබන්ධන පරීක්ෂකවරුන් ලෙස නාමිතයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම |
| | නව නිපැයුම් හා නවෝත්පාදන කමිටුව | 04 | ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් හා නවෝත්පාදන සලකා බැලීමේ කාර්යය සඳහා |
| | ආපනශාලා,නේවාසිකාගාර සහ ආරක්ෂක කමිටු | 06 | ආපන ශාලාව සම්බන්ධ ගැටලු (තෝරා ගැනීමට ඇති ආහාර, ආහාරවල ගුණාත්මකභාවය) නේවාසිකාගාර සහ ආරක්ෂාව සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම |
| | ක්‍රීඩා උපදේශක කමිටුව | 19 | ඉදිරියේදී පැවැත්වීවට නියමිත ක්‍රීඩා තරඟ ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීම හා එම තරඟ සඳහා ශිෂ්‍යයන් හා කාර්යමණ්ඩලය මෙහෙයවීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | පුස්තකාල කමිටුව | 20 | පුස්තකාලය ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීම |
| | අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක රැස්වීම් | 16 | උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීම |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | | | පාඨමාලා ඒකක අනුරූපණය, පාඩම් සැලසුම් සකස් කිරීම, සමපදස්ථ ඇගැයීම, ස්වයං ඇගයීම ආදිය |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 04 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 03 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 01 |
| **එකතුව** | **08** |

# කොටස VII– සම්මාන සහ විශේෂ සිදුවීම්

## ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන

### 1. 17 වැනි ශාස්ත්‍රීය සැසි 16 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවය

රුහුණ විශ්වවිද්‍යාලයේ 17 වැනි **ශාස්ත්‍රීය** සැසි සහ 16 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවය-2020 – ‘‘සමාජීය යහපැවැත්ම සඳහා නවෝත්පාදන සහ නිර්මාණශීලීත්වය’’ යන තේමාව යටතේ 2020 මාර්තු 4 වැනි දින මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේදී සාර්ථකව පවත්වන ලදී. සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ රුහුණ විශ්වවිද්‍යාලය් උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාය. ‘21වැනි සියවසේ අධ්‍යාපනය, අපේක්ෂා සහ අභියෝග’ මැයෙන් එහි ප්‍රධාන දෙසුම සම්මානිත මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය පවත්වන ලද අතර ආරාධිත දෙසුම සම්මානිත මහාචාර්ය සරත් අමරසිංහ මහතා පවත්වන ලද අතර එහි මාතෘකාව වූයේ ‘සමකාලීන ශ්‍රී ලාංකේය සමාජයේ සමාජීය ගැටලු විසඳීම පිණිස උසස් සමාජ විද්‍යාත්මක පර්යේෂණ’ යන්නයි.

වෙනස් අධ්‍යයන ක්ෂෙත්‍ර යටතේ පවත්වන ලද තාක්ෂණික සහ පෝස්ටර් සැසිවලදී විද්වතුන් හැත්තෑපස් දෙනෙකු තම පර්යේෂණ මගින් අනාවරණය කරගත් තොරතුරු හරහා නව දැනුම් පථ ප්‍රචාරණය කරන ලදී. 16 වැනි උප කුලපති සම්මාන ප්‍රදානෝත්සවයේදී විශිෂ්ඨතම ආචාර්යවරුන් සහ ශිෂ්‍යාන්ගේ හැකියාවන් අගය කරමින් සම්මාන ප්‍රදානය කරන ලදී. එහිදී පහත දැක්වෙන උප කුලපති සම්මාන සහ සම්මාන මහාචාර්යධූරයන් ප්‍රදානය කරන ලදී.

**සම්මානිත මහාචාර්ය**

මහාචාර්ය සරත් අමරසිංහ මහතා - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
මහාචාර්ය එස්. වව්වගේ මහතා - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
මහාචාර්ය පී.ආර්.ටී. කුමාරතුංග මහත්මිය- ධීවර හා සාගර විද්‍යා පීඨය
මහාචාර්ය බී.ජී.නානායක්කාර මහතා - වෛද්‍ය පීඨය

**විශිෂ්ඨතම විද්වතා**
ආචාර්ය මංජුල හෙට්ටිආරච්චි මහතා - වෛද්‍ය පීඨය

**විශිෂ්ඨතම තරුණ පර්යේෂක**
ආචාර්ය සුනන්ද කොඩිකාර - විද්‍යා පීඨය

**විශිෂ්ඨතම ශිෂ්‍ය නව නිපැයුම්කරු /නව්‍යකාරක**
කේ.ටී. මෙත්දසුන් සඳමාල් - තාක්ෂණ පීඨය

**ඉහළම පර්යේෂණ ප්‍රදානලාභීයා**
මහාචාර්ය චන්න යහතුගොඩ - වෛද්‍ය පීඨය

**විශිෂ්ඨතම ජාත්‍යන්තර සම්මේලන කැඳවුම්කරු /ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධක**
ආචාර්ය සුනන්ද කොඩිකාර - විද්‍යා පීඨය

## 2. කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සාකච්ඡා මුළුව - ISAE 2020

කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සාකච්ඡා මුළුව (ISAE) 2020, රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේදී 2020 පෙබරවාරි 14 වැනි දින පවත්වන ලදී. කෘෂිකර්ම පීඨය විසින් සංවිධානය කරනු ලබන ප්‍රධානතම සමුළුවක් වන මෙහිදී ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය කෘෂිකර්මය හා පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් ලොව විවිධ රටවල වෘත්තිකයන් මුණ ගැසෙයි. මෙවර සාකච්ඡා මුළුවේ තේමාව වූයේ *"කෘෂිකාර්මික හා පාරිසරික ප්‍රතිපත්ති යළි අර්ථ නිරූපණය කිරීම: මතුවන නව අභියෝග හා නව දසුන්"* යන්නයි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්ටු මහතායි. පර්යේෂණ තේමා 12කට අදාළ විද්වත් ලිපි 170ක් පමණ එහිදී ඉදිරිපත් කරන ලද අතර සමුළුව සඳහා දේශීය හා ජාත්‍යන්තර සහභාගිකයන් 400 ක් පමණ පැමිණෙන ලදී.

## 3. රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය 2020 RISTCON - 2020)

RISTCON සම්මේලනය විද්‍යා හා තාක්ෂණ ක්ෂෙත්‍රයේ පුළුල් පරාසයක විෂය කරුණු පිළිබඳ පර්යේෂණ අනාවරණ බෙදහදා ගැනීම පිණිස විශිෂ්ඨ සංසදයක් වන අතර විවිධ විෂය ක්ෂෙත්‍රයන්හි සමපදස්ථයන් අතර පර්යේෂණ අන්තර්ක්‍රියා සඳහා නව අවස්ථා උදා කරයි. 7 වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය -2020 රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේදී ජනවාරි 22 දින පවත්වන ලදී. තායිවානයේ ජාතික සින් හුවා විශ්වවිද්‍යාලයේ විශ්ලේෂණාත්මක හා පාරිසරික විද්‍යා ආයතනයේ මහාචාර්ය රු-ඇන් ඛූන් මහතා ප්‍රධාන දේශනය පවත්වන ලදී. සම්මේලනයේ තේමාව වූයේ 'විද්‍යාව හා තාක්ෂණයේ අභිවෘද්ධිය තුළින් තිරසරභාවය' යන්නයි. මේ සඳහා සහභාගි පිරිස 250 ක් පමණ විය.

## 4. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පර්යේෂණ සාකච්ඡා මුළුව (RUFARS - 2020)

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 3වැනි පර්යේෂණ සාකච්ඡා මුළුව (RUFARS 2020) 'පර්යේෂණ හරහා ශාස්ත්‍රීය පූර්ණතාව සහ සාක්ෂරතාව වර්ධනය කිරීම' යන තේමාව යටතේ 2020 ඔක්තෝබර් 2 වැනි දින වෛද්‍ය පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. RuFARS – 2020 ප්‍රධාන දේශනය කොළඹ විශ්වවිද්‍යාලයේ හෙද විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමන් පවත්වන ලද අතර එහි ප්‍රධාන ආරාධිතයා වූයේ රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ය. ඒෙව වෛද්‍යවිද්‍යා සහ සම සෞඛ්‍ය විද්‍යා ආශ්‍රිත නිබන්ධන 60කට වැඩි සංඛ්‍යාවක් එම සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරනු ලැබිය.

## 5. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා රුහුණ ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS) 2020

කොවිඩ්-19 සංදර්භය තුළ නව සාමාන්‍යය තත්ත්වයන්ට අනුගත වෙමින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබූ රුහුණ විශ්වවිද්‍යාලයේ 6වැනි මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS) 2020 නොවැම්බර් මාසයේදී අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගි වූ අතර නව දිල්ලියේ දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය සංඝක පෙරේරා මහතා ප්‍රධාන දේශක ලෙස සැසියට සහභාගි විය. මෙම මාර්ගගත සම්මේලනයේ තේමාව වූයේ 'සංස්කෘතිය, නවීනත්වය සහ සමාජ පරිණාමනය' වූ අතර එය සහභාගිවූවන්ට විෂය ක්ෂෙත්‍ර 10 ක් යටතේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේ විවිධ අධ්‍යයන ක්ෂෙත්‍රයන් පිළිබඳ අදහස් දැක්වීමට වේදිකාවක් නිර්මාණය කරන ලදී.

## 6. රුහුණ කලා ශිෂ්‍යයන්ගේ වාර්ෂික සැසි (RASAS) 2020

රුහුණ කලා ශිෂ්‍යන්ගේ වාර්ෂික සැසි (RASAS) – 2020 අන්තර්ජාල සමුළුවක් ලෙස අනුගාමී පස්වැනි වසරටත් 2020 නොවැම්බර් මස 6 වන දින පවත්වන ලදී. '' හෙට දින පර්යේෂකයන් පුබුදාලීමේ ජීවගුණය'' යන තේමාව යටතේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් උපාධි අපේක්ෂකයන් සඳහා මෙම පර්යේෂණ සමුළුව සංවිධානය කරනු ලැබීය. ප්‍රධාන දේශක ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතා සූම් තාක්ෂණය ඔස්සේ සමුළුව ඇමැතීය. RASAS – 2020 ප්‍රධාන ආරාධිතයා ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් ඒ සඳහා සහභාගි විය. ජාතික විශ්වවිද්‍යාලයන්හි තරුණ උපාධි අපේක්ෂකයන්ට තම නව්‍ය පර්යේෂණ අනාවරණ ප්‍රචාරණය කිරීමට සහ විශේෂඥයන්ගෙන් සාධනීය ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමට මෙම සමුළුව වේදිකාවක් නිර්මාණය කර දෙන ලදී.

## 7. කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (ICME) 2020

'නැගී එන ආර්ථිකයන්හි සංවිධාන හැඩ ගැස්සවීමේදී ව්‍යාපාර බුද්ධි තොරතුරුවල කාර්යභාරය' යන තේමාව යටතේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය විසින් සංවිධානය කරන ලද කළමනාකරණ සහ ආර්ථික විද්‍යාව පිළිබඳ 9 වැනි ජාත්‍යන්තර සම්මේලනය ICME 2020 2020 සැප්තැම්බර් 11 වැනි දින වැලිගම මැරියට් රිසෝට් සහ ස්පා හෝටලයේදි පවත්වන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ හා සභාපති මහාචාර්ය අජන්ත ධර්මසිරි සහ ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු කතෝලික විශ්වවිද්‍යාලයේ පීටර් ෆේබර් ව්‍යාපාරික පාසලේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුගුමාර් මාරියප්පනදාර් ප්‍රධාන දේශන පවත්වන ලදී.

## ජාතික සහ ජාත්‍යන්තර සම්මාන

### 1. ගුආන්ඩොං පළාත් විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතා සම්මානය

චීනයේ ගුආන්ඩොං පළාතේ විද්‍යාව හා තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා දක්වන ලද දායකත්වය වෙනුවෙන් චීනය හෝ චීනයෙන් පිටත පුරවැසියන් හා සංවිධාන සඳහා සම්මාන පිරිනැමීමේ අරමුණින් ගුආන්ඩොං පළාත් විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතා සම්මානය ගුආන්ඩොං පළාත් ආණ්ඩුව විසින් 2000 ඔක්තෝබර් මාසයේ ආරම්භ කරන ලදී.

මෙම සම්මානය මෙවර ප්‍රදානය කරන ලද්දේ ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ සාරස විද්‍යා හා ජල තාක්ෂණ අධ්‍යනාංශයේ මහාචාර්ය තිලක් පී.ඩී. ගමගේ මහතාටයි. අධ්‍යාපනය හා පර්යේෂණ සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක වන්නේ මහාචාර්ය තිලක් ගමගේ මහතායි. චීන විද්‍යා ඇකඩමියේ සාගරවේදය පිළිබඳ දකුණු චීන මුහුදු ආයතනයේ මහාචාර්ය ඩොන්ෂියාඕ වැන් මහතාගේ සහාය ඇතිව 2009 වසරේදී මෙම සබඳතාවය ආරම්භ කිරීමට ඒ මහතාට හැකි විය. නොයෙක් සංවිධාන සමග විවිධ අධ්‍යයන ක්‍රියාකාරකම් හරහා චීන ශ්‍රී ලංකා සබඳතා වෙනුවෙන් ඔහුගේ කැපවීම මෙම සම්මානය ප්‍රදානය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබේ.

### 2. ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්ව

ආචාර්ය සුධීර ද සිල්වා මහතාට ඇමෙරිකා එක්සත් ජනපදයේ, ස්ටොර්ස්හි කනෙක්ටිකට් විශ්වවිද්‍යාලයේ සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යනාංශයේ තම පශ්චාත් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්වය දිගටම පවත්වාගෙන යාම පිණිස ෆුල්බ්‍රයිට් උසස් පර්යේෂණ හා දේශන සම්මානය හිමි වුණි.

ආචාර්ය සුධීර ද සිල්වා මහතාට ඇමෙරිකා එක්සත් ජනපදයේ, ස්ටොර්ස්හි කනෙක්ටිකට් විශ්වවිද්‍යාලයේ සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යනාංශයෙන් බාහර පර්යේෂණ අධිශිෂ්‍යත්වයක් හිමි වුණි. මෙම පර්යේෂණ අධ්‍යයන කනෙක්ටිකට් විශ්වවිද්‍යාලයේ ව්‍යුහාත්මක ඉංජිනේරු සහ ව්‍යවහාරික යාන්ත්‍රික විද්‍යා කණ්ඩායම සමග දිගුකාලීන සහයෝගිතා පර්යේෂණ සඳහා මහඟු අවස්ථාවක් උදා කර දෙන ලදී.

කෘෂිකාර්මික ජීවවිද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්ය දිස්නා රත්නසේකර මහත්මියට ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ උද්භිද විද්‍යා අධ්‍යනාංශයට අනුබද්ධ බාහිර මහාචාර්යවරියක ලෙස සේවය කිරීම පිණිස කීර්තිමත් හා ඉතා තරඟකාරී ෆුල්බ්‍රයිට් වෘත්තීය අධිශිෂ්‍යත්වය පිරිනමන ලදී.

### 3. උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථාන ශිෂ්‍යත්වය

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශයේ හේමන්ති සුභද්‍රා හිදැල්ලආරච්චි මහත්මියට දර්ශනශූරී උපාධිය හැදෑරීම පිණිස උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය විසින් 2020 සැප්තැම්බර් මාසයේදී ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

## 4. මාර්ගගත 2020 ලෝක ටයික්වොන්ඩෝ ආසියා පූම්සේ විවෘත තරඟාවලිය

මාර්ගගත 2020 ලෝක ටයික්වොන්ඩෝ ආසියානු පූමාසේ විවෘත ශූරතාවලියේදී ශ්‍රී ලංකාව නියෝජන කරමින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඩබ්ලිව්.එච්.අයි.එස්. චන්ද්‍රසේන මිය කාන්තා අවුරුදු 30න් පහළ වර්ණ පටි පූමාසේ ඉසව්වෙන් රන් පදක්කම ද කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කේ.එච්.කේ.එල්. දිල්ශාන් මහතා පිරිමි අවුරුදු 30න් පහළ වර්ණ පටි පූමාසේ ඉසව්වෙන් රිදී පදක්කම ද දිනාගන්නා ලදී.

## 5. 1 වැනි අතථ්‍ය ටයික්වොන්ඩෝ ජාතික ශූරතාවලිය

ශ්‍රී ලංකා ටයික්වොන්ඩෝ සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබූ 1 වැනි අතථ්‍ය ටයික්වොන්ඩෝ ශූරතාවලිය සඳහා සහභාගි වී රුහුණ විශ්වවිද්‍යාලයීය ටයික්වොන්ඩෝ කණ්ඩායම ජයග්‍රහණ කීපයක් දිනාගන්නා ලදී.

| | |
|---|---|
| කේ.එච්.කේ.එල්. දිල්ශාන් මහතා -කළමනාකරණ හා මූල්‍ය පීඨය | කේවළ පූමාසේ විශ්වවිද්‍යාල කාණ්ඩය - රන් පදක්කම<br>විවෘත 30න් පහළ කාණ්ඩය - ලෝකඩ පදක්කම |
| කේ.ඒ.ඩී.එම්.කේ.එම්. කත්‍රිආරච්චි මහතා - විද්‍යා පීඨය | කේවළ පූමාසේ විශ්වවිද්‍යාල කාණ්ඩය - ලෝකඩ පදක්කම<br>විවෘත 30න් පහළ කාණ්ඩය - රිදී පදක්කම |
| පී.එච්.බී.එස්. සඳරුවන් මහතා - විද්‍යා පීඨය | විශ්වවිද්‍යාල කාණ්ඩය - රිදී පදක්කම<br>විවෘත 30න් පහළ කාණ්ඩය - රිදී පදක්කම |
| ඒ.ඒ.ඊ. රසඳුනි මෙය - කළමනාකරණ හා මූල්‍ය පීඨය | කේවළ පූමාසේ විශ්වවිද්‍යාල කාණ්ඩය - ලෝකඩ පදක්කම<br>විවෘත 30න් පහළ කාණ්ඩය - ලෝකඩ පදක්කම |
| කේ.ඩබ්ලිව්. ඩී.ඕ. ප්‍රියදර්ශනී මෙය - විද්‍යා පීඨය | කේවළ පූමාසේ විශ්වවිද්‍යාල කාණ්ඩය - ලෝකඩ පදක්කම<br>විවෘත 30න් පහළ කාණ්ඩය - ලෝකඩ පදක්කම |
| ඩබ්ලිව්.එච්.අයි.එස්. චන්ද්‍රසේන මිය - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | කේවළ පූමාසේ විශ්වවිද්‍යාල කාණ්ඩය - ලෝකඩ පදක්කම |

## ජාත්‍යන්තර සහයෝගිතා

### 1. "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ආබාධිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම" (IncEdu) පිළිබඳ යුරෝපා සංගමය අරමුදල් සපයන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන ආරම්භ කිරීම

IncEdu ව්‍යාපෘතිය මෙතෙක් නිසි අවධානය යොමු නොවූ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ සැලකියයුතු ගැටලුවක් ආමන්ත්‍රණය කරයි. මෙම ව්‍යාපෘති හවුල්කාරිත්වය ප්‍රකට යුරෝපීය විශ්වවිද්‍යාල හතරකින් එනම් මසාර්යික් විශ්වවිද්‍යාලය- චෙක් ජනරජය, සාග්‍රෙබ් විශ්වවිද්‍යාලය- ක්‍රොඒෂියාව, ට්‍රාන්සිල්වේනියා විශ්වවිද්‍යාලය, බ්‍රාසොව්- රුමේනියාව සහ උප්සාලා විශ්වවිද්‍යාලය- ස්වීඩනය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හතරකින් සමන්විත වේ. එහි ආරම්භක රැස්වීම 2020 පෙබරවාරි මාසයේ 26 සිට 28 දක්වා මහනුවරදී පවත්වනු ලැබීය.

### 2. ඉන්දියානු මහ කොමසාරිස් සම්මානය



වාර්ෂිකව වෛද්‍ය රසායනාගාර විද්‍යා විද්‍යාවේදී උපාධිය, හෙද විද්‍යා විද්‍යාවේදී උපාධිය සහ භිෂග්වේද විද්‍යාවේදී උපාධිය හදාරන සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හොඳම ශිෂ්‍යයන් සඳහා රන් පදක්කම් තුනක් පිරිනැමීම පිණිස ඉන්දියානු මහ කොමසාරිස්තුමා 2020 ජනවාරි 29 දින සම සෞඛ්‍ය විද්‍යා පීඨයට ප්‍රදානයක් පිරිනමන ලදී.

### 3. එරාස්මුස් මුන්ඩස් ට්‍රොපිමුන්ඩො දර්ශනපති වැඩසටහන ස්ථාපිත කිරීම

එරාස්මුස් මුන්ඩස් ඒකාබද්ධ නිවර්තන ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති (TROPIMUNDO) දර්ශනපති උපාධි වැඩසටහන යුරෝපීය සංගමයේ අධ්‍යාපන විශිෂ්ඨතාවයේ එකම ලේබලය දරණ අතිශයින් තරඟකාරී වැඩසටහනක් වන අතර විශ්වවිද්‍යාල කිහිපයක් අතර ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, දෙවන වර්ෂාර්ධයේදී තම ගමනාන්තය ලෙස රුහුණ විශ්වවිද්‍යාලය තෝරාගත් ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයට පැමිණියේ අර්ස 30ක් සම්පූර්ණ කිරීම පිණිසය. මීට විවිධ පාරිසරික පද්ධති වෙත සිදුකළ ක්ෂේත්‍ර සංචාර අයත් විය. මෙම වැඩසටහන රුහුණ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය හරහා ඉටුකරන ලදී.

### 4. රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නිල මධ්‍යස්ථානයක් ලෙස ආසාදිත රෝග සඳහා රුහුණ-ඩියුක් මධ්‍යස්ථානය (RDCID) ස්ථාපිත කිරීම

සෞඛ්‍ය ආශ්‍රිත පර්යේෂණ සහ ශිෂ්‍යයන්/සායනික වෛද්‍යවරු පුහුණු හුවමාරු පිළිබඳ ද්විදිශා සහයෝගිතාවයකට පහසුකම් සැපයීමේ ප්‍රයත්නයක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ ඩියුක් ග්ලෝබල් සෞඛ්‍ය ආයතනය ගෝලීය සෞඛ්‍යය සඳහා ඩියුක් හියුබට් යිර්ගාන් මධ්‍යස්ථානය සමග හවුල්කාරිත්වයෙන් පර්යේෂණ හා අධ්‍යාපනික සහයෝගිතාවයක් නිර්මාණය කරන ලදී.

## 5. කාර්යක්‍රම තථ්‍ය කාල සතුට දර්ශක මැනීම: BECK ව්‍යාපෘතිය සහ විල්නියස් ගෙඩිමිනාස් තාක්ෂණික විශ්වවිද්‍යාල සහ රුහුණ විශ්වවිද්‍යාල සහයෝගිතාව

කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය පීඨයේ සහ අධ්‍යනාංශ පරිශ්‍රයහි චිත්ත ස්වභාවය මැනීමේ කැමරා පද්ධතියක් ස්ථාපනය කර තිබේ. විල්නියස් ගෙඩිමිනස් තාක්ෂණික විශ්වවිද්‍යාලය මගින් සංවර්ධනය කරනු ලැබූ කැමරා පද්ධති සහ ස්නායු විශ්ලේෂණ පද්ධති ඒවා පසුකර යන්නන්ගේ මුහුණේ හැඟීම්, සිරුරු භාෂාව, උෂ්ණත්වය සහ තවත් සාධක කිහිපයක් මත පදනම්ව ඔවුන්ගේ චිත්ත ස්වභාවය සටහන් කරයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ පොදු අවකාශවලදී ජනතා සිත් පහන් කරන සහ වඩා ඵලදායී ජීවිතයක් ගත කිරීමට හැකියාව ඇති කරන පරාමිතීන් ස්ථාපනය කිරීමයි.

## 6. NOPART හවුල්කාරිත්ව නෝ(ර්) ලංකා බිලූ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන

කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද නෝර්වේ ආක්ටික් විශ්වවිද්‍යාලය, ට්‍රොම්සෝ සමග NOPART හවුල්කාරිත්ව නෝ(ර්)- ලංකා බිලූ ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන සාර්ථකව ක්‍රියාවට නංවමින් දර්ශනවේදී උපාධිය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමට නියමිත හෝ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් හත් දෙනෙකු 2020 ඔක්තෝබර් මාසයේදී ට්‍රොම්සෝ වෙත පිටත්ව යන ලදී.

# අනෙකුත් විශේෂ සිදුවීම්

පීඨ සහ විශ්වවිද්‍යාල මට්ටමින් පවත්වනු ලැබූ වැඩමුළු සහ අනෙකුත් වාර්ෂික උත්සව ආදිය පහත දැක්වේ.

## 1. රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සහ ඩයලෝග් ඇක්සියාටා අතර ආරක්ෂිත නිවෙස්වල ස්වයංක්‍රීය කෘෂිකර්ම පද්ධති පිළිබඳ අවබෝධතා ගිවිසුම

රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව රාමුව තුළ ඩයලොග් ඇක්සියාටා සමාගම සමග ආරක්ෂිත කෘෂිකර්ම පද්ධති පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම පිණිස අවබෝධතා ගිවිසුමක් අත්සන් තබනු ලැබීය. අදාළ පාර්ශවයන් සඳහා මෙම ගිවිසුමේ විෂය පථය වනුයේ ජලජරෝපණ කෘෂිකාර්මික භාවිතාවන් ස්වයංක්‍රීය කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා පර්යේෂණ ක්‍රියාකාරකම්වල නියැලීම සහ අනතුරුව විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ සහභාගිත්වයෙන් හයිඩ්‍රොපොනික සහ ඒරෝපොනික කෘෂිකර්මය පිළිබඳ පර්යේෂණ කිරීමේ හැකියාව සොයා බැලීම සහ උපාංගවල අන්තර්ජාලය (IOT) ආධාරක ආරක්ෂිත කෘෂිකර්මය ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය, දියත් කිරීම සහ ජනප්‍රිය කිරීමේ නියැළීමයි.

## 2. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නව ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීමේ උත්සවය

විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨයේ නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා මුල්ගල තැබීමේ උත්සවය ගාල්ල වලහන්දුව වත්තේදී 2020 දෙසැම්බර් මස 10 වැනි දින පවත්වන ලදී. එම අවස්ථාවට රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති, නියෝජ්‍ය උපකුලපති සහ පීඨාධිපතිවරුන්, ගරු අමාත්‍ය රමේෂ් පතිරණ සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි විය.

## 3. රෝහණ-භාරති හින්දි ප්‍රබෝධිනී



හින්දි භාෂාව ඉගැන්වීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය ‘රෝහණ-භාරති හින්දි ප්‍රබෝධිනී’ 2020 පබරවාරි 17 වැනි දින විශ්වවිද්‍යාප පරිභ්‍රයේදී පවත්වන ලදී. ඉන්දීය කොන්සල් ජනරාල් ප්‍රේම් කේ. නායර් මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස මෙම අවස්ථාවට සහභාගි වූ අතර ආරාධිත දේශනය පවත්වනු ලැබුයේ කැළණිය විශ්වවිද්‍යාලයේ හින්දි අධ්‍යයන අංශයේ මහාචාර්ය උපුල් රංජිත් හේවාචිතානගමගේ මහතායි.

## 4. මහාචාර්ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ කරාපිටිය ශික්ෂණ රෝහල ඒකාබද්ධව කළමනාකරණය කිරීමට නියමිත මහල් දහයකින් යුතු මහාචාර්ය වාට්ටු සංකීර්ණය සඳහා 2020 පෙබරවාරි 21 වැනි දින මුල්ගල තබන ලදී. වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට සඳහා එම සංකීර්ණයෙහි ඉගෙනුම් පහසුකම් තිබෙනු ඇති අතර දකුණු පළාතේ රෝගීන්ට ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක සායනික සත්කාරක සැපයීම ද එමගින් ඉහළ නැංවෙනු ඇත.

# කොටස VIII - පුස්තකාලය

## පුස්තකාලයාධිපති ප්‍රකාශය

විශ්වවිද්‍යාලයේ හදවත බඳු පුස්තකාලය, එහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාම පිණිස අවශ්‍ය සහාය ලබාදීම මගින් විශ්වවිද්‍යාලය තුළ  වැදගත් භූමිකාවක් ඉටු කරයි. රට තුළ පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි මාර්ගගත ක්‍රමවේදයකට පරිවර්තනය වූ බැවින් රුහුණ විශ්වවිදයාලයේ පුස්තකාල පද්ධතියට එහි අරමුණ සපුරා ගැනීමේදී 2020 වසර බෙහෙවින් අභියෝගාත්මක එකක් විය. විශේෂයෙන්ම, අදාළ පෙළ පොත් සහ අවශ්‍ය කරනු ලබන තොරතුරු  වෙත ප්‍රවේශය ලබාදීමට පුස්තකාලයට සිදුවූ අතර පුස්තකාලය සාමාන්‍යයෙන් සිදුකරන අනෙකුත් ප්‍රජා පාදක ක්‍රියාකාරකම් ද පවත්වා ගෙන යාමට සිදු විය.

‘‘නව සාමාන්‍යයේ මෙම අභියෝගයන්ට මුහුණ දෙමින්, සීමිත මූල්‍ය පහසුකම් යටතේ, විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස පහත දැක්වෙන ක්‍රියාකාරකම් සහ සේවාවන් ඉටුකිරීමට පුස්තකාලය සමත්විය.

නිමල් හෙට්ටිආරච්චි මහතා
වැඩබලන පුස්තකාලයාධිපති

- **නව සේවා**
    - ලැප්ටොප් පරිගණක බැහැර දීමේ සේවය
    - ඉන්-අවුට් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
    - විශ්වවිද්‍යාල හැඳුනුම්පත් මුද්‍රණ ඒකකය ක්‍රියාත්මක කිරීම
    - විද්‍යුත් ජර්නල සඳහා මණ්ඩපයෙන් පරිබාහිර ප්‍රවේශය
    - ඩිජිටල් ලේඛන සැපයුම් සේවාව ක්‍රියාත්මක කිරීම
    - විශ්වවිද්‍යාල පුවත් ලේඛනාරක්ෂක සේවාව ක්‍රියාත්මක කිරීම

- **නව ග්‍රන්ථ එකතු**
    - ඊ පොත් එකතුව
    - මහාචාර්ය කුමාරි ජයවර්ධන මිය ග්‍රන්ථ එකතුව

## පුස්තකාල සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| පූර්වාරම්භක පුහුණුව | සම සේඛ්‍ය විද්‍යා, කෘෂිකර්ම, ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, කළමනාකරණ හා මූල්‍ය, ඉංජිනේරු හා වෛද්‍ය යන පීඨවල නවක සිසුන් සඳහා පූර්වාරම්භක වැඩසටහන් පවත්වනු ලැබීය | පළමු වසරේ ශිෂ්‍යයන් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | නිමල් හෙට්ටිආරච්චි මහතා "ශ්‍රී ලංකාව සඳහා MARC 21 විස්තරාත්මක සූචිකරණ රාමුව" සකස් කිරීමේ කමිටුවේ සාමාජිකයකු විය.<br><br>යූ.ඒ. ලාල් පන්නිල මහතා 2020/2021 වසර සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභා සාමාජිකයකු විය | ශ්‍රී ලංකාවේ සියලු පුස්තකාල වෘත්තිකයන් |
| පවත්වනු ලැබූ වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | නිමල් හෙට්ටිආරච්චි- සම්පත් දායක- ජාතික පුස්තකාලය විසින් සංවිධානය කරනු ලැබූ "ශ්‍රී ලංකාව සඳහා MARC 21 විස්තරාත්මක සූචිකරණ රාමුව" පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය<br><br>පී.ජී. නිශාන්ත මහතා- සම්පත් දායක- ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා 'ටර්න්ඉට්ඉන්' රචනා වෛඊර්යය සොයාගැනීමේ මෘදුකාංගය භාවිතය, පර්යේෂණ සහාය<br>(විමර්ශන, සාහිත්‍යය, රචන වෛඊර්යයෙන් වැළකීම)<br><br>කුසල ප්‍රනාන්දු මහතා- සම්පත් දායක- රචනා වෛඊර්යය, එය වැළැක්වීම සහ ටර්න්ඉට්ඉන් සමානකම් සොයාගැනීමේ වේදිකාව භාවිතා කරන්නේ කෙසේද, රුහුණ විශ්වවිද්‍යාලයේ ආයතනික සුරක්ෂිතාගාරය හැඳින්වීම සහ හැසිරවීම, රුහුණ විශ්වවිද්‍යාලයේ විලෝපිත සඟරා සහ ධවල සඟරා හඳුනා ගැනීම | ශ්‍රී ලංකාවේ සියලු පුස්තකාල වෘත්තිකයන්<br><br>ස.සෞ.වි. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය<br><br>ජ්‍යෙෂ්ඨ පුස්තකාල කාර්ය මණ්ඩලය, පීඨ කාර්ය මණ්ඩල |
| ප්‍රජා සේවා | පී.කේ.ජයසේකර මිය- පුස්තකාල සංගම් හා ආයතනවල අන්තර්ජාතික සම්මේලනය විසින් ප්‍රකාශයට පත්කරන ලද ව්‍යාජ පුවත් හඳුනාගන්නේ කෙසේද - කොවිඩ් 19 සංස්කරණය තොරතුරු ප්‍රස්ථාර ආකාරයෙන් නිරූපණය කිරීම, (2020) සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.<br>https://www.ifla.org/publications/node/93015<br><br>සකුන්තලා සෙනෙවිරත්න මිය- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රුහුණු සේවය, ආරාධිත කථිකයකු ලෙස සහභාගි විය | |
| ප්‍රතිපත්ති සම්පාදනය | පරිත්‍යාග ලෙස ලැබෙන ග්‍රන්ථ සඳහා මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තිය<br><br>පුස්තකාල සංවර්ධන අරමුදල සඳහා ප්‍රතිපත්තිය | |
| තොරතුරු සාක්ෂරතා පාඨමාලා | තොරතුරු සාක්ෂරතාව සහ විද්‍යාත්මක සන්නිවේදන මොඩියුලයථ 2019/2020 සිට හඳුන්වා දෙන ලදී. කාණ්ඩ මොඩියුලය 2020 ජනවාරි 29 සිට 2020 පෙබරවාරි 15 දක්වා පවත්වන ලදී (න්‍යාය පැය 12 සහ ප්‍රායෝගික පැය 10යි) | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| තොරතුරු සාක්ෂරතා පාඨමාලා | දේශන මඩුල්ල- යූ.ඒ. ලාල් පන්නිල මහතා, කුසල ප්‍රනාන්දු මහතා, සන්ධ්‍යා ගම්මන්පිල මිය, ජේ.ඒ.අජිත් මහතා, තේජා කුරුප්පුආරච්චි මිය, සකුන්තලා සෙනෙවිරත්න මිය<br><br>පාඨමාලා සම්බන්ධීකාරක - ජේ.ඒ.අජිත් මහතා<br><br>තොරතුරු සාක්ෂරතාව සහ පුස්තකාල පර්යේෂණ කුසලතා (FND 3122) උපාධි වැඩසටහන- ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ විද්‍යාවේදී උපාධිය, සාගර හා මිරිදිය විද්‍යා විද්‍යාවේදී උපාධිය<br>පාඨමාලා සම්බන්ධීකාරක - ආර්.ඒ.පී.එස්. සෙනෙවිරත්න මිය<br><br>දේශක - කුසල් ප්‍රනාන්දු මයා | |
| කමිටු සහ සාමාජිකත්වය | නිමල් හෙට්ටිආරච්චි මහතා - විශ්වවිද්‍යාල තොරතරු තාක්ෂණ කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ අනුකමිටුවේ සාමාජික හා කැඳවුම්කරු<br><br>යූ.ඒ. ලාල් පන්නිල මහතා- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, මා.ශා හා ස.වි. පීඨයේ පුස්තකාල නියෝජිත, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>තේජා කුරුප්පුආරච්චි මිය- විද්‍යා පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විද්‍යා පීඨයේ පුස්තකාල නියෝජිත<br><br>සන්ධ්‍යා ගම්මන්පිල මිය- කෘෂිකර්ම පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>ජේ.ජේ. ගරුසිංහ ආරච්චිගේ මහතා- ඉංජිනේරු පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>සනත් පුෂ්පකුමාර මහතා - වෛද්‍ය පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>පී.ජී. නිශාන්ත මහතා - ස.සෞ.වි. පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජික, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>ජේ.ඒ. අජිත් මහතා - තාක්ෂණවේද පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජික, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කමිටු සහ සාමාජිකත්වය | ජේ.ඒ. අජිත් මහතා - තාක්ෂණවේද පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජික, විශ්වවිද්‍යාල ඉතිහාසය ලේඛන ගතකිරීමේ පුස්තකාල අනුකමිටුවේ සාමාජික<br><br>කුසල ප්‍රනාන්දු මහතා - වෛද්‍ය පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජික, මූ.ක. පීඨයේ පුස්තකාල නියෝජිත, විශ්වවිද්‍යාල වෙබ් සංවර්ධන කමිටුවේ සාමාජික, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සහරාවේ සංස්කරණ මණ්ඩල සාමාජික, රුහුණ විශ්වවිද්‍යාල සහරාවේ සංස්කරණ මණ්ඩල සාමාජික, රුහුණ විශ්වවිද්‍යාලයේ රෝහණ පර්යේෂණ සහරාවේ සංස්කරණ මණ්ඩල සාමාජික, ආචාර්ය සංගමයේ විධායක කමිටු සාමාජික (මා.ශා හා ස.වි. පීඨය සහ මූ.ක.පීඨය)<br><br>සකුන්තලා සෙනෙවිරත්න මිය - ධි.සා.වි. හා .තා. පීඨයේ පීඨයේ පුස්තකාල කමිටුවේ සාමාජික හා කැඳවුම්කරු, ධි.සා.වි. හා .තා. පීඨයේ පුස්තකාල නියෝජිත, ආචාර්ය සංගමයේ විධායක කමිටු සාමාජික (මා.ශා හා ස.වි. පීඨය සහ මූ.ක.පීඨය)<br>පී.කේ. ජයසේකර මෙය- උ.අ.පීඨයේ පුස්තකාල නියෝජිත | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 02 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 01 |
| පොත් පරිච්ඡේද | 01 |
| **එකතුව** | **08** |

## සාමාජිකත්ව විස්තර

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජී. | වෛද්‍ය. | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **වත්මන් සාමාජිකත්වය** | | | | | | |
| • ශිෂ්‍යයන් | 5605 | 851 | 496 | 1009 | 1052 | 637 |
| • අධ්‍යයන කාර්යමණ්ඩලය | 837 | 81 | 36 | 68 | 82 | 35 |
| • අනධ්‍යන කාර්යමණ්ඩලය | 318 | 54 | 22 | 56 | 122 | 20 |
| **නව සාමාජිකත්වය (2020 වසරේ)** | | | | | | |
| • ශිෂ්‍යයන් | 2325 | 234 | 30 | 274 | 204 | 182 |
| • අධ්‍යයන කාර්ය මණ්ඩලය | 18 | 14 | 02 | 02 | 05 | 09 |
| • අනධ්‍යන කාර්ය මණ්ඩලය | 08 | 04 | 04 | 01 | 04 | 03 |

## විවෘතව තබන වේලාවන්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජී. | වෛද්‍ය. | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **විවෘතව තබන වේලාවන් (පෙ.ව.– ප.ව.)** | | | | | | |
| • සතියේ දින | 8.00 - 5.30 | 8.00 - 6.00 | 8.00 - 6.00 | 8.00 - 6.00 | 8.00 - 7.00 | 8.30 - 4.30 |
| • සෙනසුරාදා | 8.00 - 5.00 | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | 8.00 - 5.00 | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | - |
| • ඉරිදා | වසා ඇත | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | - | 8.30 – 6.45 | - |
| **බහුමාධ්‍ය මධ්‍යස්ථානය** | | | | | | |
| • විවෘතව තබන වේලාවන් | - | නොමැත | නොමැත | නොමැත | 8.30 - 6.45 | නොමැත |
| **ස්වයං-ඉගෙනුම් ප්‍රදේශය** | 8.00 – 10.00 | | | | | පැය 24 (පරිශීලක ඉල්ලීම පරිදි) |

## දඩ, බැහැර දුන් සහ ඡායා පිටපත්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.විද්. | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ. |
|---|---|---|---|---|---|---|
| **ප්‍රමාදිත පොත් සඳහා දඩ (රු.)** | 93847.00 | 7276.00 | 4164.00 | 12536.00 | 51955.00 | 2183.00 |
| **අන්තර් පුස්තකාල හුවමාරු** | | | | | | |
| • යැවූ | 02 | 01 | - | 01 | - | - |
| • ලැබූ | - | - | - | - | - | - |
| **ඡායා පිටපත් සංඛ්‍යාව** | | | | | | |
| • නිල කාර්යයන් සඳහා | 2000 | 2171 | 5077 | 1453 | 12000 | 850 |

## පොත් සහ වාර ප්‍රකාශන

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.විද් | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **වාර ප්‍රකාශන** | | | | | | |
| • දැනටමත් ඇති මුළු වාර ප්‍රකාශන ගණන | 289 | 149 | 88 | 1184 (නිකුතු) | 346 | 40 |
| • අළුතින් මිලදී ගත් | 06 | - | - | - | - | 03 |
| • නව පරිත්‍යාග | 65 | 62 | - | 12 | 05 | 03 |
| **පොත්** | | | | | | |
| • දැනටමත් ඇති මුළු පොත් සංඛ්‍යාව | 245471 | 23366 | 4056 | 15760 | 24000 | 2351 |
| • අළුතින් මිලදී ගත් | 127 | - | - | 04 | - | 20 |
| • නව පරිත්‍යාග | | | | | | |
| - ඉංග්‍රීසි | 683 | 92 | 10 (ඊ පොත්) | 26 | - | 05 |
| - සිංහල | 55 | - | - | - | - | - |
| • පරිගණකගත කරනු ලැබූ පොත් | | | | | | |
| - ඉංග්‍රීසි | 745 | 68 | 105 | 79 | - | - |
| - සිංහල | 8998 | 24 | - | 130 | - | - |
| - සංයුක්ත තැටි | - | - | - | 16 | - | 108 |
| **නිකුත් කළ පොත් සංඛ්‍යාව** | | | | | | |
| • ශිෂ්‍යයන් | 15204 | 754 | 1050 | 1074 | 2311 | 214 |
| • අධ්‍යයන කාර්ය මණ්ඩලය | 1242 | 318 | 175 | 181 | 194 | 50 |
| • අනධ්‍යන කාර්ය මණ්ඩලය | 2250 | 335 | 104 | 346 | 277 | 44 |

# කොටස IX - ව්‍යාප්ති සේවා

## වෛද්‍ය මධ්‍යස්ථානය

වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවා සපයන අතර විවිධ විශේෂ අවස්ථා සඳහා සෞඛ්‍ය සේවා සපයයි. (උදා: උපාධි ප්‍රදානෝත්වය, විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ, අනෙකුත් විශේෂ අවස්ථා ආදී)

**වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැඩ බලන) සහායක පදනමින් | 01 |
| විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරීන් (සහායක පදනමින් ) | 02 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 01 |
| හෙද නිලධාරී | 02 |
| ඖෂධවේදී | 01 |
| මහජන සෞඛ්‍ය නිලධාරීන් (සහායක පදනමින්) | 01 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පීන් (සහායක පදනමින්) | 01 |
| උපස්ථායක (කාන්තා) | 01 |
| උපස්ථායක (පිරිමි) | 01 |
| වැඩ සහායක | 03 |
| කම්කරු (සෞ.සේ) | 01 |

**සායනික සේවා**

| සේවාව | ශිෂ්‍ය | කාර්යමණ්ඩලය | එකතුව |
|---|---|---|---|
| බාහිර රෝගී අංශය | 3703 | 1638 | 5341 |
| දන්ත වෛද්‍ය ඒකකය | 594 | 214 | 808 |
| රසායානාගාර සේවා | 147 | 420 | 567 |
| මනෝවිද්‍යා උපදේශනය | 97 | 07 | 104 |
| විශේෂ ගායන සඳහා යොමුකිරීම | 23 | 02 | 25 |

**නිවාරණ සෞඛ්‍ය සේවා**

**1)** බෝවන රෝග පාලනය
**2)** වාහක පාලනය.
**3)** ආහාර සුරක්ෂිතතාව

අනෙකුත් සේවා

| | | | |
|---|---|---|---|
| **ප්‍රතිකාර සහ විශේෂ පරීක්ෂණ** | තුවාල සැරහුම | 520 | 824 |
| | නික්ෂේපණ | 62 | |
| | සුළු ශල්‍ය කර්ම UMO/MBBS විසින් සිදුකරන ලද ) | 10 | |
| | ECG | 82 | |
| | වෙනත් | 150 | |
| **වෛද්‍ය පරීක්ෂණ** | බෝ නොවන රෝග | 148 | 155 |
| | විශේෂ | 07 | |
| **වෛද්‍ය සහතික (වෛද්‍ය මධ්‍යස්ථානය නිකුත් කරනු ලැබූ)** | ශිෂ්‍යයන් සඳහා | 944 | 983 |
| | කාර්ය මණ්ඩලය | 39 | |
| **වෛද්‍ය සහතික (පිළිගනු ලැබූ)** | නවක ශිෂ්‍යයන් | 1048 | 1320 |
| | විභාග සහ වෙනත් | 117 | |
| | කාර්ය මණ්ඩලය | 116 | |
| | බාහිර | 39 | |
| **මහජන සෞඛ්‍ය සේවා** | ආපන ශාලා පරීක්ෂාව | 479 | 2204 |
| | නේවාසිකාගාර පරීක්ෂාව | 1105 | |
| | පාරිසරික | 380 | |
| | අනෙකුත් පරිශ්‍ර | 240 | |

## ශාරීරික අධ්‍යාපන ඒකකය

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අන්තර් පීඨ සහ අන්තර් විශ්වවිද්‍යාල තරඟ පැවැත්වීමට නොහැකි විය.

### ජාතික/අන්තර්ජාතික තරඟ

| ඉසව්ව | ජයග්‍රාහක |
|---|---|
| 2020 මාර්ගගත ලෝක ටයික්වොන්ඩෝ ආසියා පූමාසේ විවෘත ශූරතාවලියේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කර රන් පදක්කමක් දිනා ගන්නා ලදී. | ඩබ්ලිව්.එච්.අයි.එස්. චන්ද්‍රසේන මිය (HS/2015/15693) |
| 2020 මාර්ගගත ලෝක ටයික්වොන්ඩෝ ආසියා පූමාසේ විවෘත ශූරතාවලියේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කර රිදී පදක්කමක් දිනා ගන්නා ලදී. | කේ.එච්.කේ.එල්. දිල්ශාන් (MF/2016/4548) |
| 1වැනි අතථ්‍ය ටයික්වොන්ඩෝ ශූරාතාවලියේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කරන ලදී. | කේ.එච්.කේ.එල්. දිල්ශාන් (MF/2016/4548)<br>කේ.ඒ.ඩී.එම්.කේ.එම් කත්‍රිආරච්චි (SC/2017/10234)<br>පී.එච්.බී.එස්. සඳරුවන් (SC/2018/10468)<br>ඒ.ඒ.එෆ්. රසඳුනි (MF/2017/4999 )<br>කේ.ඩබ්.ඩී.ඕ. ප්‍රියදර්ශනී (SC/2017/10173)<br>ඩබ්ලිව්.එච්.අයි.එස්. චන්ද්‍රසේන (HS/2015/15693) |
| 2020 ලෝක විශ්වවිද්‍යාල රට භරහා දිවීමේ තරඟයේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කිරීම පිණිස නම්කරන ලදී. මරාකෙච්, මොරොක්කෝව<br>(කොවිඩ් 19 හේතුවෙන් අවලංගු කරන ලදී) | ඒ.ඩබ්.ජී.එස්.ජේ. බණ්ඩාර (SC/2017/10205) |

### වර්ණ ප්‍රදානය

- වර්ණ කාන්තා හා පිරිමි (2020) - 06 -තෝරාගන්නා ලදී (2022 දී පවත්වනු ඇත)
- විශේෂ සම්මාන කාන්තා හා පිරිමි - 06- තෝරාගන්නා ලදී (2022 දී පවත්වනු ඇත)

### අනෙකුත් ක්‍රීඩා තරඟ

- සහාය දීවීමේ තරඟ (පිරිමි) - පළමු ස්ථානය ඉංජිනේරු පීඨය
  - දෙවන ස්ථානය ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය
  - තෙවන ස්ථානය කළමනාකරණ හා මූල්‍ය පීඨය

- සහාය දීවීමේ තරඟ (පිරිමි) - පළමු ස්ථානය ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය
  - දෙවන ස්ථානය කළමනාකරණ හා මූල්‍ය පීඨය
  - තෙවන ස්ථානය ඉංජිනේරු පීඨය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

# කොටස X – ඒකක/මධ්‍යස්ථාන වාර්තා

## 1. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

### ➢ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

ලොව පුරා පැතිර ගිය කොවිඩ්-19 වසංගතයේ හේතුවෙන් 2020 වසර සෑම පුද්ගලයෙකුටම අභියෝගාත්මක වසරක් විය. රට අගුලු දමා ශිෂ්‍යන් විශ්වවිද්‍යාලයෙන් බැහැරව සිටියද, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සිය සියලු කටයුතු මාර්ගගත ක්‍රමවේදයන්ට පරිවර්තනය කරමින් විශ්වවිද්‍යාලයේ පූර්ණව ක්‍රියාත්මක වන ඒකකයක් බවට පත් විය. සියලු පීඨ ආවරණය කරමින් සහ වෘත්තීය මාර්ගෝපදේශනයේ කේන්ද්‍රීය ක්ෂේත්‍ර 10 ම ආවරණය කරමින් වැඩසටහන් 57 ක් පැවැත්වීමට ඒකකයට හැකි විය.

### ➢ සපයනු ලැබූ සීමාවාසික/කර්මාන්ත පුහුණු

වත්මනෙහි පවත්නා තත්ත්වයන් යටතේ රැකියාවක්, සීමාවාසික පුහුණුවක් හෝ අර්ධ කාලීන රැකියාවක් සොයා ගැනීමට හැකිවනු පිණිස මාර්ගගත රැකියා පොළක් පැවැත්වීමට ඒකකය කටයුතු යොදා ඇත.

### ➢ වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රියාකාරකම්/ වැඩමුළු පැවැත්වීම

මෘදු කුසලතා සහ රැකියා නියුක්තිතා කුසලතා වර්ධනය කරන සහ ශිෂ්‍යයන්ගේ පෞරුෂය සංවර්ධනය කරන ගුණාත්මක වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය කටයුතු කරයි.

විවිධ සම්පත් දායකයන් යොදා ගනිමින් විවිධ ස්ථානවලදී වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් පවත්වන ලදී. එසේම ශිෂ්‍යයන් මුහුණ පා ඇති විවිධ මානසික ගැටලු වෙනුවෙන් උපදේශන සේවා පවත්වා අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය යහපත් මානසිකත්වයක් ගොඩනැගීමට ඒකකය කටයුතු කරන ලදී.

එසේම පෞද්ගලික අංශයේ ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් එම අංශයේ පවතින අවස්ථාවන්ගෙන් නිසි ඵල නෙලා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සපයන ලදී.

### ➢ පැවැත්වූ වැඩසටහන්

| පීඨය | සිදුවීම / වැඩමුළුව /වැඩසටහන |
|---|---|
| කෘෂිකර්ම පීඨය | • මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ සහතික පත්‍ර පාඨමාලාව<br>• ‘‘නිලිවැස්ස’’ - අනාථාගාර වැඩසටහන<br>• ජීව දත්ත ලිවීම සහ සම්මුඛ සාකච්ඡාවන්ට මුහුණදීම<br>• ප්‍රථමාධාර පුහුණුව - විද්‍යා පීඨය<br>• සංගීත රසාස්වාදනය සහ සාකච්ඡාව- පූර්වාරම්භක වැඩසටහන<br>• මාධ්‍ය සාක්ෂරතා පුහුණුව<br>• පුහුණුව සමග ආහාර මේස චාරිත්‍ර / සමාජ සුසිරිත<br>• සාර්ථක ජීවිතයක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කාර්යභාරය |

| පීඨය | සිදුවීම / වැඩමුළුව /වැඩසටහන |
|---|---|
| කෘෂිකර්ම පීඨය | • වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• සිරස ගම්මැද්ද V බලකාය සමග සහයෝගීතාවයෙන් නව්‍යකරණ හා නවෝත්පාදන වාණිජකරණය<br>• විකල්ප හා අවස්ථා පිරිවැය සහ සැම දෙනා සතුටුවන විසඳුම්<br>• සිරස රූපවාහිණිය සමග සහයෝගීතාවයෙන් මාර්ගගත නායකත්ව වැඩමුළු මාලාව<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව<br>• පුද්ගල හුරුකරවීම සහ ආයතනික සුසිරිත් |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | • නායකත්ව පුහුණු වැඩසටහන<br>• ‘‘ගෞරවය සහිතව නායකත්වය ලබා දෙන්න’’ ක්ෂිණකාලික කර්මාන්ත සඳහා යහතම මෙවලම් සහ යහපත් පරිවයන්<br>• පූර්වාරම්භක පුහුණු වැඩසටහන- අන් අයගෙන් ඔබ කැපී පෙනෙන සාර්ථක අනාගතයක්<br>• ඉදිරිපත් කිරීමේ කුසලතා හා සන්නිවේදන කුසලතා පිළිබඳ ක්‍රියාකාරකම් පාදක වැඩමුළුව<br>• ආයතනික සමාජ වගකීම- වැඩිහිටි වැඩසටහන, බැද්දේගම<br>• වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• කෝසෙරා විශ්වවිද්‍යාල මාර්ගගත ඉගෙනුම් වැඩසටහන<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව<br>• විශ්වාසයෙන් යුතුව තරහකාරී රැකියා ලොව ජයගන්න<br>• ‘නිරවුල් සන්නිවේදනය’ - සඵල සන්නිවේදන කුසලතා පිළිබඳ ඉගෙනුම සඳහා මාර්ගගත සැසිය<br>• ‘‘ස්වයං ඇගයීම’’ - ඔබ සහ ඔබේ හැකියා හඳුනාගන්න- මාර්ගගත සැසිය<br>• ‘‘ඔබේ සාර්ථකත්වයේ සැඟවුණු සාධක’’ - මාර්ගගත සැසිය<br>• ‘‘වෘත්තිය අභිවර්ධනය සඳහා පෞරුෂ සංවර්ධනය’’ - මාර්ගගත සැසිය |
| ඉංජිනේරු පීඨය | • මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ සහතික පත්‍ර පාඨමාලාව<br>• ඔබේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය - සංවර්ධන වැඩසටහන<br>• ඉදිරිපත් කිරීමේ කුසලතා හා සන්නිවේදන කුසලතා පුහුණුව - දින 5 යි<br>• නායකත්ව පුහුණුව - දින 2 යි<br>• වෘත්තීමය සංවර්ධන පුහුණුව - දින 6යි<br>• මාධ්‍ය සාක්ෂරතා පුහුණුව<br>• ආහාර මේස චාරිත්‍ර / සමාජ සුසිරිත් පුහුණුව<br>• විකල්ප හා අවස්ථා පිරිවැය සහ සැම දෙනා සතුටුවන විසඳුම්<br>• රැකියා වෙළඳපොළෙ නව ප්‍රවණතා<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව |

| පීඨය | සිදුවීම / වැඩමුළුව /වැඩසටහන |
|---|---|
| ඉංජිනේරු පීඨය | • 'නිරවුල් සන්නිවේදනය' - සඵල සන්නිවේදන කුසලතා පිළිබඳ ඉගෙනුම් සඳහා මාර්ගගත සැසිය<br>• ''ස්වයං ඇගයීම'' - ඔබ සහ ඔබේ හැකියා හඳුනාගන්න- මාර්ගගත සැසිය<br>• ''ඔබේ සාර්ථකත්වයේ සැඟවුණු සාධක'' - මාර්ගගත සැසිය<br>• වෘත්තීය අභිවර්ධනය සඳහා පෞරුෂ සංවර්ධනය'' - මාර්ගගත සැසිය<br>• ''ඉලක්ක ඇතිකර ගැනීම'' - මාර්ගගත සැසිය<br>• මානසික සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන ''ආතතියක් වන්නේ හා නොවන්නේ කුමක්ද- මාර්ගගත සැසිය |
| ධීවර හා සාගර විද්‍යා පීඨය | • සවිඥාණකත්ව ක්‍රියාකාරකම් - යෝග වැඩසටහන<br>• වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• අභියෝගවලට මුහුණ දෙන්නේ කෙසේද<br>• නර්තන චිකිත්සාව<br>• ආතතිය මුදාහැරීමේ වැඩසටහන - පන්දම<br>• ධීවර හා සමාජ විද්‍යා පීඨයේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තතාව පිළිබඳ සමීක්ෂණය |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | • මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ සහතික පත්‍ර පාඨමාලාව<br>• පෞරුෂත්ව සංවර්ධන සහ ආකල්ප වෙනස්කිරීමේ වැඩසටහන (පූර්වාරම්භක වැඩසටහන)<br>• විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන් සඳහා අනාගත දැක්ම (පූර්වාරම්භක වැඩසටහන)<br>• පූර්වාරම්භක වැඩසටහන<br>• මා.ශා හා ස.වි. උපාධිධාරීන්ගේ වෘත්තීය අපේක්ෂා<br>• පෞරුෂ සංවර්ධනය සහ ආකල්ප වෙනස් කිරීමේ වැඩසටහන (පූර්වාරම්භක වැඩසටහන)<br>• ප්‍රථමාධාර වැඩසටහන<br>• එක්සත් ජාතීන්ගේ සංවර්ධ වැඩසටහන් සංසදය<br>• වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• ''සරසවි රැස් වළල්ල'' ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන<br>• වෘත්තීමය සංවර්ධන පුහුණුව - දින 6<br>• මාධ්‍ය සාක්ෂරතා පුහුණුව<br>• ආහාර මේස චාරිත්‍ර / සමාජ සුසිරිත් පුහුණුව<br>• සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන්නේ කෙසේද<br>• ජන මාධ්‍ය පුහුණුව<br>• විකල්ප හා අවස්ථා පිරිවැය සහ සැම දෙනා සතුටුවන විසඳුම්<br>• සමාජ විද්‍යා ශිෂ්‍යයන්ගේ වෘත්තීය අපේක්ෂා<br>• සිරස ගම්මැද්ද V බලකාය සමග සහයෝගීතාවයෙන් මාර්ගගත නායකත්ව වැඩමුළු මාලාව<br>• රැකියා වෙළඳපොළේ නව ප්‍රවණතා<br>• ඔබේ වෘත්තීය සැලසුම් කරන්න |

| පීඨය | සිදුවීම / වැඩමුළුව /වැඩසටහන |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | • ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව<br>• පුද්ගල හුරුකරවීම සහ ආයතනික සුසිරිත් |
| කළමනාකරණ පීඨය | • මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ සහතික පත්‍ර පාඨමාලාව<br>• ප්‍රථමාධාර පුහුණු වැඩසටහන<br>• නායකත්ව පුහුණුව<br>• ව්‍යාපාරික සන්නිවේදන කුසලතා<br>• ‘‘සරසවි රැස් වළල්ල’’ ගුවන් විදුලි වැඩසටහන<br>• වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• ආයතනික සමාජ වගකීම - ශිෂ්‍ය අභිප්‍රේරණ සැසිය- ඩඩ්ලි සේනානායක විද්‍යාලය<br>• ආයතනික සමාජ වගකීම - ‘‘ලස්සන ඉස්කෝලේ’’ පාසල් බිත්ති චිත්‍ර වැඩසටහන<br>• ආයතනික සමාජ වගකීම- ‘‘පෙරමග’’ නායකත්ව පුහුණු වැඩසටහන -පාසල්<br>• වෘත්තීමය සංවර්ධන පුහුණුව - දින 06<br>• මාධ්‍ය සාක්ෂරතා පුහුණුව<br>• වැලන්ටයින් විනෝදාස්වාදය<br>• විකල්ප හා අවස්ථා පිරිවැය සහ සැම දෙනා සතුටුවන විසඳුම්<br>• සිරස ගම්මැද්ද V බලකාය සමග සහයෝගීතාවයෙන් මාර්ගගත නායකත්ව වැඩමුළු මාලාව<br>• රැකියා වෙළඳපොළේ නව ප්‍රවණතා<br>• ආයතනික සමාජ වගකීම -ඔබේ අනාගතය ගවේෂණය කරන්න - පාසල් හැරයන්නන් සඳහා වැඩසටහන<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව -සංගීත වැඩසටහන - ‘‘මන්දාරමින් එහා’’<br>• පුද්ගල හුරුකරවීම සහ ආයතනික සුසිරිත් |
| වෛද්‍ය පීඨය | • වෘත්තීය සංවර්ධන පුහුණුව- දින 06 යි<br>• ආහර මේස චාරිත්‍ර / සමාජ සුසිරිත් පුහුණුව<br>• 1 වන වසර සඳහා පදනම් වැඩසටහන<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව |
| විද්‍යා පීඨය | • ජෛව විද්‍යා හා භෞතීය විද්‍යා විද්‍යාවේදී උපාධිධරයන්ගේ වෘත්තීය මාර්ග හඳුනාගැනීම - වැඩමුළු මාලාව<br>• පොහොය සඳ නැගෙන සඳ පෙර පෝදා දහම් සභාව<br>• වැඩ ලොව සඳහා හඳුන්වාදීමේ වැඩමුළුව<br>• පර්යේෂණ කුසලතා සංවර්ධනය කිරීමේ අභිප්‍රේරණ වැඩමුළුව<br>• සම්මුඛ පරීක්ෂණයකට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද?<br>• සාර්ථක ජීවදත්ත ලියන්නේ කෙසේද හා සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන්නේ කෙසේද? |

| පීඨය | සිදුවීම / වැඩමුළුව /වැඩසටහන |
|---|---|
| විද්‍යා පීඨය | • නායකත්ව වැඩසටහන<br>• ‘‘දුෂ්කර අවස්ථාවකදී තීරණ ගැනීම’’ -හුරුකරවීමේ වැඩසටහන<br>• යෝග ක්‍රම සමග භාවනා වැඩසටහන<br>• ඉදිරිපත් කිරීමක් සාර්ථකව කරන්නේ කෙසේද<br>• තරහකාරී රැකියා දිනාගන්න<br>• ක්‍රියාකාරකම් පාදක වැඩමුළුව - කණ්ඩායම් ගොඩනැගීම<br>• ක්‍රියාකාරකම් පාදක වැඩමුළුව - ඉලක්ක ඇතිකර ගැනීම<br>• ඉදිරිපත්කිරීමේ කුසලතා හා සන්නිවේදන කුසලතා පිළිබඳ ක්‍රියාකාරකම් පාදක වැඩමුළුව<br>• වැලන්ටයින් විනෝදාස්වාද වැඩසටහන<br>• නර්තන චිකිත්සාව<br>• ආතතිය මුදාහැරීමේ වැඩසටහන - පන්දම<br>• විභාගයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන් මාලාව ‘‘සන්නිවේදනය හා ඉදිරිපත් කිරීම’’<br>• බිම්මල් ව්‍යාපෘතිය සිදුකිරීමට ශිෂ්‍යයන්ට සහායවීම<br>• ‘‘රැකියා හා කුසලතා’’ අභිප්‍රේරණ වැඩසටහන |
| තාක්ෂණ පීඨය | • ‘‘සතිය’’ භාවනා වැඩසටහන<br>• අන් අයගෙන් ඔබ කැපී පෙනෙන සාර්ථක අනාගතයක්<br>• පූර්වාරම්භක වැඩසටහන<br>• සංගීත චිකිත්සාව - ආතතිය මුදාහැරීමේ වැඩසටහන<br>• සාර්ථකත්වය සඳහා පදනම- නායකත්ව පුහුණුව<br>• සවිඥානකත්වය සංවර්ධන වැඩසටහන - ජීනසේන පදනම - බොල්ගොඩ<br>• ජෛව පද්ධති තාක්ෂණ උපාධිධාරීන්ගේ වෘත්තීය අපේක්ෂා<br>• ඉංජිනේරු විද්‍යා සහ තොතා. උපාධිධාරීන්ගේ රැකියා අපේක්ෂා<br>• ‘‘රැකියා හා නිපුණතා’’ අභිප්‍රේරණාත්මක වැඩසටහන<br>• ප්‍රදීපාගාරයක පහන් එළිය - මාර්ගගත වැඩසටහන |

## ➢ අනෙකුත් වැඩමුළු

| පොදු | සිදුවීම/වැඩමුළුව/වැඩසටහන |
|---|---|
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | පුහුණුව සමග ආහර මෙස වාරිත්‍ර / සමාජ සුසිරිත |
| පීඨ අධ්‍යයන වෘත්තීය උපදේශක | සුළු පරිමාණ ව්‍යාපෘති පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන - ඇමෙරිකන් කෝනර් |

## 2. ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය

### ➢ විවිධ ව්‍යාපාති යටතේ ශිෂ්‍ය හුවමාරු

**නෝ(ර්)- ලංකා බිලූ ව්‍යාපෘතිය (විද්‍යා පීඨය, කෘෂිකර්ම පීඨය සහ ධීවර, සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය**

- රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සහ කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සහ නෝර්වේ-UiT ආක්ටික් විශ්වවිද්‍යාලය, ට්‍රොම්සෝ (රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සම්බන්ධීකරණය කරන ලදී) සමග සහයෝගීතාවයෙන් නෝ(ර්) ලංකා බිලූ ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.
- නෝ(ර්) ලංකා බිලූ ව්‍යාපෘතිය යටතේ ECTS පාඨමාලා මොඩියුල 8ක් සහ නේවාසික වැඩමුළුවක් සම්පූර්ණ කිරීම පිණිස නෝර්වේ-UiT ආක්ටික් විශ්වවිද්‍යාලයේ දර්ශනපති ශිෂ්‍යාවන් තිදෙනෙකු මාස දෙකක පමණ කාලයක් විද්‍යා පීඨයේ/ ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨයේ ගත කරන ලදී. ඇනා කාරියා ලෙරෝයි රිප්ලෙ මෙය, රික්කෙ ස්ටැබෙල් මෙය සහ සිග්නි ඇන්ටනෙට් ලින්ජ් කිලින්ග්මෝ මෙය එම ශිෂ්‍යාවන්ය.
- නෝපාර්ට්/ නෝ(ර්)- ලංකා බිලූ විසින් සැපයූ අරමුදල් මගින් ශ්‍රී ලංකාවේ දර්ශනපති ශිෂ්‍යයන් හත් දෙනෙකු (රුහුණු විශ්වවිද්‍යාලයෙන් හතර දෙනෙකු සහ යාපනය විශ්වවිද්‍යාලයේ තිදෙනෙකු) විදේශයක එක් වර්ෂාර්ධයක හුවමාරු ශිෂ්‍යයන් ලෙස නොර්වේහි ට්‍රොම්සෝ විශ්වවිද්‍යාලය (UiT, ආක්ටික් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා පිටත්ව ගිය අතර නාරා ආයතනයේ විද්‍යාඥයකු පූර්ණ කාලීන දර්ශනපති වැඩසටහනක් 2020 ඔක්තෝබර් මාසයේ ආරම්භ කරන ලදී.

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- රුහුණු විශ්වවිද්‍යාලය සහ ට්‍රොම්සෝ විශ්වවිද්‍යාලය අතර එරස්මස් + ගෝලීය සංචලතා වැඩසටහන අත්සන් තබන ලදී.

≡ එක් දර්ශනපති ශිෂ්‍යයෙක් මේ වන විට ශාක සහ පරිසරය ආරක්ෂණ ආයතනය, කෘෂිකර්මය සහ වන විද්‍යා පිළිබඳ බීජිං ඇකඩමිය, චීනය ඇයගේ පශ්චාත් උපාධි පර්යේෂණය සිදුකරමින් සිටී.

- ආර්. ජේ. රොබෙකා ජෝයිසිකා (PG/AG/01/2019/169), අධීක්ෂක වරු - මහාචාර්ය ෂූක්ෂියාන් වොං, ශාක සහ පරිසරය ආරක්ෂණ ආයතනය, කෘෂිකර්මය සහ වන විද්‍යා පිළිබඳ බීජිං ඇකඩමිය, චීනය දේශීය අධීක්ෂක – කේ.එල්. වසන්ත කුමාර, කෘෂිකර්ම ජීව විද්‍යා අධ්‍යනාංශය

∉ චීනයේ නිරිතදිග මින්සු විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලය අතර ගිවිසුම.

2019/2020 –ශිෂ්‍යයන් සිව් දෙනෙකු චීනයේ නිරිතදිග මින්සු විශ්වවිද්‍යාලයෙහි සිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘති සිදුකරන ලදී.

- ඩබ්.එම්. එන්.කේ.කේ. කුලසිංහ - AG/AT/2015/4029, මහාචාර්ය වොන් වැන්ටින්, නිරිතදිග මින්සු විශ්වවිද්‍යාලය, චෙන්ග්ඩු wangct@swun.edu.cn, wangct6@163.com.
- පී.ඩී.බී. විජේකෝන් - AG/AT/2015/4030, මහාචාර්ය යැන්, ෂෙං-ටාඕ, රසායන විද්‍යා සහ පරිසර ආරක්ෂක ඉංජිනේරු විද්‍යා ශාස්ත්‍රාලය yangst@pku.edu.cn.

- ආර්.එම්.ඩී.එන්.කේ. රත්නායක – AG/AT/2015/4089, මහාචාර්ය යැන්, ෂෙං-ටාඕ, රසායන විද්‍යා සහ පරිසර ආරක්ෂක ඉංජිනේරු විද්‍යා ශාස්ත්‍රාලය yangst@pku.edu.cn

- අයි.එච්. ජයලත් - AG/AT/2015/4054, මහාචාර්ය වැන්ටින් වොන්, නිරිතදිග මින්සු විශ්වවිද්‍යාලය, චෙන්ග්ඩු wangct@swun.edu.cn, wangct6@163.com

- තායිවානයේ සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලය අතර ගිවිසුම

2019/2020 –ශිෂ්‍යයන් දෙදෙනෙකු 2020 මාර්තු මාසයේදී තායිවානයේ සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලයෙහි සිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘති නිමාකරන ලදී.

- ඒ.ඒ.ආර්.පී. ලක්ෂානි - AG/AT/2015/4027, මහාචාර්ය යු- චුන් චින්, මහාචාර්ය සහ සභාපති, ජෛවවිද්‍යා අධ්‍යනාංශය, සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලය, තායිවානය, yuchung@mail.nsysu.edu.w

- එම්.ජී.ඩබ්.කේ. වීරසිංහ - AG/AT/2015/4063, මහාචාර්ය යු- චුන් චින්, මහාචාර්ය සහ සභාපති, ජෛවවිද්‍යා අධ්‍යනාංශය, සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලය, තායිවානය, yuchung@mail.nsysu.edu.tw, ඉබරාකි විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරුව- ජපානය, සකුරා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන (ඔකයාමා විශ්වවිද්‍යාලය- ජපානය)

ශිෂ්‍යයන් දෙදෙනෙකු මාර්තු මාසයේදී ජපානයේ 2020ඔකයාමා විශ්වවිද්‍යාලයේ සිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘති නිමාකරන ලදී.

**ඉංජිනේරු පීඨය**

- නිශ්චාල් බට්ටාරායි මහතා විදේශ ශිෂ්‍යයන් සඳහා ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය නිමාකරන ලදී.

**විද්‍යා පීඨය**

- TROPIMUNDO දර්ශනපති උපාධි වැඩසටහන - සම්බන්ධීකාරක - ආචාර්ය සුනන්ද කොඩිකාර, උද්භිද විද්‍යා අධ්‍යනාංශය - පහත දැක්වෙන ශිෂ්‍යයන් නිවර්තන ජෛවවිවිධත්ව පාඨමාලාවේ ප්‍රායෝගික සංරචකයක් සඳහා ඇතුලත් වී එය සම්පූර්ණ කරන ලදී.

  - ග්‍රෙස් අයිරින් රිඩර්
  - ඩැන්යන් වෙන්
  - වික්ටර් මැනුවෙල් සූසා ඩි ඇවෙඩෝ
  - සැමුවෙල් අප්පියා ඔෆෝරි
  - ක්‍රිස්ටින් කැමිල් ඩී. බුවනාෆේ
  - නගෙන්ඩාභිමානා එෆ්‍රෙම්
  - ෆෙඩ්‍රික් අසන්තේ
  - ඇන් මෙරිකේ ඩි ගීස්ට්
  - කරෙන් මෙලිසා සර්නා රොඩ්රිගස්
  - ගර්සෙ වර්ගාස් රිවේරා
  - කාර්ලොස් වික්ටර් ඛුආර්ඩෝ බැටිස්ටා
  - සාවා ෆිලිප් ලෙවන්ඩොව්ස්කි

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

- ආචාර්ය බී.එම්. සුමනරත්න - නෝර්වේහි ඇඩ්ගර් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලය අතර "ගෝලීය සංවර්ධන සහ සැලසුම්කරණය" පිළිබඳ දර්ශනපති උපාධි වැඩසටහනේ සම්බන්ධීකාරක. පහත දැක්වෙන ශිෂ්‍යයන් රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණෙන ලදී.

  - හැන් ක්‍රිස්ටෙන්සන් මෙය
  - හෙලන් ඕ ඩ්‍රෙව්ලන්ඩ් කියිවේ මෙය
  - ඔස්කාර් ඩි මයර්මේල් මයා
  - බ්‍රිජිට් ඇස් මෙය
  - සුසැනා විල්සන් මෙය
  - එස්ටර් මිරියම් ටී සිවර්ට්සෙන් මෙය
  - තෝමස් සෙවෙරෙයිඩේ ආසේ මයා
  - ඉඩා ජොන්සන් ක්‍යෝල්සෝ මෙය
  - ඉඩුන් බී. නොන්ස්ටෑඩ් මෙය
  - කට්රිනා මෙලන්ඩ් - ග්‍රොව්ලෙන් මෙය

- චීන භාෂා උපදේශක බායි ෆැන් මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන චීන භාෂා සහතිකපත්‍ර පාඨමාලාවේ ස්වේච්ඡා චීන භාෂා ගුරුවරයකු ලෙස 2018 ඔක්තෝබර් මාසයේ සිට කටයුතු කරමින් සිටී.

## ➢ රුහුණ විශ්වවිද්‍යාලයට සැපැමිණි විදේශ නියෝජිතයන්

**කෘෂිකර්ම පීඨය**

- නෝර්වේහි ට්‍රොම්සෝ විශ්වවිද්‍යාලයේ ධීවර හා ජෛවවිද්‍යා පාසලේ ආචාර්ය කැත්රීන් ටිවෙයිටෙරාස්, මහාචාර්ය ජොර්ගේ සැන්ටොස්, මහාචාර්ය ස්වෙයින් ඔට්ටාර් යන මහත්ම මහත්මීන් 2020 ජනවාරි 13 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- ජපානයේ ඔකයාමා විශ්වවිද්‍යාලයේ පාරිසරික හා සජීව විද්‍යා උපාධි පාසලේ පීඨාධිපති මහාචාර්ය හිරෝකි ෆැනහාෂි මහතා 2020 ජනවාරි 13 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

- හැන් හාලන්ඩ් - අධ්‍යනාංශ ප්‍රධානී, මහාචාර්ය ආර්නේ ඔලාව් ඔයිහාස්, පර් සිගුර්ඩ් සොරෙන්සන් -පීඨ අධ්‍යක්ෂ, ඇන් හැල්වොර්සෙන්- පීඨාධිපති, සිසිල් මෝව්ඩිස්ලේ - දර්ශනශූරී/ පර්යේෂණ උපදේශක, ජාන් ඉක් ටිමෙනෙස් විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරතවන ලදී.

- නෝර්වේහි ඇඩ්ගර් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධීකාරකවරයා 2020 ජනවාරි 29 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය.

- ෆුල්බ්‍රයිට් ඉගැන්වීම් සහායක ඩොමිනික් ඩි ප්‍රිස්ට් මහතා ජනවාරි සිට මාර්තු දක්වා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය විසින් පවත්වනු ලැබූ ඉංග්‍රීසි භාෂා තීව්‍ර පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු ආරම්භ කළ අතර කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටව යාමට සිදුවිය.

**විද්‍යා පීඨය**

- ඇ.එ.ජනපදයේ ෆෝට් ස්මිත්, ආර්කන්සාස් විශ්වවිද්‍යාලයේ 2020 ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්වලාභී මහාචාර්ය රසුපති කන්නන් මහතා 2020 පෙබරවාරි 5 වැනි දින ගෞරව ආරාධිත මහාචාර්යවරයකු ලෙස සත්ව විද්‍යා අධ්‍යනාංශයට පැමිණෙන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මාසයේදී ෆුල්බ්‍රයිට් වැඩසටහන අත්හිටුවීමට සිදුවුවද අධ්‍යාපනික, ව්‍යාජ්ති සහ ප්‍රජා විනිවුම්කරණ ක්‍රියාකාරකම්වල නිරතවෙමින් ඒ මහතා දිගටම සත්ව විද්‍යා අධ්‍යනාංශයේ රැඳී සිටියේය.

වසර පුරාම ඔහු මාතර කුරුළු සංගණනයක් සිදු කළ අතර එමගින් ශ්‍රී ලංකාවේ පක්ෂි විද්‍යා තොරතුරු සඳහා දැවැන්ත දායකත්වයක් ලබා දෙන ලදී. ආර්කන්සාස් විශ්වවිදයාලයේ දර්ශනපති උපාධි සඳහා අවස්ථා ලබාගැනීමට ඔහු රුහුණ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් දිරිමත් කරන ලදී.

**<u>විශ්වවිද්‍යාල මට්ටම</u>**

- කැනඩා තානාපතිතුමන් 2020 පෙබරවාරි 11 වැනි දින විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත වූ අතර කැනඩා විශ්වවිද්‍යාලයන්හි ආදි ශිෂ්‍යයන් සමග හමුවක් පවත්වන ලදී.

- ප්‍රංශ තානාපති ඊ. ලැවැර්ටු මහතා 2020.02.14 දින කෘෂිකර්ම පීඨයේ පැවැති ISAE – 2020 සඳහා සහභාගි විය.

- ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති කාර්යාලය 2020 පෙබරවාරි 14 දින මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේදී ‘‘ඔබේ අධ්‍යාපනය සඳහා ප්‍රංශය තෝරා ගන්න’’ මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

- ඉන්දීය කොන්සල් ජෙනරාල් ශ්‍රී ප්‍රේම් නායර් මහතාට සමුදීමේ රාත්‍රී භෝජන සංග්‍රහයක් 2020 ජූලි 09 දින පවත්වන ලදී.

- ද්විපාර්ශවික සුහදතාවට අදාළ කරුණු සාකච්ඡා කිරීම පිණිස ශ්‍රී ලංකාව හා මාලදිවයින සඳහා යුරෝපීය සංගම් දූත මණ්ඩල ප්‍රධානි/ තානාපති ඩෙනිස් චායිබි මහතා සහ රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් අතර සුහද හමුවක් 2020 සැප්තැම්බර් 29 දින පැවැත්විණ.

- ශ්‍රී ලංකාව හා මාලදිවයින සඳහා ජරමන් තානාපති හොල්ගර් සියුබර්ට් මහතා ඇතුළු නියෝජිත පිරිසක් 2020 ඔක්තෝබර් මස 07 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත වූ අතර එම නියෝජිත පිරිසට ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ GIZ නේවාසික අධ්‍යක්ෂ ක්‍රිස්ටීන් එයින්ෆෙල්ඩ්ට් මිය, GIZ හි ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ක්‍රිස්ටොෆර් ෆෙයෙන් මහතා, ජර්මන් තානාපති කාර්යාලයේ උපදේශිකා ධාරිණී දළුවත්ත මිය සහ තාක්ෂණික, සංවර්ධන හා ඉගෙනුම් ආයතන පිළිබඳ උපදේශිකා මාර්ෂා ඩැනියෙල් මිය අයත් වූවාය.

- විදේශීය නියෝජිතයන් සමග මාර්ගගත සාකච්ඡා

    - රුසියානු ෆෙඩරේෂණයේ ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය එම්.ඩී.ළමාවංශ මහතා, විදේශ අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ මහතා, රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුජීව අමරසේන මහතා සහ රුසියාවේ දකුණු යුරාල් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ සහ රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිසක් සහ රුසියානු ශිෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් රුසියාන් ශිෂ්‍යයන් සඳහා සිංහල භාෂා පාඨමාලාවක් 2020 ඔක්තෝබර් 17 දින මාර්ගගතව ආරම්භ කරන ලදී.

    - අධ්‍යාපනය සහ පර්යේෂණය පිළිබඳ රුසියානු ප්‍රවාහන විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර සහයෝගිතා ගොඩනැගීම පිළිබඳ සොයා බැලීම පිණිස රුසියානු ෆෙඩරේෂණයේ ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය එම්.ඩී.ළමාවංශ මහතා, ප්‍රවාහනය පිළිබඳ රුසියානු විශ්වවිද්‍යාලයේ සහ රුහුණ, පේරාදෙණිය සහ මොරටුව විශ්වවිද්‍යාල දූත පිරිසක් සමග මාර්ගගත රැස්වීමක් 2020.02.29 දින පවත්වන ලදී.

    - තායිවානයේ ජාතික චෙන් කුං විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර ද්විපාර්ශවික අධ්‍යාපන සහ පර්යේෂණ සහයෝගිතාවය පිළිබඳ විමසා බැලීම පිණිස විශ්වවිද්‍යාල දෙකෙහි නියෝජිත පිරිසක් අතර මාර්ගගත සාකච්ඡාවක් 2020.11.20 දින සංවිධානය කරන ලදී.

➢ **ව්‍යාපෘති**

**<u>වෛද්‍ය පීඨය</u>**

- වෛද්‍ය පීඨයේ අචාර්ය එම්.ටී. නාපාගොඩ මහතාට ජාත්‍යන්ත විද්‍යා පදනමෙන් පර්යේෂණ ප්‍රදානයක් ලැබුණි.

**<u>මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය</u>**

- "අනධ්‍යන කාර්ය මණ්ඩලය පුහුණුකිරීම මගින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි පාලනය , කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ අභිවර්ධනය කිරීම"-එරාස්මස්+ KA2 CBHE ව්‍යාපෘතියේ පාර්ශවකරුවකු බවට පත්විය.

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි සිටින ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳව ඉන්ක්එඩියු+ එරාස්මද් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එහි පළමු රැස්වීම 2020 පෙබරවාරි මාසයේදී පවත්වන ලදී. ව්‍යාපෘතියේ වෙබ් අඩවිය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වෙබ් අඩවිය යටතේ දියත් කරනු ලැබූ අතර ඊ-විස්තර පත්‍රිකාවක් නිර්මාණය කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විශේෂ අවශ්‍යතා ඒකකයක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- සත් අවුරුදු (2014-2020) NORHED-CPDS ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දින අවසන් විය.

එම ව්‍යාපෘතියෙන් පහත දැක්වෙන ප්‍රතිලාභ හිමිවිය.

- NORHED-CPDS ව්‍යාපෘතියේ සහයෝගයෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලීය 06 වැනි අන්තර්ජාතික සම්මේලනය සංවිධානය කරන ලදී.
- සමාජ විද්‍යා අධ්‍යනාංශයේ පරිගණක විද්‍යාගාරයට නව පරිගණක 20 ක් ලබාදුන් අතර අධ්‍යනාංශයේ විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කරන ලදී.
- ව්‍යාපෘති ප්‍රතිඵල පාදකව ප්‍රකාශන දෙකක් සම්පූර්ණ කරන ලදී.
- සාමය හා සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රපති වැඩසටහනට බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් විසි දෙනෙකුට තම පාඨමාලා ගාස්තු 50% කින් ආවරණය කරගැනීම පිණිස ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.
- රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා නෝර්විජියානු මහාචාර්යවරුන් දෙදෙනෙකු විසින් ආරාධිත දේශකයන් කිහිප දෙනෙකු සඳහා පහසුකම් සපයන ලදී.

**<u>කළමනාකරණ පීඨය</u>**

- TESS ව්‍යාපෘතිය

  - රුහුණ විශ්වවිද්‍යාලය 'ශ්‍රී ලංකාවේ තාක්ෂණික, ආර්ථික, සමාජීය තිරසර සංවර්ධන පුහුණුව (TESS), උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ධාරිතා ගොඩනැගීම ව්‍යාපෘතියේ පාර්ශවකාර විශ්වවිද්‍යාලයක් විය- යුරෝපයේ සහ ශ්‍රී ලංකාවේ පාර්ශවකාර විශ්වවිද්‍යාල, එනම් එක්සත් රාජධානියේ සසෙක්ස් විශ්වවිද්‍යාලය, පෘතුගාලයේ නෝවෝ විශ්වවිද්‍යාලය, ඩෙන්මාර්කයේ තාක්ෂණික විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සමගින් නෝර්වේහි අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

- තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් පැවැත්වීමට අවසරය ඉල්ලා සිටීම

## ඉංජිනේරු පීඨය

- EUSL-Energy ව්‍යාපෘතිය

  - EUSL-Energy ව්‍යාපෘතිය බලශක්ති සංක්‍රමණ අංශය තුළ අභියෝග ආමන්ත්‍රණය කරමින් ඒවා අවස්ථාවන් බවට පත්කරන්නා වූ විශිෂ්ඨ අධ්‍යාපනික වැඩසටහනක් නිර්මාණය කිරීමේ සුවිශේෂී ව්‍යාපෘතියකි.

  - ප්‍රදාන ගිවිසුම් අංක EUSL-Energy - 610173-EPP-1-2019-1-LK-EPPKA2-CBHE-JP; මාතෘකාව: බලශක්ති චක්‍රීය ආර්ථිකයේ යුරෝපීය ශ්‍රී ලංකා ධාරිතා ගොඩනැගීම "EUSL-Energy" යටතේ ඉංජිනේරු පීඨය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා ඉහත ව්‍යාපෘති අරමුදල් පිරිනමා තිබේ.

- THREE ලංකා ව්‍යාපෘතිය

  - "ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණවේද සඳහා පුහුණු කේන්ද්‍රයක්" සංවර්ධනය කිරීම සඳහා ඉංජිනේරු පීඨය විසින් සකස් කරන ලද අධ්‍යාපනික ව්‍යාපෘති යෝජනාවක් "එරාස්මස්+ උසස් අධ්‍යාපනයේ ධාරිතා ගොඩනැංවීම" (යෝජනා කැඳවීම EAC/A02/2019/CBHE) තරඟකාරී ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ යුරෝපා සංගම් අරමුදල් සැපයීම සඳහා තෝරා ගන්නා ලදී. මෙම ප්‍රදාන අයදුම්පත්‍රය ගෝලීය තරඟකාරී වැඩසටහනක් වන අතර එහිදී ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත්‍ර 1005 ක් අතුරින් අරමුදල් සැපයීම සඳහා 164ක් තෝරා ගෙන ඇති අතර තවත් 20 ක් සංචිත ලැයිස්තුවකට ඇතුලත් කර තිබේ.

## සම සෞඛ්‍ය විද්‍යා පීඨය

- තායිලන්තයේ මහිදොල් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම රුහුණ විශ්වවිද්‍යාලයේ පාලන සභාව විසින් නිර්දේශ කර අනුමතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබේ. එම අවබෝධතා ගිවිසුම ආසියා සහ ශාන්තිකර කලාපයේ මාස 6 – 24 දක්වා බිළින්දන්ගේ සහ ළදරුවන්ගේ වර්ධනය සහ සිරුරු සංයුතිය අවබෝධය විමර්ශනය කිරීම පිණිස මූල්‍ය සහාය ලබා දෙනු ඇත. මෙම කලාපයට විශේෂිතව මෙම වයස් කාණ්ඩයේ ළමුන්ගේ අතිරේක ආහාර පුරුදු, වර්ධනය සහ සිරුරු සංයුතිය අතර සබඳතාවය පිළිබඳ වටිනා තොරතුරු සැපයීම මෙම ව්‍යාපෘතිය අරමුණු කරයි.

## විද්‍යා පීඨය

- SEDRIC @ SRILANKA ව්‍යාපෘතිය

  - ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයන්හි සමෝධානික කළමනාකරණය ප්‍රවර්ධනය පිණිස සමාජ-පාරිසරික විද්‍යාත්මක වෙරළබඩ වෙනස්කම්වල අන්තර් ශික්ෂණ විශ්ලේෂණය සහ අධීක්ෂණය සඳහා ධාරිතා ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව SEDRIC @ SRILANKA හි ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම පිණිස ප්‍රංශ තානාපති කාර්යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අත්සන් තැබීමට නියමිත "ප්‍රතිලාභ ගිවිසුමක්" රජයේ අනුමතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබේ.

- TROPIMUNDO ව්‍යාපෘතිය

  - නිවර්තන ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති (TROPIMUNDO) පිළිබඳ ERASMUS MUNDAS දර්ශනපති උපාධිය යුරෝපීය විශ්වවිද්‍යාල හයක් විසින් ඒකාබද්ධව පවත්වනු ලබන අතර උපාධි වැඩසටහනේ ප්‍රායෝගික අංග මත සංකේන්ද්‍රිත (එනම් ක්ෂෙත්‍ර පංති) අර්ඝ 21 ක් පිරිනැමීම පිණිස නිවර්තන රටවල් කිහිපයක් ද මෙම වැඩසටහනට සම්බන්ධ කරගෙන තිබේ.

  - දෙවන පෙළ පාර්ශවකරුවකු ලෙස ඉහත දර්ශනපති උපාධි වැඩසටහනට සහභාගි වන ලෙස විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා අධ්‍යනාංශයට ආරාධනා කරන ලදී. එම වැඩසටහනට සම්බන්ධවීමේදී, මූලිකවම උපාධි වැඩසටහනේ 2වැනි වර්ෂාර්ධයේදී "නිවර්තන ජෛවවිවිධත්වයේ" ප්‍රායෝගික අංග පිළිබඳ ECTS අර්ඝ 21ක් (SLQF අර්ඝ 11.5 ක්) ආවරණය කිරීමට උද්භිද විද්‍යා අධ්‍යනාංශයට සිදුවිය.

**<u>ධීවර සහ සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය</u>**

- ACIAR ව්‍යාපෘතිය

  - රුහුණ විශ්වවිද්‍යාලය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන් වන මෙම ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු රජය අතර අත්සන් තැබීමට නියමිතව තිබුණි. යෝජිත ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ජලාශයන්හි යෝධ මිරිදිය ඉස්සන් සහ අනෙකුත් මාළු විශේෂ පිළිබඳ මත්ස්‍ය වගා ධීවර කර්මාන්තය වෙනුවෙන් ශක්තිමත්, විද්‍යා පාදක කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දීම සහ දේශීය කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ ඵලදායිතාවය, ලාභදායිතාවය, ජීවනෝපාය සහ ආදායම සහතික කරමින් සැපයුම් දාමයේ විවිධ පැතිකඩ වැඩි දියුණු කිරීමයි.

➢ **දැනට පවතින අවබෝධතා ගිවිසුම්**

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- පර්යේෂණ සහයෝගිතාව සඳහා වයඹ දිග ඒ සහ එෆ් විශ්වවිද්‍යාලය

- ගොවීන් සඳහා යාවජීව අධ්‍යාපන ($L_3F$) ව්‍යාපෘතිය . රුහුණ විශ්වවිද්‍යාලය සහ කොමන්වෙල්ත් ඔෆ් ලර්නින් ආයතනය, වැන්කුවර්, කැනඩාව අතර අවබෝධතා ගිවිසුම

- වියට්නාමයේ සහ ශ්‍රී ලංකාවේ ධීවර සහ කෘෂිකාර්මික පාරිසරික පද්ධති තුලට දේශගුණික විපර්යාස අන්තර්ගත කිරීමේ NORHED ව්‍යාපෘතිය - වියට්නාමයේ නාත්නි විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය සහ ට්‍රොම්සෝ විශ්වවිදයාලය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම. ව්‍යාපෘතිය සඳහා NORD, නොර්වීජියානු රජය ආධාර සපයයි.
- පශ්චාත් උපාධි පාඨමාලා සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන සහ පර්යේෂණ පුහුණු ආයතනය සමග අවබෝධතා ගිවිසුම.

- කැනඩාවේ මනිටෝබා විශ්වවිද්‍යාලය සහ රුහුන විශ්වවිද්‍යාලය අතර "කරවල හා අදාළ කරුණු" අවබෝධතා ගිවිසුම උපකුලපතිතුමන් විසින් අත්සන් තබන ලදී.

- කෘෂිකර්ම පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය සහ චෙන් කුං ජාතික විශ්වවිද්‍යාලය , තායිවානය, ඉබරාකි විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

**<u>ධීවර සහ සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය</u>**

- 2009 - ප්‍රැක්ටිකල් ඇක්ෂන්, දකුණු ආසියාව සහ ධීසාවිතා පීඨය, සුළු පරිමාණ ධීවර පරයේෂණ ව්‍යාපෘතිය පිළිබඳව.
- 2011 - සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ රු.වි.- ධීසාවිතා පීඨය, ශ්‍රී ලංකාවේ දකුණුදිග වෙරළ තීරය සඳහා ජලජ වෙරළබඩ පාරිසරික දත්ත සමුදායක් ස්ථාපිත කිරීම පිළිබඳව.
- 2011 - ශ්‍රී ලංකා නාවික හමුදාව, උසස් අධ්‍යාපන සහයෝගිතාව සහ සහයෝගය පිළිබඳව.
- 2012 - දකුණු චීන සාගරවිද්‍යා මුහුදු ආයතනය, CAS, චීනය, ශිෂ්‍ය හා කාර්යමණ්ඩල හුවමාරුව පිළිබඳව, ඒකාබද්ධ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන.
- 2013 - හැන්ටෙක් සමාගම සහ රු.වි., පර්යේෂණ සහයෝගය පිළිබඳව
- 2013 - ජෙවගෝල පදනම - ඇ.එ.ජ. සහ රු.වි.,තල්මසුන් සහ සමුද්‍රීය ක්ෂීරපායින් පිළිබඳ යාත්‍රාවල සිට දත්ත එකතු කිරීම.
- 2014 - දකුණු චීන සාගරවිද්‍යා මුහුදු ආයතනය, CAS, චීනය - අධ්‍යාපන සහ පර්යේෂණ පිළිබඳ චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිළිබඳව

**<u>මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය</u>**

- ඉන්දිරා කලා සංගීත් විශ්වවිද්‍යාලය, ඛායිරාගාර්, ඉන්දියාව සහ රු.වි.අතර අවබෝධතා ගිවිසුම.
- රුහුණ විශ්වවිද්‍යාලය සහ කොල්කටා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

**<u>විද්‍යා පීඨය</u>**

- රුහුණ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාඥයන් CERN LHC Acceleration හි CMS පරීක්ෂණයට සහභාගිවීම සඳහා අභිලාෂය පලකිරීමක් 2006 දී අත්සන් තබන ලදී.

## ➢ අත්සන් තබන ලද නව අවබෝධතා ගිවිසුම්

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- ගුයිෂූ විද්‍යා ඇකඩමිය සමග– ශ්‍රී ලංකා රජයේ අනුමතිය අපේක්ෂාවෙන් පසු වේ
- රුහුණ විශ්වවිද්‍යාලය සහ බීජිං වන විද්‍යා විශ්වවිද්‍යාලය චීනය අතර අවබෝධතා ගිවිසුම
  කෘෂිකර්ම පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය සහ චීන ශාක ආරක්ෂක විද්‍යාතනය, කෘෂිකර්ම විශ්වවිද්‍යාලය , චීනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට නියමිතය
- ටෝකියෝ කෘෂිකර්ම සහ තාක්ෂණ විශ්වවිද්‍යාලය (TUAT)-ජපානය

**<u>සම සෞඛ්‍ය විද්‍යා පීඨය</u>**

- රසායනික ජෙව විද්‍යාව, ව්‍යවහාරික ජෙව විද්‍යා සහ පාරිසරික ධූලක විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන පිළිබඳව රුහුණ විශ්වවිද්‍යාලය සහ තායිලන්තයේ චූලාබොම් උපාධි ආයතනය අතර අවබෝධතා ගිවිසුම (අදාළ කටයුතු සිදුකරමින් පවතී)

- ස්නායුපරිහාරක රෝග සත්කාර පිළිබඳව ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටෙඩ් විශ්වවිද්‍යාලය සමග උසස් අධ්‍යාපන ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන

- සංලග්න සහ විකලාංග පිළිබඳ ගෞරව උපාධිය සඳහා එක්සත් රාජධානියේ "මෙත්තා පදනම" සහ එක්සත් රාජධානියේ සැල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සමග හවුල්කාරිත්වය - අනුමතිය අපේක්ෂාවෙන් සිටී.

**<u>ඉංජිනේරු පීඨය</u>**

- සිරින්දෝන් ජාත්‍යන්තර තාක්ෂණවේද ආයතනය, තම්මාසට් විශ්වවිද්‍යාලය , තායිලන්තය සහ ඉංජිනේරු පීඨය අතර කාර්යමණ්ඩල සාමාජිකයන් හුවමාරුව, ශිෂ්‍ය හුවමාරුව යෝග්‍ය අවස්ථාවලදී තොරතුරු, ලේඛන සහ ද්‍රව්‍ය හුවමාරුව, ඒකාබද්ධ ව්‍යාපෘති, සම්මන්ත්‍රණ සහ සම්මේලන ආදියේදී සම්බන්ධීකරණය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට නියමිතය.

- ජීව සහ පාරිසරික විද්‍යා පීඨය, යමනාෂි විශ්වවිද්‍යාලය , ජපානය , - .ගාස්තු නිදහස් කිරීමක් සහිතව අන්‍යෝන්න පදනමින් ශිෂ්‍යයන් හුවමාරුව, ආයතන දෙකෙන්ම පීඨ සහ කාර්යමණ්ඩල සාමාජිකයන් හුවමාරුව, අධ්‍යයන තොරතුරු හුවමාරුව සහ ඒකාබද්ධ පර්යේෂණ සහ අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය කිරීම.

- ජපාන අන්තර් ආණ්ඩු ගැලපුම් කළමනාකරණ නියෝජිතායතනය (JIMA), MME, විදුලි සහ විද්‍යුත් උපකරණ ආශ්‍රිත නිෂ්පාදන සැලසුම සහ සංවර්ධනය සහ ශ්‍රී ලංකා සංදර්භයට උචිතවන පරිදි වත්මන් තාක්ෂණය වැඩි දියුණු කිරීම පාර්ශවයන් දෙක ඒකාබද්ධව සිදු කිරීම, සහයෝගිතා පර්යේෂණ ආශ්‍රිත තාක්ෂණවේද හුවමාරු කර ගැනීමේ හැකියාව, ආශ්‍රිත වැඩසටහන් සැකසීමේදී අනොන්‍ය සහාය සහ විශේෂිත පර්යේෂණ පැවැත්වීම වැනි සංවර්ධනයේ නිශ්චිත ක්ෂෙත්‍රයන්හි පුහුණු ව්‍යාපෘති සහයෝගිතාවය

**<u>මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය</u>**

- එරස්මස්+ වැඩසටහන යටතේ නෝර්වේහි ඇඩ්ගර් විශ්වවිද්‍යාලය වැඩසටහන් විශ්වවිද්‍යාලය ලෙසද රුහුණ විශ්වවිද්‍යාලය පාර්ශවකාර විශ්වවිද්‍යාලය ලෙස ද අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි.

- මැලේසියාවේ සේන්ස් විශ්වවිද්‍යාලය සමග භූගෝල විද්‍යා අධ්‍යනාංශය අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම අළුත් කිරීම.

**<u>ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය</u>**

- 2019 - සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලය , තායිවානය සහ රු.වි.
    - තායිවාන සහ ශ්‍රී ලංකා සමුද්‍රීය පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (TSMRS) සිදුකරන ලදී.

- 2019 - නෝර්වේහි ආක්ටික් විශ්වවිද්‍යාලය
    - නෝ(ර්) ලංකා බිලූ ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍ය, කාර්යමණ්ඩල සහ පරිපාලන සවලතාව

**<u>විද්‍යා පීඨය</u>**

- නෝර්- ලංකා බිලූ කොන්සෝටියම් ගිවිසුම රුහුණ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ නාරා ආයතනය විසින්.ට්‍රොම්සෝ විශ්වවිද්‍යාලය සමග අත්සන් තබන ලදි 2019-2023

# 3. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

## ➢ ශිෂ්‍ය ලියාපදිංචිය

### ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය

උපාධි වැඩසටහන පිළිබඳ දැන්වීම 2020 මාර්තු මාසයේදී පළකරන ලද අතර තෝරා ගැනීමේ සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත.

අයදුම්කරුවන් 2248 දෙනෙකු අතුරින් 1425 දෙනෙකු තෝරා ගන්නා ලදී. නමුත් 2020.08.28 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභා ලිපිය හේතුවෙන් බඳවාගැනීම් ක්‍රියාදාමය තාවකාලිකව අත්හිටුවා ඇත.

ඊට අමතරව, පහත දැක්වෙන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි කර ඇත.

| වැඩසටහන | ලියාපදිංචිය සිදුකළ දිනය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව | 2020 අගෝස්තු 29 සහ 30 | 100 |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | 2020 දෙසැම්බර් 20 | 119 |
| ඉංග්‍රීසි ව්‍යාජ්ත පාඨමාලා* (සහතිකපත්‍ර, උසස් සහතිකපත්‍ර සහ උසස් ඩිප්ලෝමාව) | 2020 දෙසැම්බර් 15 සිට 23 දක්වා | 491 |

*ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය දිගටම සිදු වේ

## ➢ ඩිප්ලෝමා පාඨමාලා

| පාඨමාලාවේ නම | පාඨමාලා කාලසීමාව |
|---|---|
| මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි උසස් සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1 යි |
| ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අවුරුදු 1 යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | මාස 6යි |

## ➢ විභාග

| විභාගයේ නම | විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | සමත්වූ සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය කොටස I 2015, 2019 සහ 2015 (පුනරීක්ෂණ) | 1929 | ප්‍රතිඵල අපේක්ෂිතයි |
| මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමාව (2019 කාණ්ඩය)-2 වැනි වර්ෂාර්ධය | 104 | ප්‍රතිඵල අපේක්ෂිතයි |

## ➢ උපාධි ප්‍රදානෝත්සවය

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර) උපාධි වැඩසටහනේ උපාධි ප්‍රදානෝත්සවය 2021 වසර දක්වා කල් දමා තිබේ. එහිදී උපාධි වැඩසටහන සාර්ථකව නිමා කළ 207 දෙනෙකුට උපාධි පිරිනැමීමට නියමිතය.

## ➢ බාහිර උපාධි අපේක්ෂක උපාධිවැඩසටහනේ බඳවාගැනීම් – 2020

| අධ්‍යයන වැඩසටහන | **2020 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍ය බඳවාගැනීම් (ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)** | | |
|---|---|---|---|
| | **පිරිමි** | **කාන්තා** | **එකතුව** |
| ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර) කොටස II (18 වැනි කාණ්ඩය) | 102 | 891 | 993 |
| ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)* (19 වැනි කාණ්ඩය) | 180 | 1245 | 1425 |

*- අපේක්ෂකයන් 1425 දෙනෙකු නව බඳවාගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් නමුත් 2020.08.28 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභා ලිපිය හේතුවෙන් බඳවාගැනීම් ක්‍රියාදාමය තාවකාලිකව අත්හිටුවා ඇත.

## ➢ ශිෂ්‍යයන් සඳහා උපකාර

- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදී.
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) වැඩසටහන් - කොටස II -2016 විභාගය සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදී.
- පිළිතුරු පත්‍ර නැවැත සමීක්ෂණය
- දු.අ.අ.ඒකකය යටතේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් සඳහා උපකාර කිරීම පිණිස දුක්ගැනවිලි කමිටුවක් ස්ථාපිත කිරීම
- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම
- අයදුම් පත්‍ර, ආකෘති පනි සහ වෙනත් එවැනි අදාළ ලේඛන දු.අ.අ.ඒකකයේ වෙබ් අඩවියේ පළ කිරීම

# 4. අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය

සිය තත්ත්ව ආරක්ෂණ සංරචකය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් රුහුණ විශ්වවිද්‍යාලය 2020 වසරේදී ප්‍රධාන පරිපාලන වෙනස්කම් දෙකක් සිදුකරන ලදී. වි.ප්‍ර.කොා.සභාවේ විධාන ප්‍රකාරව මෙතෙක් ක්‍රියාත්මකව පැවැති අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය ප්‍රතිස්ථාපනය කරමින් අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. තවද, අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකයේ කළමනාකරණ කමිටුව ප්‍රතිස්ථාපනය කරමින් තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව ද ස්ථාපිත කරන ලදී. තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ ප්‍රධානත්වය උපකුලපතිවරාය දරන අතර ඊට වැඩි වගකීම් පවරා තිබේ.

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැගුණු දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද, රැස්වීම් නවයක් පවත්වන ලදී. 2020 වසරේදී, පීඨ දහයෙහි ක්‍රියාත්මක වන අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කුටි දහයට අමතරව, පුස්තකාල සේවා සඳහා සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් සඳහා අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කුටි දෙකක් ස්ථාපනය කරන ලදී.

2020 වසර තුළදී අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය විසින් සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර හයක් යටතේ පහත සාරාංශ ගතකර ඇත.

## ➢ ප්‍රතිපත්ති

තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය තත්ත්ව ආරක්ෂණය ආශ්‍රිත නව ප්‍රතිපත්ති ගණනාවක් හඳුන්වා දුන අතර වැදගත් ලේඛන ගණනාවක් පළ කරන ලදී.

- 09/2019 නව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කරන ලදී. සනාතන සභාවේදී සහ පාලන සභාවේදී අනුමත කරන ලදුව, සංශෝධිත අතුරු ව්‍යවස්ථා 2021.01.01 දින සිට ක්‍රියාත්මක විය.

- අ.ත.ආ. කුටි සහ තත්ත්ව ආරක්ෂණ ස්ථාවර කමිටුවේ සාමාජිකයන් විමසා, රුහුණ විශ්වවිද්‍යාලයේ 2020-2023 තත්ත්ව ආරක්ෂණ උපායමාර්ගික සැලැස්ම පිළියෙළ කරන ලදී. එම උපායමාර්ගික සැලැස්ම විශ්වවිද්‍යාලයේ පාලන සභාව විසින් අනුමත කරනු ලැබූ අතර 2021.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

- ‘‘ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සහ සමපදස්ථ ඇගයීම’’ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය සම්පාදනය කරන ලදී. පාලක සභාව විසින් අනුමත කරනු ලැබීමෙන් පසුව, එම ප්‍රතිපත්තිය 2021.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

- පාඨමාලා/ පාඨමාලා මොඩියුලය/පාඨමාලා ඒකක යන යෙදුම් භාවිතය පිළිබඳ විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය සම්පාදනය කරන ලදී.

- වසරක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව නිරීක්ෂණ සලකා බැලීමෙන් පසුව, රුහුණ විශ්වවිද්‍යාලයේ විභාග පැවැත්වීමේ පටිපාටිය පිළිබඳ අත්පොත ප්‍රතිශෝධන ක්‍රියාවලියකට ලක් කරන ලදී.

- පශ්චාත් උපාධි විභාග සඳහා අත්පොත සකස් කිරීමේ ක්‍රියාදාමය ආරම්භ කරන ලදී.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිපත්තිය ‘‘රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙද අධ්‍යනාංශයේ සායනික පත්කිරීම් කාලය තුළ ශිෂ්‍ය නොපැමිණීම, අසතුටුදායක කාර්යසාධනය සහ අයෝග්‍ය හැසිරීම’’ සම්පාදනය කරන ලදී.

- පාර්ශවකරුවන්ගේ අදහස් විමසා අධ්‍යයන වගවීම් ආකෘතිය වැඩි දියුණු කරන ලදී.

- අධ්‍යයන වගවීම් ආකෘතිය වැඩප්‍රමාණ ආකෘතියක් බවට ව්‍යාප්ත කිරීම ආරම්භ කරන ලදී.

- ශිෂ්‍ය දුක්ගැනවිලි කමිටු ස්ථාපිත කිරීම සනාතන සභාවට යෝජනා කරන ලදී. තත්ත්ව ආරක්ෂණ ස්ථාවර කමිටුවේදී උත්පාදනය වූ මූලික සංකල්පයක් මත පදනම්ව, සියලු පීඨ ශිෂ්‍ය දුක්ගැනවිලි කමිටු ස්ථාපනය කර තිබේ.

### ➢ නව වැඩසටහන්, පාඨමාලා, විෂයමාලා සංශෝධන

අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය පහත දැක්වෙන නව වැඩසටහන්/පාඨමාලා හඳුන්වාදීම සහ/හෝ ප්‍රතිශෝධනය සඳහා පහසුකම් සපයන ලදී.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා වැඩසටහන මොඩියුල පද්ධතියක් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සපයන ලදී.

- පහත දැක්වෙන උපාධි අපේක්ෂක වැඩසටහන් හඳුන්වාදීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කරන ලදී

    - ව්‍යාපාරික නීතිය ශාස්ත්‍රවේදී උපාධිය සඳහා වි.ප්‍ර.කොං.සභාවේ අනුමතිය ලැබුණි
    - ඉංජිනේරු (පරිගණක විද්‍යා) විද්‍යාවේදී උපාධිය සඳහා ත.ආ.මධ්‍යස්ථානයේ අනුමතිය
    - මානව සම්පත් කළමනාකරණ උපාධිය
    - ව්‍යාපාර පරිපාලන උපාධි වැඩසටහන් (ව්‍යවසායකත්ව ශාස්ත්‍රවේදී උපාධිය)
    - ව්‍යාපාර පරිපාලන උපාධිය (මූල්‍ය)
    - ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය (ජාත්‍යන්තර ව්‍යාපාර)
    - විද්‍යාවේදී උපාධිය (ආහාර විද්‍යා හා තාක්ෂණ): සංකල්ප පත්‍රිකාව සනාතන සභාව විසින් අනුමත කරන ලදී.

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් පිරිනමන ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන් 12 ක සංශෝධන සම්පූර්ණ කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අභ්‍යන්තර හා බාහිර ශාස්ත්‍රවේදී උපාධි සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් සංශෝධිත විෂයමාලාව හදාරයි.

- පශ්චාත් උපාධි වැඩසටහන් හතරක බාහිර සමාලෝචන සිදුකිරීම ආරම්භ කරන ලදී.

    - විශ්ලේෂණාත්මක රසායන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
    - විද්‍යාපති උපාධිය (විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව)
    - සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ත.ආ.මධ්‍යස්ථානයේ අනුමතිය සඳහා යවන ලදී)
    - අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

- කෙටි පාඨමාලා ගණනාවක් හඳුන්වාදීම පිණිස පහසුකම් සපයන ලදී.

    - මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව/ උසස් ඩිප්ලෝමාව
    - වැවිලි සහ සුළු අපනයන භෝග විද්‍යාත්මක කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලාව
    - පෞරුෂ සංවර්ධනය සඳහා අධ්‍යාත්මිකතා සහ විශ්‍රාන්ති ශිල්පීයක්‍රම
    - හරිත චර්යා සහ තිරසර පාරිභෝජන උත්තේජනය
    - නිවර්තන කලාපයන්හි නාගරික හා නගරාශ්‍රිත ප්‍රදේශ දේශගුණික වෙනස්කම්: බලපෑම්, අවම කිරීම සහ අනුවර්තනය

- කෘෂි ව්‍යවසායකත්වය සහ තිරසර ගෙවතු වගාව පිළිබඳ සහතික පත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාව
- නාගරික ගෙවතු වගා සහ භක්ෂ්‍ය භූ අලංකරණ සහතික පත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාව
- විසිතුරු මත්ස්‍ය අභිජනනය හා වගාව
- කෘෂිකාර්මික යනත්‍රෝපකරණ මෙහෙයුම් තාක්ෂණ සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාව
- ධීවර කර්මාන්තයට අදාළ චාරිත්‍ර නීතිය සහ ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ
- මත්ස්‍ය පසු අස්වනු ශිල්පීය ක්‍රම
- හින්දි සහතිකපත්‍ර පාඨමාලාව
- ජෛවතාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව
- රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණෙන විදේශීය උපාධි ශිෂ්‍යයන් සඳහා නව්‍යකරණ පාඨමාලා මොඩියුල සහිත අර්ස පැවැරුම
- වෛද්‍ය රසායනාගාර විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා ශිරා විච්ඡේදන පාඨමාලාව
- සක්‍රීය පුරවැසි පාඨමාලාවේ විෂයමාලාව නිමා කරන ලද අතර සනාතන සභාව එය අනුමත කරන ලදී. නව විෂයමාලාව උචිත පරිදි හඳුන්වාදීමට පිණිස අවශ්‍ය කටයුතු පිළියෙළ කර තිබේ.
- උපාධි අධ්‍යයන පීඨයේ සහයෝගිතාවයෙන් සියලු පශ්චාත් උපාධි ශිෂ්‍යයන් සඳහා පොදු ප්‍රේරණ/ ප්‍රාරම්භක පාඨමාලාවක් හඳුන්වාදීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශ දෙකට බෙදීම මගින් ගිණුම්කරණ අධ්‍යනාංශය සහ මූල්‍ය අධ්‍යනාංශය ලෙස නව අධ්‍යනාංශ දෙකක් ස්ථාපිත කිරීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කරන ලදී.

- කෘෂිකර්ම පීඨයේ අධ්‍යනාංශ දෙකක් නැවැත නම් කිරීමේ ක්‍රියාවලිය ආරමභ කරන ලදී.

## ➢ අභ්‍යන්තර සමාලෝචනය

- උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිතා සමීක්ෂණය පවත්වන ලදී.

## ➢ බාහිර සමාලෝචන

- ඉංජිනේරු පීඨය විසින් පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන්වල ප්‍රතීතනය සඳහා පහසුකම් සැපයීම

- ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

- කෘෂිකර්ම පීඨය විසින් පිරනමනු ලැබූ උපාධි වැඩසටහන් තුනක් සහ වෛද්‍ය පීඨය විසින් පිරිනමනු ලබන වෛද උපාධි වැඩසටහන, වැඩසටහන් සමාලෝචනයට ලක් කරන ලදී. ඇගයීමේ ප්‍රතිඵල පහත දැක්වෙන පරිදි වේ.

  - වෛද්‍ය උපාධි වැඩසටහන C
  - විද්‍යාවේදී උපාධිය (කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණවේදය B
  - විද්‍යාවේදී උපාධිය (හරිත තාක්ෂණය) A
  - විද්‍යාවේදී උපාධිය (හරිත තාක්ෂණය) A

- පීඨ දෙකක් ආශ්‍රිත වැඩසටහන් සමාලෝචන නිර්දේශවලට ප්‍රතිචාර ලෙස ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කොට වි.ප්‍ර.කොා.සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

- වෛද්‍ය පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කොට සනාතන සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- කෘෂිකර්ම පීඨය සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස්කිරීම ආරම්භ කරන ලදී.

- විද්‍යා පීඨය, ඉංජිනේරු පීඨය සහ ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨය යන පීඨ තුනෙහි ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීමට පහසුකම් සපයන ලදී. ඉහත පීඨ මගින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් ආශ්‍රිත ස්වයං ඇගයීම් වාර්තා තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන ලදී.

- අභ්‍යන්තර සමාලෝචන මඩුල්ලක් විසින් ඇගයීමට නියමිත ස්වයං ඇගයීම් වාර්තා කෙටුම්පත් සම්පූර්ණ කිරීම දක්වා මෙහෙයවනු ලබන සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන වැඩසටහන් සමාලෝචනය සඳහා කටයුතු පිළියෙළ කිරීම සිදුකරන ලදී.

## ➢ වැඩමුළු සහ පුහුණු

කොවිඩ්-19 වසංගය හේතුවෙන් පැන නැගුණු දුෂ්කරතා මධ්‍යයේ වුවද, තත්ත්ව ආරක්ෂණයට සම්බන්ධ පහත පුහුණු සැසි සංවිධානය කිරීම හෝ පහසුකම් සැපයීම තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය සාර්ථකව සිදුකරන ලදී.

| වැඩමුළුවේ/ පුහුණුවේ නම | දිනය | ඉලක්ක ප්‍රේක්ෂක පිරිස සහ සම්පත් දායකයන් | සහභාගි වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය ආශ්‍රිත ගැටලු, වැඩසටහන් සමාලෝචන නිර්දේශයන්ට ප්‍රතිචාර ලෙස බාහිර සමාලෝචන, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | 05.02.2020 | අධ්‍යක්ෂ, තත්ත්ව පාලන සභාව, පීඨාධිපතිවරු, අ.ත.ආ.කුටිවල සභාපතිවරු සහ වැඩසටහන් සමාලෝචනයන්ට සම්බන්ධ ආචාර්යවරු | 93 |
| තත්ත්ව ආරක්ෂණයේ ශිෂ්‍ය සහභාගිත්වය | 13.02.2020 | බටහිර ස්කොට්ලන්ත විශ්වවිද්‍යාලයේ සහ බ්‍රිතාන්‍ය මණ්ඩලය් විශේෂඥයන්, අ.ත.ආ.කුටිවල සභාපතිවරු, තෝරාගත් ශිෂ්‍යයන් | 16 |
| විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් පද්ධති | 05.05.2020 | ආචාර්ය සුජාතා ගමගේ මිය, කණ්ඩායම් නායක, මානව ප්‍රාග්ධන වැඩසටහන, LIRNE ඒෂියා, ත.ආ.ස්. කමිටුවේ සාමාජිකයන් | 30 |
| ආයතනික සමාලෝචනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 14.05.2020 | අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ත.ආ.ම | පරිපාලන නිලධාරීන් 30 |
| RecoAsia ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | ජූනි මස සිට ඉදිරියට | තත්ත්ව ආරක්ෂණය හා සම්බන්ධ ආචාර්යවරුන් 11 දෙනෙකු | 12 |
| උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය, පිළිගැනීම සහ අර්ඝ පැවැරුම | | 2020 තුළ මොඩියුල තුනක් සම්පූර්ණ කරන ලදී. | |
| ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය | 01.07.2020 | ආචාර්යවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය | 100 |
| වැඩසටහන් සමාලෝචනය පිළිබඳ වැඩමුළුව | 21.07.2020 | අ.ත.ආ.ඒකක සාමාජිකයන් සහ වැඩසටහන් සමාලෝචන සකස් කිරීම පිළිබඳ හර කණ්ඩායම්, වෛද්‍ය පීඨය | 26 |
| වැඩසටහන් සමාලෝචනය සඳහා සැකසුම් වැඩමුළු මාලාව | 2020 ඔක්තෝබර් 05,06,09,13 ,16,19 සහ 20 | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්,වෛද්‍ය පීඨයේ අ.ත.ආ.ඒකකය විසින් සංවිධානය කරන ලදී. | 108 |

## ➢ අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම්

- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සකස් කර විශ්වවිද්‍යාලයේ වෙබ්අඩවියට සම්බන්ධ කරන ලදී.

- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සම්බන්ධීකරණය කරන ලදී.

# 5. නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය

## ➢ සේවා (2020 වර්ෂ තුළදී)

- දෙමළ භාෂා පාඨමාලාව යළි ආරම්භ කරන ලද අතර ඒ සඳහා ශිෂ්‍යයන් 1238 දෙනෙකු බඳවා ගන්නා ලදී. සරෝජනී පෝල්රාජ් මිය, වී. ක්‍රිෂ්ණමූර්ති මයා, සී. කිරිදිගොඩ මිය, දනේෂ් විජයන්ත මයා සහ එස්. ඇලෙක්සැන්ඩර් මිය බාහිර කථිකාචාර්යවරුන් ලෙස පත් කරන ලදී. පාඨමාලාව අවසානයේදී, ශිෂ්‍යයන් මූඩ්ල් ඉගෙනුම් වේදිකාව හරහා පාඨමාලාවට සහභාගි වූ අතර කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රව්‍ය පටිගතකිරීම් හරහා දේශන පවත්වන ලදී.

- හින්දි අධ්‍යයන සහතිකපත්‍ර පාඨමාලාව යළි ආරම්භ කරන ලදී. එහි සමාරම්භක උත්සවය 2020 පෙබරවාරි 17 වන දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පවත්වන ලදී. ඒ සඳහා පහත දැක්වෙන පිරිස සහභාගි විය.

| | |
|---|---|
| උපකුලපති | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මයා<br>රුහුණ විශ්වවිද්‍යාලය |
| වැඩබලන පීඨාධිපති | ආචාර්ය සමන් උදයකාන්ත මයා<br>මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| ප්‍රධාන අමුත්තා | ප්‍රේම් කේ නායර් මයා<br>කොන්සල් ජෙනරාල් කාර්යාලය, හම්බන්තොට |
| ආරාධිත කථික | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් හේවාවිතානගමගේ මයා<br>හින්දි අධ්‍යයන අධ්‍යනාංශය<br>කැළණිය විශ්වවිද්‍යාලය |
| හින්දි භාෂා බාහිර කථිකාචාර්ය | ආචාර්ය මොනිකා ෂර්මා මිය<br>ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ |
| හින්දි භාෂා බාහිර කථිකාචාර්ය | ඉන්ද්‍රා කුමාරි දිසානායක මෙය |
| සම්බන්ධීකාරක -නූ.භා.ශි.ම | ආර්. මලවිපතිරණ මිය |
| සම්බන්ධීකාරක- හින්දි භාෂාව | කේ.වී. ජී. කෝෂලී මිය |

- ශිෂ්‍යයන් 192 නෙකු බඳවා ගන්නා ලදී. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ ආචාර්ය මොනිකා ෂර්මා මිය සහ හම්බන්තොට කොන්සල් ජෙනරාල් කාර්යාලයේ ඉන්ද්‍රා දසනායක මිය පාඨමාලාව සඳහා බාහිර කථිකාචාර්යවරුන් ලෙස පත්කරන ලදී. උපදේශකයන් සඳහා ගෙවීම් සඳහා හම්බන්තොට ඉන්දීය කොන්සල් ජනරාල් කාර්යාලය අනුග්‍රාහකත්වය දරයි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මැයි 30 වනදා සිට ශිෂ්‍යයන් දේශන සඳහා සහභාගි වනුයේ සුම් තාක්ෂණය ඔස්සේය.

- කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉහත පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේදී ගැටලු මතුව තිබේ. එබැවින්, අවසාන ඇගයීම් සඳහා මධ්‍යස්ථානය මාර්ගගත විභාගයක් යෝජනා කරන ලදී.

- හින්දි භාෂා සහතිකපත්‍ර පාඨමාලාවේ නව විෂය නිර්දේශය සමාලෝචකයන් වෙත යොමුකර තිබේ.

- උපකුලපතිතුමන්ගේ මග පෙන්වීම සහිතව තෝරාගත් උපාධි අපේක්ෂකයන් 53 දෙනෙකු සඳහා (මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයෙන් පමණි) 2020 මැයි 27 වනදා සිට මාර්ගගත ප්‍රංශ භාෂා පංතියක් ආරම්භ කරන ලදී.

- උපකුලපතිතුමන්ගේ මග පෙන්වීම යටතේ කොවිඩ්-19 වසංගතය අතරතුර 2020 මැයි 28 වනදා සිට අගෝස්තු මාසය දක්වා උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් (දහසකට ආසන්න) මාර්ගගත ජපන් භාෂා පාඨමාලාවක් පවත්වන ලදී.

- 2020 ජූනි 10 වැනි දින උපාධි අපේක්ෂකයන් සඳහා (300 ක් පමණ) මාර්ගගත චීන භාෂා පංතියක් ආරම්භ කරන ලදී ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානයට චීන භාෂා උපදේශකයකු වන අනුයුක්ත බාඕ ෆැන් මහතා එම පංතිය පවත්වයි.

- 2021 වසරේදී උපාධි අපේක්ෂකයන් සඳහා ජර්මන් භාෂා සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීමට මධ්‍යස්ථානය සැලසුම් කර ඇති අතර විෂයමාලාව සකස් කිරීම පිණිස කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නීලක්ෂි ප්‍රේමවර්ධන මහත්මිය පත්කර ඇත.

- 2021 වසරේදී උපාධි අපේක්ෂකයන් සඳහා කොරියානු භාෂා සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීමට මධ්‍යස්ථානය සැලසුම් කර ඇති අතර විෂයමාලාව සකස් කිරීම පිණිස කැළණිය විශ්වවිද්‍යාලයේ අමිලජිත් නිශන්ක ලීලාරත්න මහතා පත්කර ඇත.

- මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානයේ හින්දි භාෂාව හදාරන උපාධි අපේක්ෂකයන් සඳහා 'කථන්දර පැවැසීමේ තරඟය සහ කවි ගායනා තරඟය-2020' සාර්ථකව පවත්වනු ලැබීය. මධ්‍යස්ථානය එය පවත්වනු ලැබුයේ කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු මණ්ඩලයේ සහයෝගිතා වැඩසටහනක් ලෙසිනි.

- නූතන භාෂා හා ශිෂ්ඨාචාර මධ්‍යස්ථානයේ හින්දි භාෂා ශිෂ්‍යයන්ගේ වැඩි දියුණුව පිළිබඳ ඇගයීමක් සහිතව පවත්වනු ලැබූ තරඟවල ප්‍රතිඵල සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු මණ්ඩලය වෙනුවෙන් මධ්‍යස්ථානයේ බාහිර හින්දි කථිකාචාර්ය ආචාර්ය මොනිකා ෂර්මා මහත්මිය දැනුම් දෙන ලදී. මෙම තරඟයේ විනිසුරුවන් ලෙස කටයුතු කරන ලද්දේ සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු මණ්ඩලයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවන්ත් වික්‍රම් සිං මහතා සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආචාර්ය මොනිකා ෂර්මා මිය සහ භාෂා මධ්‍යස්ථානයේ බාහිර කථිකාචාර්ය ඉන්ද්‍රා දසනායක මහත්මියයි. ඔවුන් ලබා දුන් ප්‍රතිඵල පහත දැක්වේ.

- එක් එක් තරඟයේ ජයග්‍රාහකයන් මෙසේය.

  කතන්දර පැවැසීමේ තරඟය

  | | | |
  |---|---|---|
  | - පළමු ස්ථානය | රු. 20,000 | - ඒ.ඩබ්.පී. නිල්මි දිනූපමා තත්සරණි |
  | - දෙවන ස්ථානය | රු. 15,000 | - නාගහගේ ඉෂාරා කල්හාරි |
  | - තෙවන ස්ථානය | රු. 11,000 | - වාඩිය රාළලාගේ සචිනි නිමේෂා මධුමාලි |
  | - සිව්වැනි ස්ථානය | රු. 4,000 | - හංසනී ශෂිකලා සේනාරත්න |

  කවි ගායනා තරඟය

  | | | |
  |---|---|---|
  | - පළමු ස්ථානය | රු. 20,000 | - ජේ. ඒ. මහේෂ් රෝහණ ජයවර්ධන |
  | - දෙවන ස්ථානය | රු. 15,000 | - බස්නායක මුදියන්සේලාගේ ඉඳුනිල් කාංචනමාලා |
  | - තෙවන ස්ථානය | රු. 11,000 | - ඩී.එම්. මලීෂා හංසනි දසනායක |
  | - සිව්වැනි ස්ථානය | රු. 4,000 | - ටී.එම්.ටී.ජී.එම්.සී. තෙන්නකෝන් |

- ජයග්‍රාහකයන් සඳහා සහතික සහ මුදල් ත්‍යාග මධ්‍යස්ථානයට ලැබී ඇත.

